යක්ෂයාගේ දිනපොත

යක්ෂයාගේ දිනපොත

සත්‍ය කතාවක් ඇසුරෙන්

එල්. දේශාන් දිසානායක

කර්තෘ ප්‍රකාශන

යක්ෂයාගේ දිනපොත

එල්. දේශාන් දිසානායක

ISBN 978-624-99460-0-2

පළමු වන මුද්‍රණය : 2023

පිටු සැකසුම:

එල්. හර්ෂණී ශෂිකලා

පිටකවර නිර්මාණය:

රෙණුල වාදසිංහ

එල්. දේශාන් දිසානායක

ඇතුළත සිතුවම් නිර්මාණය:

එල්. දේශාන් දිසානායක

ප්‍රකාශනය:

කර්තෘ ප්‍රකාශන

174 / බී ,

පමුණුවිල ,

ගෝණුවල

(බ.ප)

...පිදුම ....

ඇදිසි මානයෙන් ඔබ්බට

ප්‍රිය කරන

සහෘද ඔබ වෙනුවෙන් ....

පෙරවදන...

ශ්‍රී ලංකාවේ
දෙදහස් හත වර්ෂයේ
ආරම්භ වූ භූතලයේ
සැරිසරන අශුද්ධ ආත්ම සමග
සෘජු ව සම්බන්ධ වන
ක්‍රියාදාමයක් පිළිබඳ ව
ලිය වී ඇති මෙය
සත්‍ය කතාවකි.

අනුවර්තීය නාමයකින් කතාවේ අවසානයට හදුන්වා දී ඇති පුද්ගලයා ද 2011 අප්‍රේල් මස 11 වන දා අවසන් සුසුම් හෙලන අතර මාගේ අරමුණ මෙවැනි භයානක ක්‍රියාකාරකම් ආදීන ව ඔබට වටහා දීම ය.

පටුන

01. අශුද්ධ යෙහෙළිය..................... 10-38

02. යක්ෂයාගේ ක්‍රීඩාව..................... 39-73

03. නොසිතූ වියෝව 74-91

04. රතු දිනපොත 92-116

01. අශුද්ධ යෙහෙළිය

කාලයේ වැලිතලාවෙන් වැසීගිය කඳුළුවලින් ලිය වී රුධිරයෙන් අවසානය සනිටුහන් ව තිබූ අන්ධකාරයේ එම අවාසනාවන්ත දිනය දෙදහස් හතේ අප්‍රේල් මස දහඅට වැනිදා විය.

එය ඔහුට ඉතාමත් අසීරු වැඩ කටයුතු සහිත මාසයකි.

අතපසු වූ වැඩ කටයුතු ගොඩ ගැසී තිබුණි. එතරම් සමාජ ආශ්‍රයක් නොවූ ඔහු නගරයේ වූ සුප්‍රසිද්ධ පාසලක ඉගෙනුම ලබන්නෙකි. තභ පැහැයට හැරුණු හිසකෙස්, සුදුමැලි වූ මුහුණ හා කෙසඟ සිරුරකට හිමිකම් කියනා දුශාන් නම් වූ ඔහු ඉගෙනුම් වැඩ කටයුතුවලට එතරම් උනන්දුවක් නොදැක්වූවෙකි.

සාමාන්‍ය පෙළ විභාගයට දින ළං වෙමින් තිබුණි. එහි අවදානම තව තවත් දැනෙන්නට වුව ද දුශාන්ට කළ හැකි කිසිවක් නොවූ තරම්ය. සියලු වැඩ ආරම්භ කරනුයේ කොතැනින් දැයි ඔහු සිතමින් සිටියේය.

වලාාල මුහුදට ආසන්නයේ වූ කොන්ක්‍රීට් වනාන්තරයකට උදා හිරු පායන්නට වූයේ එම නගරයට තවත් එක් භීෂණාත්මක උදයක ආරම්භයක් සනිටුහන් කරමින් ය. දිග කළු ලැල්ලක් බිත්තිය පුරා වූ එය තරමක් විශාල පන්ති කාමරයකි. විටෙක සිය අවුල් වූ කෙස් රොද දෙස යමෙකු උවමනාවෙන් බලන්නට විය.

"සාමාන්‍ය පෙළ විභාගය කියන්නේ ඔයාලගේ ජීවිතයේ වැදගත් ම සහ පළමුවැනි සන්ධිස්ථානය..... ඒක ජයගත්තොත් ඔයාලට හම්බෙන්නෙ උසස් පෙළ ඉගෙන ගන්න එක ම විතරක් නෙමෙයි. සමාජයෙන් ලොකු පිළිගැනීමක් හම්බෙනවා.... ඒත්.... ළමයි ඔයාලා විභාගය අසමත් වුණොත් දන්නවාද ඔයාලට මොකක් ද වෙන්නේ කියලා........ දන්නව ද?...... " සිංහල විෂය කාලච්ඡේදයේ දී ගුරුතුමා ඉතා බැරෑරුම් ලෙස ඇසූ ප්‍රශ්නයකි.

එහෙත් එයට නිශ්ශබ්දතාවය හැරෙන්නට පංතිය තුළ කිසිඳු හාවක් හූවක් නොවීය.

"ළමයි ඔයාලා දන්නවද අවලංගු කාසියක් කියන්නේ මොකක්ද කියලා...... කාටහරි කියන්න පුළුවන්ද? "

කල් යල් බලා ඇසූ එම ප්‍රශ්නයට ද පන්තියේ සිටි සිසුන් මුහුණට මුහුණ බලා සිටියා මිස කිසිඳු පිළිතුරක් නම් නොවීය.

ඇස් මත රඳවා තිබූ උපැස් යුවළ වමතේ ඇඟිලි තුඩු මත ඔහු රඳවා ගත්තේය.

දුශාන් ඉදිරිපිටට විත් ඔහු සිටගත්තේ දකුණත සාක්කුවට දමමින් ය.

සාක්කුවෙන් පිටතට ගත් සුදු පැහැති ලේන්සුව සමඟ ගුරුතුමා පිට පැත්තෙන් සෙමෙන් උපැස් යුවලේ කාචය පිරිසිඳු කරන්නට විය.

"හරි මම කියන්නම්......! අවලංගු කාසියක් කියන්නේ ඒ කාසියෙන් කිසිම ගනුදෙනුවක් කරන්න බැරි..... කිසිම කෙනෙකුට ඒකෙන් ප්‍රයෝජනයක් නැති... දෙයක්...... ඔයාලා සාමාන්‍ය පෙළ විභාගය අසමත් වුණොත් ඔයාලත් අවලංගු

කාසියක් වගේ වෙනවා..... සම්පූර්ණයෙන් ම" ගුරුතුමාගේ කතාව අද නොනවතින ගානය.

එහෙත් දුශාන්ට අන්තිමට ම ඇසුණු එක් දෙයකි. ඒ ඔයාලත් සම්පූර්ණයෙන් ම අවලංගු කාසියක් වෙනවා පමණකි.

"අවලංගු කාසියක් වගේ වෙනවා..... අවලංගු කාසියක් වෙනවා.... " එය දුශාන්ගේ මනසට තදින් කාවැදුණි.

සැම විට ම එම වදන් පෙළ කන්වල දෝංකාර දෙන්නට විය.

දැන් විභාගය අසමත් වේ යැයි දුශාන් තුළ වූයේ අප්‍රමාණ බියකි. කළ යුත්තේ කුමක්දැයි ඔහුට නොහැඟුණි. ඔහු සිය නළල ඇඟිලි තුඩුවලින් පිරිමදින්නට විය. ඇස් මඳක් අඩවන් කරගත්තේ ආතතියෙන් තොරවීමට සිතාය. එහෙත් ඉගෙනීමට දුවර්ලයෙකු වූ ඔහුට කිසිවෙකු උදව් නොකරන බව දුශාන් ප්‍රත්‍යක්ෂ ව ම දැන සිටියේ ය.

"මේ ළමයා මොන ලෝකේ සිහියෙන් ඉන්නව ද මන් දන්නෑ" ඇය පුදුමයෙන් මෙන් දුශාන් දෙස බලා සිටියාය.

සිංහල ගුරුතුමා පන්තියෙන් පිට ව ගොස් තිබුණි. විද්‍යාව විෂය උගන්වන ගුරුතුමිය පන්තියට පැමිණිය ද අවබෝධයක් නොවූ දුශාන් තිගැස්සී නැගිට්ටේ අනෙකුත් සිසුන්ගේ ආයුබෝවන් කීමේ හඬත් සමග ය.

ජලය තුළ සිටිනා යමෙකු මිමිණීය. ගුරුවරිය පවසනා සියල්ල ඒ අයුරින් ඉතාමත් විකෘති ලෙස ඇසෙන්නට විය. දුශාන් යමක සිරවී ඇති බව ඔහුට සිතිණි. අවටින් ඇසෙන සියලු ශබ්දයන් පවා ඔහුගේ සවනට ඉතාමත් ඝෝෂාකාරී විය.

"අවලංගු කාසියක්. "

එක් එක් විෂය කාලච්ඡේදය අවසාන වූයේය. එහෙත් දූශාන්ට ඇසෙන්නේ එය පමණකි.

පාසල අවසාන වන තෙක් ම සිංහල ගුරුතුමා තොල් පට රවුම් කරමින්, ඇහිබැමි ද සිය නළලට කරගනිමින් ඉතාමත් බැරෑරුම් සේ පැවසූ එම වදන් පෙළ චිත්‍රපට ජවනිකාවක් මෙන් මතකයේ රැඳෙන්නට විය.

දූශාන්ගේ මනස කිසිසේත් ම සන්සුන් නොවීය.

බොහෝ ළමුන් ද දූශාන් පසුකර දිව යන්නට විය. පෙරලා දිව යන ළමුන් අතරේ තාර අතුරා තිබූ ඇතුල් පාරේ ඔහු වැදී විසිවෙමින් ඉබි ගමනේ යෙදුණේ ඒ කිසිවක් නොතකා ය.

බසය එන තෙක් පාසල අවසානයේදී ගේට්ටුව ඉදිරියේ වූ දූශාන් සමඟ බස් රථයට ගොඩවීමට ඔහුගේ යාළුවන් ද මග බලාසිටියේ නොඉවසිල්ලෙනි. ගතට වැඩියෙන් හිතට වේදනාවක් වූයේය. වෙනදා දිවුල් සම්බෝල සහ අච්චාරු මිල දී ගැනීමට ප්‍රථමයෙන් ම දිව යන්නේ දූශාන්ය. ඒහෙත් ඔහුට අද එහි ප්‍රියතාවයක් නොවීය.

කොටින් ම පාසැල් බසය පැමිණි පසු ව සිය අඩිය පොළවේ අතුල්ලමින් දූශාන් එයට ඇතුලු වූයේ ඇවිදින මළමිනියක් මෙන් ය.

දූශාන් රථයේ වම් පැත්තේ දොරෙන් නැගගත්තේ ය. ඔහු සිය දකුණු පැත්තෙහි පිටුපස ම ආසනයේ හිඳ ගන්නට විය.

එහි අනෙක් පැත්තට වන්නට කටකාර ගැහැණු ළමුන් කිහිප දෙනෙකු කතාබහක නිරත ව සිටින්නට විය.

ඔහුගේ සවණට එය බාධාවකි.

බොල්ලෑ වූ දත් අතර පරතරය ළංවීමට කම්බි දමා සිටි ශිෂ්‍යයාවකි.

ඇය ඇගේ යහළුවන් හා තකා කරමින් සිටියේ සුප්‍රසිද්ධ පොප් සංගීත කණ්ඩායමක් පිළිබඳව ය.

කම්බි අතර සිර වූ කෑම කැබලි ද, ඇයගේ යහළුවෙකු පිටකල කිවිසුමෙන් විසි වූ බේටය ද, ඔවුන්ගේ නක්කරච්චලය ද, දරාගත නොහැකි තැන දුශාන් බසයේ ඉදිරිපස ආසනයක් වෙතට ගමන් කිරීමට තීරණය කළේය.

අද බස් රථයේ සෑම ආසනයක් ම පාහේ සිසුහුය. එහෙත් එක ම ආසනයක් හිස් බව ඔහුගේ නෙත ගැටුණේ අහම්බෙනි. දුශාන් එහි අහළ පහළ වෙත අවධානය යොමු කළේය.

එම අසුන වෙත ගොස් හිඳ ගැනීමට ආසන අතරින් ඔහු ගමන් කලේ සීරුමාරුවටය.

"දෙවියනේ...නපුරු අක්කා..." දුශාන් පැවසුයේ තරමක් බිඳුනු හඬකිනි.

ආයාසයකින් නොව ඔහුට එය කියැවුණේ ඉබේටම ය.

කිරි සුදුවන් වූ පෘෂ්ඨීමත් මුහුණකි. නළල පුරා පැතිරී තිබූ පළල් වූ දිග නපුරු පාට ඇහිබැම් දෙකකි. උරහිසේ එක් පැත්තකින් පහළට වන තෙක් වූ මුදාහල ඝන ව වැඩුණු කොණ්ඩය අකීකරුය. වැලමිටෙන් ඉහළට නවා තිබූ අත් දිග ගවුම ද ඇයගේ භයානක කම දෙගුණ තෙගුණ කරන්නට විය

දුශාන්ගේ වාසනාවකට මෙන් ඈ දැන් පසුවන්නේ දැඩි නින්දකය.

හුදකලාව සිටීමේ නිහඬ ප්‍රතිපත්තියක් ඈ සැමවිට ම අනුගමනය කරන්නට විය. එම හේතුව නිසා ම කිසිවෙක් ගුප්ත ඇය ව ප්‍රිය නොකලහ.

ඈ කෙරෙහි වූ බිය නිසා ම දකුණු පැත්තේ රියදුරු අසුන පිටුපස ඈ වටා සිටින සිසුන් ද එකිනෙකා අතර කතාබහ නොකෙරූ තරම් ය.

මෙසේ මිනිත්තු කිහිපයක් ගතවන්නට ඇත. මේ වන විට සියලු සිසුන්ගේ අවධානය එන්ජිම කෙරෙහි යොමුවන්නට වූයේ එහි ශබ්දයට සාපේක්ෂ ව එය ඉදිරියට ධාවනය ආරම්භ වූ විට ම ඇති වූ ගැස්සීමත් නිසා ය.

දෑස් විවර වී යටි සිත තුළ වූයේ කුහුලකි. කල් යල් බැලූ ඔහු ඇය අසළ අසුනෙහි හිඳ ගෙන පිටුපසට බර දුන්නේය.

බෝනික්කෙක් වන් වූ ඇයගේ දිගු ඇස් පිහාටු විවර වේ යැයි බලා සිටි දුශාන් සූදානමින් සිටියේ යම්හෙයකින් ඇයගේ ඇස් විවර වුව ද ඇයගේ රාක්ෂ බැල්මට හසු නොවන ලෙස ඇස් පියා ගැනීමටය.

මුහුණට සාපේක්ෂ ව මඳක් අවපැහැ ගැන්වුණ දෑස් දෙස දුශාන් නෙත් යොමා සිටියේ සීරුවට ය. ඇගේ දෙතොල් රෝස පෙති වැනිය. මින්පෙර අසා ඇති කට කතා දුශාන්ගේ ඇස් පියන් ගැසීම පවා පමා කෙරුයේ ඔහුට ද නොදැනීම ය. ඔහු තවමත් සිටින්නේ ඈ දෙස බලාගෙන ය.

ඇගේ වම් පැත්තේ අසුනේ සිටි දුශාන් සෙමෙන් හුස්ම ඉහළ පහළ හෙලුවේය. බස් රථය නිවස කරා යන තෙක් සිය වෙහෙසකර දෑස් වරක් ඈ දෙස ද, ඇය සිටි දිශාවේ කවුළුවෙන් එපිට ද මාරුවෙන් මාරුවට බලා සිටින්නට විය.

සූර්යාලෝකය වීදුරු කවුළුවෙන් ඉහළට වන්නට වරින් වර ඔහුගේ මුහුණේ වැදුණේය. විටෙක වැඩි එළියකින් ද විටෙක අඩු එළියක් ද නිකුත් කරමින් එය පතිත විය. දැන් දැන් දකුණු පස කවුළුවෙන් ඇසුණු වාහන ශබ්දය ද හිරු එළිය ද ඔහුට ආගන්තුක නොවුණු ගානය.

ගැලවූ බෑගය දූශාන් ඔඩොක්කුවේ හොවාගත්තේ තවත් පිටුපසට වී හිඳ ගැනීමට ය. අසුනට බර දුන් දූශාන් සිය හිස පිටුපසට තබාගත්තේ සැප පහසු ගානටය. එහෙත් තවමත් ඔහු සිටියේ ඇය කෙරෙහි පූර්ණ අවධානයෙනි.

වාහන තදබදයකට බස් රථය හසු වී තිබුණි. මඳ දුරක් යන තෙක් පාරේ දෙපස ඝන ව වැඩී තිබූ ගස්ය. වැටෙනා හිරු එළිය ගස්වලින් ආවර්ණය වන්නට විය. බස් රථය තුළ පැතිර ගියේ මඳ අඳුරකි. විටෙක එය ඉතා මූසල අඳුරකි. වම් පස වීදුරු කවුළුව වැසෙන්නට විය. ඔහු ඒ දෙස බැලීය. අන්ධකාරය කළුපැහැති මීදුමක් මෙන් ඔහු වසාගන්නට විය. අසල වූ දකුණු පස කවුළුවත් වැසී යන්නට වුයේ එවිට ම වාගේ ය. පැතිර ගිය දූමාරය ඝන අඳුරක් බවට පරිවර්තනය වෙමින් තිබුණි.

දූශාන්ට කුමක් හෝ අමුත්තක් දැනුණි. තමා දෙස කවුරුන් හෝ බලා සිටිනවා සේ ඔහුට නිතර දැනුණි. ඔහුගේ ඇඟෙහි හිරිගඬු පිපෙන්නට විය. යමෙකු දූශාන්ගේ දකුණු පස සිට තම උරහිසට හුස්ම වදිනා අයුරින් සිටියේය. විටෙක එය ගැඹුරු හුස්මකි. දැන් ඔහුට එය වඩාත් හොඳින් දැනේ.

වරින් වර දකුණු පස කවුළුවෙන් වැටුණු එළියට එය පෙනෙන්නට විය. එකවර ඔහුට පෙනුණේ ඇගේ විවර වූ ඇස් ය. තව තවත් විශාල වූ එම බොරපැහැ ඉංගිරියාව ය. නපුරු අක්කා වම්පස සිටියේ දූශාන් දෙස හිටි ඉරියවෙන් ම බලාගෙන ය.

දැන් බැලූ බැලූ හැම තැන ම නැවත අන්ධකාරයත් නිශ්ශබ්දතාවයත් පමණකි. ඉහළට ගත් හුස්ම සමග යම් පිළිස්සෙන ගඳක් ඔහුට දැනුණි. ක්‍රමයෙන් වර්ධනය වූ එම දරාගත නොහැකි පුළුටු ගඳ නහස් කුහර කඩාගෙන එන්නාක් මෙන් ඔහුට දැනෙන්නට විය. දුශාන්ට ඔක්කාරෙට ආවේය.

අපැහැදිලි හෙවණැල්ලක් බසයේ වම් පස ඉදිරියේ සිට පිටුපසට යන්නට වූයේ එකවර ය. දුශාන් ඒ දෙස හැරී බැලුවත් එහි කිසිවකු නොවීය.

එම සෙවණැල්ල දැන් දුශාන්ගේ වම් පැත්තෙන්ය. එය ක්‍රමයෙන් දුශාන් සිටි දිශාවට ළං වන්නට විය. එහෙත් ඔහුට එය නොපෙනුණි.

දුශාන් හුස්මක් ඉහළට ගන්නට විය.

සැනසුම් සුසුමක් හෙලන දුශානගේ ගෙල සිර වෙන්නට වූයේ එකවරය. තව තවත් දුශාන් එම ග්‍රහණයට නතුවෙමින් තිබුණි. දැන් දුශාන්ට පෙරටත් වඩා හොඳින් එය පෙනෙන්නට විය. කළු පැහැති සන ලෝම දෙපතුළ දක්වා විහිදී තිබුණි. කොණ්ඩය උරහිස වසාගනිමින් තිබුණි. මස් ගොබ වැහැරී ඇටකටු පෑදී තිබූ අත දුශාන් දෙසට ළං කරන්නට විය.

දැන් දුශාන්ට වඩාත් පැහැදිලි ලෙස එම මුහුණ පෙනෙන්නට විය. ඇතුළට කිඳා බැස ඇති ඇස් දෙක කුණු ලේ පැහැති විය. තඹ කාසියක් වැනි යමක් දුශාන්ගේ මුඛයට දමන්නට විය. එය උගුරට ම තව තවත් ඇතුළු කලේ දිගුකර තිබූ අතෙහි නහර පෑදී තිබූ මහපට ඇඟිල්ලෙනි. දුශාන්ගේ හද ගැස්මේ වේගය වැඩි විය.

දෙවියන් සිහි වූ දුශාන් එකවර වේදනාවෙන් කෑ ගැසීය.

"මල්ලි....... මල්ලී...... ඔයාලගේ ගේ ළඟට ඇවිල්ලා........ ඔයා බහින්නේ නැද්ද..."

එහි සිටියේ චතු අක්කා ය.

සිදුවන්නේ කුමක්ද? භීතියෙන් ඇලළී දඟඩිය වගුරුවමින් සිටි දුශාන් හට කිසිවක් සිතා ගැන්මට පවා නොහැකිය.

"බයවෙන්න එපා මල්ලී මට.... ඔයාගේ ගෙදරට තව ටික දුරයි....ඔයා බය උනා නම් මට සමාවෙන්න..." ඇය පැවසූයේ ඉතාමත් ආචාරශීලී ව ය.

සියල්ල ඇය ව නපුරු අක්කා යනුවෙන් හැඳින්වුව ද සවනට මිහිරි මෘදු මොළොක් කටහඬකින් වූ ඇගේ එම කතා කිරීමේ ශෛලිය ඉතාමත් කාරුණික ය. ඇයගේ වූ සුහදශීලී බව හමුවේ දුශාන්ගේ සිතෙහි තිබූ බිය මඳක් පහ ව ගොස් තිබුණි.

"නපුරු අක්කා"

එහෙත් ඒ වන විට සියලු සිසු සිසුවියන් විසින් ඇය ව හඳුන්වන ඒ සුපුරුදු නාමය ඔහුගේ මුවින් පිට වී හමාරය.

"මම නපුරු කෙනෙක් නෙමෙයි මල්ලි ....මට ආයෙත් ඒ නම කියන්න එපා.. මගේ නම චාතුයර්ා... මට චතු අක්කා කියලා කතා කරන්න." ඇය කීවේ සිහින් සිනහවක් පාන අතර ය.

පාසැල් බසය නිවස ඉදිරිපිට නැවැත්වීය. චතු පැවසූ සියල්ලට ම ප්‍රතිචාර ලෙස දුශාන් හිස ඉහළ පහළ සැලුවේය.

දුශාන් බසයෙන් බැස පටු මාවතින් නිවස කරා ගමන් කළේ වමතේ ඇඟිලි තුඩුවලින් තම දෑස් පිරිමදිමින් ය. ඔහු සියල්ල එකිනෙක මතක් කළේය.

" අනේ... අනේ... දාඩිය පෙරාගෙන ඇවිල්ලා ඉස්කෝලේ ඇඳුමෙන් ම උරු පැටියා වගේ නිදාගෙන ඉන්න අපූරුව.........යනවා...... ගිහිල්ලා ඇඟ හෝදගෙන එනවා කෑම කන්න" ඇයගේ කට හඬ වේගවත් විය.

නිවස තුළට පැමිණි දුශාන් හට හිඳ ගත් සෝෆාව මත ම මඳක් නින්ද ගොස් තිබුණි.

ඔහු සිය මවගේ කන්දොස්කිරියාවෙන් බේරීමට දහවල් ආහාරය ලබාගත්තේය.

සිදුවන සියල්ල පිළිබඳ ආතතියෙන් සිටි දුශාන්ට රාත්‍රී ආහාරය ගැනීමට ද එතරම් උනන්දුවක් නොවීය.

එහෙත් සිය දිනපොතෙහි සටහන් තැබීමට අමතක නොකළ ඔහු ඉන් පසු එක දිගට ම නින්දට වැටෙන්නට වූයේය. එදා දවස ඔහුගේ මනසට බොහෝ වෙහෙසකාරී දවසක් වන්නට විය.

" ගුඩ් මෝනරින් මල්ලී.....කොහොමද ඊයේ හොඳට නින්ද ගියාද.." සුපුරුදු සිනහව පෑ චතූ විමසීය

පසු දා උදයේ පාසල් බසයට ගොඩ වීමේ දී දුශාන් හට හිඳ ගැනීමට සිදු වූයේ ඇය අසලින් ය.

"ඔව් අක්කේ...... ඇයි හදිස්සියේ ම එහෙම ඇහැව්වේ " අබලන් වූ අසුනට බරදුන් දුශාන් විමසුයේ තරමක උනන්දුවෙනි.

" අහ්හ්......මල්ලි ..... ඒක නෙමෙයි....ඉස්කෝලේ සර් කෙනෙක් කියපු දෙයක් නිසා...... ඔයා ගොඩක් හිතේ අමාරුවෙන් නේද ඉන්නේ...." චතූ එකවර පැවසීය.

මඳ වේලාවක් යන තෙක් ඇය දුශාන්ගේ දෑස් දෙස ඍජු ව බලා සිටින්නට විය.

ඈ කට කොනින් දත් පෙන්වා මඳ සිනහවක් පෑවේ ඔහුට ඔච්චම් කිරීමට මෙනි.

"අක්කා කොහොමද ඒක දන්නේ." දුශාන් තුළ වූයේ පුදුම සහගත ස්වභාවයකි.

"ඔයා ඉතිහාසය සිතියම් ටික ලකුණු කළාද.. එතකොට ඔයාට අර මග ඇරුණු සිංහල සටහන්, ඔයා ඒවා සම්පූර්ණ කරගන්න යාළුවෙක්ගෙන් පොතකුත් ඉල්ලගෙන ආවා නේද...? පොත් ටික බෑග් එකෙන් එළියට ගන්න.... මම ඔයාට උදව් කරන්නම්...." චතූ පැවසූයේ දැඩි විශ්වාසයකින් ය.

දුශාන්ට සියල්ල මතක් වූයේ එවිටය. ඇයගේ මුහුණ දෙස බලාගත් ඔහු හට කිව යුත්තේ කුමක්දැයි කල්පනා නොවීය. ඈ පැවසූ සියල්ල ම සත්‍යය.

" අ... අක්....අක්කා කොහොමද මේ..... ඔක්කොම දන්නේ" වචන අමුනාගත් දුශාන් කීවේය.

ඔහු සිය බෑගයට අත දැමුවේය.

"මගේ මුහුණ දිහා බලාගෙන ඉන්න නෙමෙයි ළමයෝ කිව්වේ....... ඔය පොත් ටික එළියට ගන්න කියලා... මොකද පරක්කු වෙන්නෙත් ඔයාටමයි." චතූ පැවසීය.

දුශාන් ද ලහි ලහියේ බෑගයෙන් පොත් ටික එළියට ගත්තේය.

චතූ වමත් කාරිනියකි. සිංහල සටහන් සම්පූර්ණ කිරීමේ කාර්යය ඇය භාරයට නතු විය. දුශාන් සිදුකළේ ඉතිහාසය සිතියම් ලකුණු කර සම්පූර්ණ කිරීම පමණකි.

නිසි හැඩයකින් යුක්ත ඇයගේ මුතු කැටවන් වටකුරු අත් අකුරුවලින් ඔහුගේ සිංහල සටහන්

පොතෙහි සටහන් ඉක්මනින් සම්පූර්ණ වන්නට විය. බස් රථය පාසලට ආසන්න ව තිබුණි.

දුශාන්ට හමුවූයේ හොඳ යෙහෙළියකි.

එසේ සිතමින් ඇයට සමු දී බස් රථයෙන් බැසගත් දුශාන් පාසලට දිව ආවේ නව පණක් ලද්දාක් මෙනි.

" ඒයි පොඩි එකා..... ඔහොම ඉන්නවා" එය ඇසීමට අප්‍රසන්න ගොරෝසු කටහඬකි.

දුශාන් තිගැස්සී පිටුපස හැරී බැලූවේය. එවිට ඔහුගේ නෙත් ගැටුණේ එම බස් රථයේ ම ගමන් ගන්නා උසස් පෙළ සිසුවෙකි. ඔහුගේ නම ලක්ෂාන් ය.

ලක්ෂාන් හැඩි දැඩි සිරුරකින් හෙබි අයෙකි. එසේ කතා කළේ ඇයි දැයි කල්පනා කරමින් ලක්ෂාන් තමා අසළට එන තෙක් දුශාන් හුන් තැන ම රැඳී සිටියේය.

ලක්ෂාන් වම් උරහිසේ කෙළවරට වන්නට අත බර කර තැබුවේය. ඔහු දුශාන්ගේ අත රිදෙන නොරිදෙන තරමට ග්‍රහණය කරගත්තේ ඉන් පසු ව ය.

"මල්ලි.... මම දන්න නිසා මේ කියන්නේ........" පැවසූ ලක්ෂාන් දූශාන් කෙරෙහි එතරම් ප්‍රිය මනාප බවක් නොවූයේය.

"ඔය වතූ කියන්නේ එච්චර හොඳ කෙනෙක් නෙමෙයි.... මට මතකයි එයාට හොඳ යාළුවෙක් හිටියා ලියනගේ කියලා...දෙන්නා අපේ ස්කූල් බස් එකේ ම තමයි ගියේ... කොටින් ම දෙන්නා හිටියේ හැමවෙලේ ම එකට.....හරියට නිකන්....ජාඩියට මූඩිය වගේ.

කොහොමහරි ලියනගේ හේතුවක් නැතුව වහ බීලා මැරුණා..... ඒක නිසා තමයි ඔය වතූට හැමෝම බය.. ටිකක් පරිස්සමෙන් කොල්ලෝ.... මටත් උඹ වගේ මල්ලි කෙනෙක් ඉන්නවා... එකයි කිව්වේ පරිස්සමෙන් කොල්ලෝ......" ලක්ෂාන් පැවසීය.

ලක්ෂාන් කිසිවක් හිතෙහි සඟවා පිටින් කතා කරන වගක් දූශාන්ට දැනුණි. එසේනම් ඒ කුමක්දැයි, දූශාන් තුල වූයේ සැකයකි.

ඒ කුමක් වුව ද ඇවිද යන අතරේ ලක්ෂාන් පැවසූ දෑ දූශාන්ට විශ්වාස කිරීමට පවා අපහසු ය. එම වදන් දූශාන්ට සිතන්නට තවත් යමක් එකතු කළේය.

විදුලි සීනුව ද මනසට පීඩනය වැඩි ම අවස්ථාවේ නාද වූයේ පළමු වන කාලච්ඡේදය ආරම්භ වීමට ය. බර කල්පනාවක සිටි දූශාන් එකවර පියවි සිහියට ආවේය.

වළලුකරට ඉහළින් වූ උස සපත්තුව පැළැද ඔහු ගාම්භීර ලෙස සිටියේය. එම කළු පැහැති සපත්තුව සම්පූර්ණයෙන් දිස්වනුයේ ඔහු ඇවිදින විට පමණි. අශ්වයෙකුයේ කුර මෙන් ශබ්ද නඟා ඔහු ඇවිදින හඩ ළමුන් සීරුවෙන් බිරාන්ත ව

තබන්නට විය. වෙන දා මෙන්ම අද ද එහි කිසිදු වෙනසක් නොවූණි.

තීරණාත්මක විෂය කාලච්ඡේදය ආරම්භ වන විට ම සිසුන් සිටියේ සියල්ල සූදානම් කරගෙන ය.

එය සිංහල කාලච්ඡේදයයි. එකෙකුට එකෙක් මුහුණ බලන්නේවත් නොමැති තරම් වූ භීතියක් ඔවුන් ගුරුතුමා කෙරෙහි වූහ.

මුහුණට වැටී තිබූ කෙහෙරැළි පැත්තට සිටින සේ සකසමින් ගුරුතුමා පන්තියට පැමිණියේ ඒ අතරතුර ය.

ගුරු පුටුව අසලින් ඔහු සිසුවෙකුගේ පොතක් අතට ගන්නට විය.

අහම්බෙන් මෙන් දෙතුන් දෙනෙකුගේ පොත් පරීක්ෂා කළේය. ඔහු තැනින් තැනට ගමන් කළේ වියරුවෙන් ය.

අතට ගත් පොතක් නිශ්චිත පිටුවක් දක්වා ඔහු කියවූයේය.

එම සටහන් පොත් ද රැගෙන පන්තියෙන් එළියට නික්මුණු ගුරුතුමා පිය නැගූයේ අල්ලපු පන්ති කාමරයට ය.

ගත වූ ඇසිල්ලෙන් සියල්ලන් ම පන්තියෙන් එළියට කැඳ වන්නට විය. ගුරුතුමා පොත් පරීක්ෂාව සඳහා සිසුන් පෙළගැස්වූයේ ඉන් පසුව ය. බිරාන්ත හෝරාව ආරම්භ වුණි.

සටහන් සම්පූර්ණ කල සියල්ල නැවත පන්තිය තුළට පිටත් කර හරින්නට විය. සටහන් සම්පූර්ණ නොවූ සිසුන්ට වේවැල් පහරවල් සමග දණ ගසා සිටීමට ගුරුතුමා නියම කළේය.

දූශාන්ගේ පොත පරික්ෂා කිරීමේ වාරය ද ක්‍රමයෙන් පැමිණෙන්නට විය.

වේවැල අතැති ව දෙපැත්තට වනමින් පහර දීමට ලැස්ති ව සිටින ගුරුතුමා ඉදිරියේ පොතෙහි පිටු එකිනෙක පෙරළා පෙන්වන දූශාන් හට ගුරුතුමගේ මුහුණේ ඉරියව් වෙනස් වන අයුරක් දිස්වුයේ මේ අතරය.

"අක්කා මගේ සටහන් සම්පූර්ණ කරපු එක සටර් අහුවෙයිද දන්නෑ." දූශාන් කල්පනා කරන්නට විය. ඔහුට ඉවසුම් නොවීය.

දූශාන්ට පන්තිය තුළට යාමට අණ ලැබුණි.

සියල්ල අවසානය. දූශාන් සිටියේ සැනසීමෙනි.

"ඔ..හෝම....ටිකක් ඉන්නවා ." ගුරුතුමා දූශාන් ව නවත්වන්නට විය.

හෙතෙම එසේ කීමත් සමග ම සියලු සිසුන්ගේ නෙත් එකවර දූශාන් දෙස යොමු විය.

පන්තියට ගමන් කරමින් සිටි දූශාන් ගුරුතුමා දෙසට හැරුණේ ඊළඟ මොහොතේ දී කුමක් සිදු වේ ද යන දෙගුණ තෙගුණ වූ සැකයෙන් සිත කළඹමිණි.

"අනිවායෙර්න් මගේ පොතේ අත් අකුරු වෙනස් කියලා සිංහල සර් අඳුරගත්තා....... . මට ඒවා තනියෙන් සම්පූර්ණ කරන්න තිබ්බා.... අනේ දෙවියනේ මාව බේරල දෙන්න... මම ආයෙත් එයාව ආශ්‍රය කරනවා තියා මූණ බලන්නෙවත් නෑ.... දෙවියනේ මට උදව් කරන්න.... " දෙවියන්ට සිතෙන් පොරොන්දු වූ දූශාන්ගේ ශරීරයේ හිරිගඬු පිපුණි.

සිතෙහි හැඟීම් අවදි වෙත් ම දුශාන් ගුරුතුමා ළඟට තවත් ළං වන්නට වූයේ වැඩි වූ හෘද ස්පන්දනයට සම වදිමිනි. තබනා එක් පියවරක් පාසා දැනෙනා බිය වැඩි විය.

වැටෙනා හුස්ම පවා උණුසුම් සේ දුශාන්ට දැනුණි. ඔහු සිටියේ වෙවුලමින් ය.

"අනේ දෙවියනේ මම පොරොන්දු වෙනවා... මම ආයෙත් අක්කත් එක්ක කතා කරන්නේවත් නෑ." දුශාන් සිතින් මොරදෙන්නට විය. ඔහු දෙවියන්ට දෙවනවරට ද පොරොන්දු විය.

දුශාන් ගුරුතුමා දෙසට මඳක් හිස එසවීය.

" පන්තියේ ඇතුළෙ අයට තුන්වෙනි අභ්‍යාසයයි, හතරවෙනි අභ්‍යාසයයි සම්පූර්ණ කරලා තියන්න කියනවා... මම එනකම්..... මම ඔෆිස් එකට ගිහිල්ලා එනවා... හැබැයි....මම එද්දි අභ්‍යාස ටික සම්පූර්ණ කරලා තිබ්බෙ නැත්තං... ඔබ තුමාව තමයි ඊළඟට මම අල්ලගන්නේ." ගුරුතුමා පැවසීය.

සැනසුම් සුසුමක් හෙලූ දුශාන් ගුරුතුමා පැවසූ දේ පිළිබඳ ව පන්තියේ සියලු දෙනා දැනුවත් කළේය.

නමුත් කාලච්ඡේදය අවසානය වූව ද ගුරුතුමා නැවත පන්තියට පැමිණියේ නැත.

පාසල අවසන් වූ පසු ගේට්ටුවෙන් එළියට එන දුශාන්ට සුපුරුදු සේ දිවුල් සම්බෝල සහ අච්චාරු විකුණන මිනිසුන් දක්නට ලැබුණි.

එහෙත් අද ඔහු සතු ව මුදල් නොමැත. ඔහුට කළ හැකි වූයේ ඒ දෙස කෑදර අයුරින් බලා සිටීම පමණකි.

බස් රථයට ගොඩ වූ දුශාන්ට චතු අක්කා අත ඔසවා කතා කෙළාය . ඇයගේ ආරාධනය ප්‍රතික්ෂේප කළ නොහැකි අයුරින් සිදුවිය. ඔහුද ඇය ළඟින් හිඳ ගත්තේ අදිමදි කරමින් ය. ඒ ඇයට දකුණු පැත්තෙන් වූ කවුළුව අසල ම ආසනයෙනි.

" අනේ අක්කේ මට සමාවෙන්න..... මම දෙවියන්ට පොරොන්දු වුණා ආයෙමත් ඔයත් එක්ක කතා කරන්නේවත් නැහැ කියලා..... අනේ.... මගෙන් වරදක් උනා නම් මට සමාවෙන්න..... මම ඔයාට බයයි..... අනික ඔයා අත්භූත කෙනෙක් කියලා හැමෝම කියනවා.......අනේ...අනේ..ඔයා මාත් එක්ක ආයෙත් කතා කරන්න එපා අක්කේ. මට සමාවෙන්න....." දුශාන් කීවේ මහත් තැති ගැන්මෙනි.

"හරි මල්ලි හරි.....හ්ම්ම්...ඔයා කියනවනං මම ඔයත් එක්ක කතා කරන්නේ නැතුව ඉන්නම්...... ඒත්..... මං ඔයාට ගෙනාපු මේ අච්චාරුවලටයි.... දිවුල් සම්බෝලවලට මං මොකද කරන්නේ." චතූ ක්ෂණයෙන් මාතෘකාව වෙනස් කරන්නට වූවාය.

කකුල් දෙක මත තිබූ දුශාන්ගේ බෑගය මත චතූ එම පාසර්ල් දෙක තැබුවේ මඳක් විවෘත කර ඒවායේ සුවඳ ඔහුගේ නාසයට දැනෙන සේ රඳවමිනි.

" මම දන්නවා ඔයා දිවුල් සම්බෝලවලටයි අච්චාරුවලටයි ගොඩක් ආසයි කියලා මල්ලි." චතූ ඒ වදන් පැවසූයේ තරමක් ජයග්‍රාහී ලීලාවෙනි.

සුවඳ දැනී රස නහර පිනා ගිය දුශාන් සිය පෙරේත කම සඟවා ගැනීමට උත්සාහයක නිරත වූව ද ඔහු අද අසාථර්ක ය.

ඇයගේ ඇවිටිලි කිරීම් හමුවේ ඔහු ඒවායේ රස බැලූවේය. දුශාන් හට ඒ සියල්ල අනුභව කරන තෙක් ඉස්පාසුවක් නොවීය.

"ඒක නෙමෙයි අක්කේ....... මම මේ අහන්නමයි කියලා හිටියේ...... ඔයා කොහොමද මං ගැන මේ තරම් හොඳට දන්නේ.....අනේ.... වෙලාවකට මට බයත් හිතෙනවා අක්කා... හොල්මනක්ද කියලා." දුශාන් විමසුවේ විමතියෙනි.

ඇයගේ සුවඳ විලවුන් සුවඳ ඔහුට දැනෙන්නට විය. ඒ ඇය තවත් ඔහුට ළං වූ හේතුවෙනි.

"හ්මම්ම්ම්ම්... ඔයා අහගෙන ඉන්නවනම්......" වතූ ඉතාමත් හැඟීම්බර විය.

වචන උච්චාරණය කිරීමේදී ඇයගේ මුවින් පිටවන නැවුම් සුවඳට දුශාන් සම වැදී සිටියේය. ඔහු එයට බෙහෙවින් ආශා කළේය. විටෙක ඇය ව වැළඳගන්නට ඔහුට සිතුණි.

" මම කියන්නම්. ඒක ගොඩා...ක් දිග කතාවක් මල්ලි... .." පැවසූ ඈ සැනසුම් සුසුමක් හෙලන්නට වූවාය.

මෙතෙක් සිනහවෙන් සිටි ඇයගේ මුහුණ දැන් වැසි වසින්නට ආසන්න ආකාශය මෙන් අඳුරු ය. දුශාන් ද ඇසිපිය නොහෙලා ඇය දෙස බලා සිටියේය.

"මාත් ඉස්සර ඔයා වගේ ම ගොඩක් බයෙන් හිටපු කෙනෙක්.....ගොඩක්... බයෙන් හිටපු කෙනෙක්... මම ඒ නිසා ම ගනුදෙනුවක් කරා කෙනෙක් එක්ක.... ඒ ගනුදෙනුව නිසා මට මගේ හොඳ ම යාළුවෙකුත් නැති වුණා." පැවසූ ඈ දිගු සුසුමක් ඉහළට ගන්නට විය.

එය නැවත පිට කළේ තම දකුණතින් සිය නාසය මෙන් ම මුහුණ ද වසා ගනිමින්ය.

දඩාස් හඬ සමග බස් රථය ඒ මේ අත පැද්දී දෙදරා නැවතුණේ කඳුළු අතරින් සිය කතාව වචනයෙන් දිගහැරෙත් ම එයට බාධා කිරීමට මෙන් ය.

හිස බදාගත් දුශාන් හුන් තැන ම වකුටු විය. දුශාන්ට ඔහු දෙවියන්ට දුන් පොරොන්දුව සිහි විය. එහෙත් දැන් එය කඩ වී හමාර ය.

බස් රථයේ රියදුරා ද එය නවත්වා දොර විවර කලේය. අසුනෙන් බැස බස් රථය පිටුපසට ගමන් කරන රියදුරු දෙස සියල්ලන් බලා සිටින්නට විය. ඉවසීමක් නොවූ ඇතමෙක් ඒ වන විට ද පාසැල් බසයෙන් බැස හමාර ය.

"අයියෝ.....මට ස්පෙයාර් වීල් එකක් ගේන්න අමතක උනා...නේ... බස් එකේ ජැක් එකත් ගෙනල්ලා නැහැ. ඒ මදිවට මේ රිම් එකත් ඇද වෙලා". පැවසූ රියදුරු තම හිසේ අත ගසා ගන්නට වූයේය.

ඉතාමත් අබලන් තත්වයේ පැවතුන රෝසා වගර්යේ බස් රථයේ එක් රෝදයක් වලක වැටීම හේතුවෙන් හුළං ගොස් ඇති බව ඒ දෙස බැලූ සිසුන්ට දැක ගත හැකි විය.

බස් රථයේ රියදුරු වහා ක්‍රියාත්මක විය. ඔහු සිය යහළුවෙකුගේ වෑන් රථ දෙකකට සියල්ලන් භාර කළේ නිවෙස් වෙත ගොස් බැස්වීමට ය.

චතූ සහ දුශාන් එක ම වෑන් රථයේ එක ළඟ හිඳහ. එහෙත් ඇති වූ තදබදය සමග එකිනෙකා අතර කතා නොකළ ඔවුහු සිටියේ ආගන්තුකයන් මෙනි.

"අර චතු අක්කා කිව්ව ගනුදෙනුව මොන වගේ දෙයක් වෙන්න ඇතිද...... එයාගේ යාළුවා නැතිවුණා කිව්වෙත් ඒකෙන්ම නේද... අනේ මටත් ඔය කියන යාළුවා වගේ

මැරෙන්න වෙයිද.... එයත් එක්ක ඉඳලා...අනේ දෙවියනේ මට ඇත්ත පෙන්නුම් කරන්න." වරින් වර චතූගේ මුහුණ බැලූ දූශාන් සිතුවේය.

නිවස අසලට පැමිණි පසු ව චතූ අක්කාට අතෙන් සංඥා කර දූශාන් එයින් බැස ගියේය.

දූශාන් නැවතත් අද දවසේ සිදු වූ සිදුවීම් පිළිබඳ ව මතකය ආවර්ජනයක යෙදෙන්නට වූයේ කුඩා බොරළු පාර ඔස්සේ සෙමෙන් ඇවිද යන අතර ය.

"දූශාන්.........දූශාන්...........ඔය මොකද ආපු ඇඳුම් පිටින් දොර ළඟට වෙලා කරන්නේ. ඉක්මනින් ඇඟපත හෝදගෙන ඇවිල්ල පන්ති යන්ට ලෑස්ති වෙන්න.... පංති යන්න පරක්කු වෙනවා." අම්මගේ කෑගැසීම ඇසී දූශාන් එකවර තිගැස්සුණේය.

ඔහු හට අනිවාර්යෙන් ම පන්තියට යාමට අවශ්‍ය බැව් හැඟෙන්නට වූයේ පළමු වර මෙසේ ක්‍රියාත්මක වූ ඇය දෙවන වර පැමිණෙන්නේ කොසු පොල්ලෙන් ඔහුට තැලීමට බව මතක් වන විට ය.

අතිරේක පන්තිය ද පැය දෙකකට වඩා වැඩි කාලයක් ඇදිනි.

එය නිමා වනවාත් සමග නවයයි තිහ පමණ වන්නට විය. දූශාන් යළි නිවසට එන්නට වූයේ තනි ව ඇවිදගෙන ය.

ත්‍රී රෝද රථ කිහිපයකට ම ඔහු අත දැමුව ද ඒ හැම රථයක් ම පාහේ නොනවත්වා ධාවනය කළේය. අවසානයේ දූශාන් සිය නිවස දක්වා ම ඇවිද යාමට තීරණය කරන්නට විය.

ඔහු දහයයි තිහ පමණ වන තෙක් නොනවත්වා ගමන් කළේ ය.

දුශාන් ගමන් කරන මාගර්ය ආසන්නයේ එක් තැනකි. බැලූ බැල්මට මිනිස් වාසයකින් තොර වූ එම පාළු පෙදෙස ඔහු කුඩා කළ සිට ම ගමන් කිරීමට අකමැති තැන් අසලින් වැටී තිබුණි.

එම පාරේ දෙපසින් පුරන් ව ගිය වෙල් යායකි. කාලයත් සමග වධර්නය වූ පන් ගස් සහ ඉලුක් පඳුරු ද එයට ඉතාමත් ගුප්ත පෙනුමක් එක් කළේය.

එහි විදුලි පහන් පවා නිසි සේ ක්‍රියාත්මක නොවුණි.

ඒ අවට වඩාත් ම ප්‍රචලිත වූයේ හුදෙක් ම රන් මාලා කඩා ගැනීම් සහ විවිධ වංචනික කටයුතු සඳහා ය.

ඔහු මඳක් ඉදිරියට එන්නට වූයේ එතැනින් ඉදිරියට ගමන් කරන යම් අයෙකු වේ නම් ඔහු සමග එම ස්ථානය පසුකර යාමේ අදිටන පෙරදැරි කොට ගෙන ය.

හඬ තලන මැඩියන්, රැහැයියන් හා පඳුරුවලින් පැන එහා මෙහා වන සතුන් අතරින් ඔහු එසේ පැමිණෙන්නට විය.

යමෙකු එහි අවට රැඳී සිටි හෙයින් ඔහුගේ බිය මඳක් පහ ව ගියේය.

එසේ එහි රැඳී සිටියේ ගැහැණු ළමයෙකි. අනෙකුත් විදුලි පහන් මෙන් ම ඔවුන් අසල තිබූ විදුලි පහන ද ඇය අසලට වෙත් ම එකවර නිවි නිවී පත්තුවෙන්නට විය.

විටින් විට දැල්වී නිමෙන විදුලි පහන් අතරින් දුශාන්ට ඇය ව දැකගත හැකි විය. සුදු පැහැති උඩු ඇඳුමකින් හා කළු

පැහැති කලිසමකින් සැරසී සිටි ඈ රන් පැහැති ඔරලෝසුවක් පැළඳ සිටියාය. ඈ හුදෙක් ම මිහිපිට සුරඟනක් වැනිය.

දුශාන් ළඟට එන තෙක් ඈ බලා සිටියාය. මුහුණට වැටී තිබූ ඇගේ පිරිපුන් කෙස් කලඹ ඇඟිලි තුඩුවලින් කන පිටුපසට වන සේ රඳවා ගත් ඈ ඔහු හා සිනාසුණි.

"මල්ලි.... ඔයා යන්නේ මේ වෙලෙන් එහා පැත්තට ද...... මං ගොඩක් වෙලා බලාගෙන හිටියා කෙනෙක් එනකම්.... එහා පැත්තට යන්න" ඈ පැවසීය.

ඇය එසේ කතා කිරීමත් සමග ම ඔහුගේ තනියට තවකෙකු ඇතැයි සිතූ මෙතෙක් බිය වී සිටි දුශාන් පිළිතුරු දෙන්නට වූයේ මහා නිහඬීතයෙකු ලෙසින් ය.

" මාත් යන්නේ ඒ පැත්තට තමයි. අක්කට මාත් එක්ක යන්න පුළුවන්." දුශාන් පැවසීය.

නිහඬීත ලෙස බෑගයේ පටි දෙක තව තවත් තදකරගෙන ඉදිරිපසට වන සේ පපුව දිගුකර ගනිමින් දුශාන් ගමනේ යෙදුණ ද වරින් වර සිතට ඇතිවන බිය ද සමග ම හෘද ස්පන්දනයේ වැඩිවීමක් තදින් දැනෙන්නට විය.

"අක්කාව මම මීට කලින් දැකලා නැහැ.... මේ පැත්තේ කෙනෙක් නෙමෙයි වගේ මං හිතන්නේ." දුශාන් එසේ පැවසුයේ ඇය කවරෙක් ද යන්න සැක හැර දැන ගැනීමට ය.

"ඔයා මාව දන්නෙ නැති වුණාට මං නම් ඔයාව හොඳට දන්නවා මල්ලි....." ඇය එසේ පැවසීමත් සමග දුශාන් ගමන නවත්වා ඇයගේ මුහුණ දෙස බැලුවේය.

ඔහුගේ හෘද ස්පන්දනය ද සිය දෙසවන්වලට ශ්‍රවණය වන මට්ටම වැඩි වන්නට විය.

"ඔයා යන්නේ අර රෝසා බස් එකේ නේද... ඔයා උදේට ඉස්කෝලේ යන්න බස් එක එනකල් සුරුවම ඉස්සරහ හිටගෙන ඉන්නවා මම හැමදාම දකිනවා... කොහෙද ගමේ හිටියා කියලා ඔයා මාව වත් දන්නේ නැහැනේ." පැවසූ ඇය සිනාසුණි.

බියෙන් සිටි දුශාන් සැනසුම් සුසුමක් හෙලුවේය. තවදුරටත් ගමන් කරන අතර ඊළඟ මොහොතේ ඔහුට මතක් වූයේ නිවස වෙත පිවිසීමට කනත්ත පසු කරමින් යා යුතු බව ය.

"අක්කගේ ගෙවල් කොහෙද තියෙන්නේ" දුශාන් එසේ පැවසූයේ කනත්ත හරහා වැටුණු මාගර්යෙන් ද ඔහුට ඇ හා ගමන් කළ හැකි ද යන්න සැක හැර දැන ගැනීමට ය.

"ඔයා උදේට ඉස්කෝලේ යන්න බස් එක එනකල් ඉන්න තැන් ඉඳන්... මීටර්..... සීයක් දෙසීයක් වගේ දුරක් ඇති මල්ලි......."

"ඇයි එකපාරටම ඔයා එහෙම ඇහුවේ... ඉස්සරහ කනත්ත ළඟින් යන්න තියෙන...බයටවත් ද... බය වෙන්න එපා මම අන්තිමයක් වෙනකන් ඔයාගෙ ළඟ ඉන්නවා." සිනාසුණු ඇ පැවසීය.

දුශාන් බලාපොරොත්තු නොවූ අයුරින් ඇ එසේ පැවසීමත් සමඟ දුශාන්ට තමා කෙරෙහි හුදෙක් ම ලැජ්ජාවක් ඇති වූයේ ය.

"අනේ නැහැ එහෙම බයකට ඇහැව්වා නෙමෙයි." දුශාන් පැවසීය.

ඒ සමග ම කනත්ත පාර පසු කරමින් සිටි ඔවුන් අසලින් යතුරු පැදියක් ධාවනය වූයේය.

මදක් ඉදිරියට ගොස් නතර වුණු එම යතුරුපැදිය නතර කෙරූ යතුරුපැදිකරු සියල්ලන් ඔහු දෙසට එන තෙක් බලා සිටියේය.

" මල්ලි ඇයි අද පරක්කු වෙලා" පැවසූ ඔහු හෙල්මට්ටුව මදක් එසවේවාය.

එම යතුරුපැදියේ සිටියේ දුශාන් හොඳින් දන්නා හඳුනන අයෙකි.

" එන්න…නගින්න….මම ඔයාව ඔයාගේ ගේ ළඟින් දාගෙන යන්නම්…. "

"කමක් නෑ අයියේ ඔයා යන්න. තව ටික දුරයි නේ….. මම කතාවක් දාගෙන හෙමිහිට එන්නම්…අනික මාව ගෙදරින් දාන එක අයියටත් වටයක්" දුශාන් එසේ කී පමණින් යළි කිසිවක් නොකී ඔහු පැමිණි වේගයට වඩා වැඩි වේගයකින් ඔවුන් අතරින් පිට ව ගියේය.

ඔහු නොපෙනී යනතෙක් දුශාන් ඔහු දෙස බලා සිටින්නට විය.

" මල්ලි ඒක නෙමෙයි ඔයා හොල්මන්වලට බය නෑ කිව්ව නේද… " ඇය එසේ පැවසීමත් සමග ම තිගැස්සුණු දුශාන් ඇය දෙස බැලුවේය.

"මම ඇත්ත හොල්මන් කතාවක් කියන්නද…… ඔයා අහගෙන ඉන්නවද."ඈ එසේ පැවසූයේ කනත්ත පසු වනවාත් සමග ය.

පැවසූ වදන්වලට ඔහු එකඟ වූයේ හුදෙක් ම තමා නිභීත බව ඇඟවීමට ය.

යන එන පාරේ ඔවුන් දෙදෙනා හැරෙන්නට කිසිවෙකු නැත. නැවත පාරේ වූ විදුලි පහන ද පිහිටා තිබුණේ ඔවුන් සිටිනා තැන සිට සැළකිය යුතු දුරකින් ය.

" ඒක හඳ පායලා නැති එක කළුවර දවසක්…... එක ළමයෙක් යනවලු පාළු මුසල මිනිස් පුළුටක්වත් නැති තැනකින්…. ඒ ළමයා එහෙම ගොඩක් බයෙන් යද්දි එයාට තව ගෑනු ළමයෙක් හම්බ වෙනවලු.....හරියට.. හරියටම… මං ඔයාට හම්බුනා වගේ ම.

ඒගොල්ලන් දෙන්නගේ කතාවත් දිගින් දිගට ම ගියාලු හරියට මේ වගේ ම. ඒ පාලු තැන පහුවෙලා ලයිට් තියෙන තැනකට යද්දී එතැන කණුවේ තිබ්බ ඒ ලයිට් එකත් එකපාරට ම නිවි නිවී පත්තු වෙන්න ගත්තාලු."

ඇය කතාව අවසන් කිරීමට මත්තෙන් ඔවුන් අසල තිබූ විදුලි පහන දෙවරක් නිවි නිවී දැල්වීණි.

" ආයෙත් ඒ බල්බ් එක පත්තු වෙද්දී ඒ කොල්ලට මේ ගෑණු ළමයා පේන්න හිටියෙ නෑලු."

" අනේ අක්කේ.....ඕක නවත්තන්න....හරි මම බයයි... මං ඒක පිළිගන්නවා."

දුශාන් සිය සිත තුළ ඇති වූ බිය නිසා ම යළි මෙවැනි කිසිවක් නොපවසන ලෙස ඇයට ආයාචනා කලේය. ඇයගේ සිහින් දෙතොලට වියරු සිනහවක් නැගුණි.

"අයියෝ ඔයා මාර බය ගුල්ලෙක්නේ........ හරි හරි......මම ඔයාව ගෙදර ළඟට ම ඇරලවන්නම්.... යමුබය ගුල්ලා..." පැවසූ ඇට සිනහව සඟවා ගැනීමට අපහසු විය.

ඈ ඔහුගේ නිවස අසලට ම පැමිණ එහි යාබද වූ සුරුවම අසල රැඳී සිටියා ය.

"හරි දැන් මම බලාගෙන ඉද්දිම ඔයා ඇතුළට යන්න මල්ලි...."

"අහ්හ්....මට අහන්න බැරුව ගියා...... මාත් එක්ක ගේ ළඟට ම ආවත් මට අක්කගෙ නම අහන්න බැරුව ගියානේ."පැවසූ දුශාන් සිටියේ සිදු වූ ලැජ්ජාව වසන් කරගැනීමේ වෑයමක ය.

"මගේ නම ආකෂර්ා.... සකුනි... ආකෂර්ා.." පැවසූ ඇය ඔහු නිවෙසට යන තෙක් ම බලාගෙන සිටියා ය.

"පුතා ඇයි අද පරක්කු.... අපි මේ යන්න ලෑස්ති වුණේ"

ඔහුගේ මව මැසිවිළි නැගීමට සැරසෙත් ම ඔහු කාමරය තුළට පිවිස දොරගුළු ලා ගත්තේය. සිදු වූ සියල්ල අකුරක් නැර ඔහු දින පොතෙහි සටහන් කරන්නට විය.

දුශාන් පසු දා උදේ පාන්දර දහය වන තෙක් ම නිදාගත්තේය. එදා සෙනසුරාදා දිනයකි.

"පස්ස පැත්තට එළිය වැටෙනකම් නිදාගෙන ඉන්නේ නැතුව ගෙදර වැඩක් පලක් කරන්න." පවසන අතර ම විදුලි පංකාව ක්‍රියා විරහිත කල සිය මව කාමරයේ ජනේලය ද විවර කළාය.

ලැහැස්ති වූ දුශාන් උදේ ආහාරය සඳහා පාන් රැගෙන ඒමට හැල්මේ දිව ගියේ ඇයගේ අඬෝවැඩියාව නිසා ම ය.

පාන් මිල දී ගත් ඔහු කඩෙන් පිටතට පැමිණෙන විට රාත්‍රියේ දී තමාට හමු වූ යතුරුපැදිකරු මුහුණට මුණගැසුණි විය.

"ගුඩ් මෝනිං මල්ලි.......... මට ඔයත් එක්ක ටිකක් තනියම කතා කරන්න ඕනේ........ පාන් ගේන්නද

යන්නේ.........මෙන්න සල්ලි මටත් පාන් එකක් අරගෙන එන්න මං මෙතන ම ඉන්නම්. අච්චු පාන් එකක් හරිද ."

කඩය තුළ මෙන් ම ඉන් පිටත ද පෝලිමක් තිබූ බැවින් එහි රැඳී සිටි දුශාන් පාන් රාත්තල් දෙකක් ද රැගෙන ඔහු අසලට විත් ඔහුගේ පාන් දමා තිබුණු සිලිං උරය ඔහු අතට පත් කළේය.

"අයියේ මම අයියට තව රුපියල් දහයක් දෙන්න ඕනේ මම ආයෙත් හම්බුනාම දෙන්නම්."

" කමක් නෑ රුපියල් දහය නෙහ්..... ඔයා තියාගන්න.. ඒක නෙමෙයි ඊයේ ඔයත් එක්ක ආපු යාළුවා ඔයා හොඳට දන්න කෙනෙක්ද?."

දුශාන්ගේ මුහුණ දෙස එකවර බැලූ ඔහු විමසුවේ ය.

"එහෙම්මම දන්න කෙනෙක් නෙමෙයි අයියේ... තනිකමටත් එක්ක මම ඔහේ කියව කියව ආවා."

" නෑ මල්ලි මම නිකන් ඇහැව්වේ..... දැනගන්න." ඔහු පැවසීය.

ඔහු පාන් බෑගය පැමිණි යතුරුපැදියේ හැඬලයේ රඳවා යතුරු දමා ක්‍රියාත්මක කර යන්නට සැරසුණි.

" ඇයි අයියේ එකපාරට ම.... එහෙම ඇහැව්වේ." දුශාන් ඇසුවේ ඔහු වරක් තම යතුරුපැදිය රේස් කරන අතරතුරදී ය.

" දෙයක් කියන්නම් මගේ මල්ලියේ බය වෙන්න එපා... ඊයේ රෑ ඔයා කනත්ත ළඟින් එද්දි ඔයාත් එක්ක කවුරුත් හිටියේ නෑ... ඔයා අත් දිග් කර කර කතා කර කර ආවේ තනියම... ඒකයි මම එහෙම ඇහැව්වේ.... පරිස්සමෙන් ... "

හිස්වැසුම නැවත මදක් ඔසවා ඔහු එසේ පවසා පණ ගැන්වූ යතුරුපැදියේ පවනට බඳු වේගයකින් පිටත් විය.

කුඩා කළ සිට ම විවිධ අදෘශ්‍යමාන බලවේග පිළිබඳ නානාප්‍රකාර කතා කියමින් ඔහු දූශාන් බිය ගැන්වූයේය. ඔහුට එවා අද වාගේ මතකය. දූශාන් එතරම් අවධානයක් ඔහු කී දෙයට යොමු නොකළ තරම් ය.

දවස ඉතාමත් අලස ව ගෙවී යන්නට විය. රාත්‍රී ආහාරය ලෙස ඔහුගේ අම්මා සාදා තිබුණේ ඉඳි ආප්ප ය. ඔහුගේ ඇති කැමැත්ත නිසා ම සතියකට දෙවරක් පමණ ඉඳි ආප්ප, පොල් සම්බෝල හා කිරි හොදි සමග සකස් කිරීමට ඈ පුරුදු ව සිටියා ය.

"මොකද ඔය අත ගගා ඉන්නේ කන්නේ නැතුව.. අද මගේ කෑම රස නැද්ද"

" අනේ එහෙම එකක් නෑ අම්මා... මට බඩගිනි නෑ"

ආහාර ගැනීම අවසන් කල ඔහු අත් සෝදාගන්නා අතර ම මව හා පියාණන් අතර සිදුවන සංවාදයට ඇහුම්කන් දුන්නේය.

"ළමයා ටික දවසක ඉඳලා......ගොඩක් අමුතුයි.......මට මූණදීලා හරියට කතා කරන්නෙත් නෑ." සිය මව පැවසීය.

" මොනවාහරි ඉස්කෝලේ ප්‍රශ්නයක් ද දන්නේ නෑ... මම හිමිහිට අහල බලන්නම් ළමයගෙන්" ඔහුගේ පියාණන් ඊට පිළිතුරු දුනි.

කාමරය වෙත පැමිණි දූශාන් ඇඳට පැන්නේය. කොට්ටය යටින් අත් දෙක යවා මුහුණට තවත් තද කරගත්තේ රිසි සේ නිදා ගැනීමට ය.

YES
NO
OUIJA
ABCDEFGHIJKLM
NOPQRSTUVWXYZ
1234567890
GOOD BYE

02. යක්ෂයාගේ ක්‍රීඩාව

" මල්ලී.... මල්ලී මම ආවා.... ඔයාව අරගෙන යන්න රියන් හතරක් යටට"

යහනේ සිටිය දී ම ඇඳ ඇතිරිල්ල පිටින් යමෙක් දූශාන්ගේ කකුලෙන් ඇද්දේය. ඒ ඔහු නිදා සිටි ඇඳෙන් ද බිමට වට්ටමින් ය.

එහි සිටියේ කිමෙක් දැයි දූශාන්ට එතරම් පැහැදිලි නොවීය. එහෙත් එම කටහඬ ඔහුට හොඳින් ම හුරුපුරුදු ය. ඔහුගේ දෙසවන් රිදුම් දුණි. ඔහු සිටියේ අපැහැදිලි ඡායාව හඳුනා ගැනීමේ වෑයමක ය. එහි සිටියේ වතු අක්කා නොව ඊටත් තරමක් වෙනස් අයෙකි. ඇයගේ හැඩහුරුකම් කොහේ හෝ දැක ඇතැයි ඔහුට සිතුණි. එහෙත් නිවැරැදි මතකයක් ඔහුට නොවීය.

එය ඔහුගේ ඇඳ නොව සොහොන් කොතකි. ඔහු සිටියේ සොහොන් පිටියක අලුත වළ දැමූ මිනී වළක් බදාගෙනය. සිදුවන්නේ කුමක්දැයි ඔහුට දැනගැනීමට අවශ්‍යය. ඔහු අවට ඒ වන විට ද අඳුරු වළාවක් පැතිර යන්නට විය.

මිනි වළ තුළින් පිටතට ආවේ අතකි. එය වම් කකුලේ විලුඹ ග්‍රහණය කරගන්නට විය. තව තවත් එය වළ තුළට ඇදගෙන යන්නට පටන් ගැනුණි. දූශාන්ගේ දෙපා පණ නැති වන සේ ඔහුට දැනිණ. හඬ ගැස්ම වැඩි වූයේය. දූශාන් යටි ගිරියෙන් කෑමොර දෙන්නට විය.

ඔහුගේ කෑගැසීම් හඬ ඇසී ඔහු ම අවදි වුයේය. ඔහු දැක තිබුණේ සිහිනයක් යැයි වැටහෙන විට ම සිය මව හා පියා කාමරයට දිව ආහ.

" පුතා.. පුතා.. පුතා ඇයි මේ....."

කම්මුලට තට්ටු කල මව දූශානි හිස ඇයගේ ඔඩොක්කුවේ හොවා ගත්තේ විමතියෙනි. දූශාන්ගේ මුලු ශරීරය ම ගැහෙමින් තිබුණි. දහඩිය වගුරුවාගෙන සිටි දූශාන්ගේ හුස්ම ගැනීමේ වේගය නම් අඩු වූයේ නැත.

"ඕක තමයි කියන්නේ රෑට දෙවියන්ට ඔරසම් කියලා නිදාගන්න කියලා"

හිස පිරිමදිමින් දූශාන්ගේ පියා ඔහු සනසා ඉන් පිට ව ගියේය.

හුස්ම ඉහළ පහළ හෙලීමේ වේගය මදක් අඩුවන විට දූශාන්ගේ හිසෙහි අත තැබූ ඇ දහඩිය පිස දමා ඔහු දෙස බලා සිටියේ ඉතාමත් ඕනෑකමින් ය.

" පුතා......අපි උදෙන් ම යනවා මල්ලිගේ ඉස්කෝලේ දාන වැඩේ බලන්න..... මෙයාවත් ඔයාගේ ඉස්කෝලෙට ම දාගත්තනම් කිසි කරදරයක් නෑ... අබේරත්න අන්කල්ලාත් එක්ක යන්නේ. අපි එන්න නම් ටිකක් හවස් වෙයි..... දවල්ටත් එක්ක කෑම හදලා ඇති බෙදාගෙන කන්න ඇතිවෙන්න." සිය මව පැවසීය.

පල්ලියේ ඉරු දින දේව මෙහෙය පැවැත්වෙන බැව් දූශාන්ට සිහි විය. එහෙත් ඔහු එයට තනි ව සහභාගී වීම සිදු නොකලේය.

දූශාන්ට බඩගින්නක් දැනෙන්නට විය. ඔහු කෙසේ හෝ කෙමෙන් නාන කාමරය වෙත පියවර මනින්නට වූයේය.

ඒ උදෑසන ආහාරය ලබාගැනීම පිණිස දතකට මැද ගැනීමටය. වම් පාදයේ වූ තුවාලයක් ඇති බව ඔහුට එතරම් තැකීමක් නොවීය.

අඩවන් දෙනෙතින් වූ දුශාන්ට තිබුණේ තද නිදිමතකි. ඔහු දත් බුරුසුව ඉවෙන් මෙන් අතගා සොයාගත්තේය. දන්තාලේපයෙන් ස්වල්පයක් දත් බුරුසුවේ කෙඳි මත වත්කර කටේ දමාගත්තේ ඉන්පසු ව ය.

"ශික්...... කටම පිච්චුනා වගේ..... අම්මා කොයි වෙලාවේ වුත් පේස්ට් එක මාරු කලාද දන්නේ නෑ" දුශාන් කෝපයෙන් කෑ ගැසීය.

එය අධික මින්ට් ගතියකින් යුක්ත ය. එය මුවේ දත් සහ දිව අතර දැවටුණා පමණකි. අධික සීතලක් ඉන් ජනිත වූයේය. දුශාන් තරහෙන් පුපුරු ගැසීය. කෑගසනා විට දත් බෙහෙත් කණ්ණාඩියේ ඒ මේ අත විසිරුණි. ඒ වන විට ඔහුගේ නිදිමත පහ ව ගොස් තිබුණි.

බිම වැටුණු දත් බුරුසුව ඔහු නැවත කටෙහි ඔබා ගත්තේය. වතුර දමා කණ්ණාඩිය පිරිසිදු කළේය. වරෙක බිමට හැලෙනා කලිසම ද නුහුරු අතින් ඉනෙහි රඳවා ගත්තේය.

වරක් දෙවරක් අත කණ්ණාඩියේ ඒ මේ අත යවමින් පිරිසිදු කරන්නට විය. දුශාන්ට තම ප්‍රතිබිම්බය දැකගත හැකිය.එහි කිසිඳු සැකයක් නොමැත. එහෙත් විටෙක ඔහුට එහි අමුත්තක් දැනෙන්නට වූයේය. යමෙකු ඔහු දෙස බලා සිටියේය. කිහිප වතාවක් ඔහුට මෙලෙස දැනුණි.

හොරැහින් ඔහුට ඒ දෙස බැළිනි.

සිහින් සීතලක් ඔහුගේ ගත වෙලා ගන්නට විය. ඔහුගේ සිරුරේ හිරිගඩු පිපෙන්නට විය. ගෙල පිටුපසින් ආරම්භ වූ

සීතලක් විදුලියක් මෙන් පිට කොන්ද දිගේ ඉහළට ගමන් කරනු ඔහුට දැනුණි.

දත කට පූට්ටු වන මට්ටමට දක්වා වූ සීතල ක්‍රමයෙන් වැඩි වර්ධනය විය.

තවමත් දුශාන් සිටින්නේ වෙවුලමින් කණ්නාඩිය දෙස බලාගෙන ය. ඔහු නිවැරදි ය. කණ්නාඩියේ ප්‍රතිබිම්බය ඔහු ක්‍රියා කරන වේගයට වඩා මඳක් අඩුවෙන් ක්‍රියාත්මක වේ. විටෙක නිශ්චල වූ යේද එකවර චන්චල වූයේ ද දුශාන් කිසිසේත් ම නොසිතූ අයුරින් ය. ඔහුට කෑගැසුණි.

සිය වම් පාදය එකවර ම යමෙකුගේ ග්‍රහණයට නතු වූයේය. හිටි පාදයෙන් ම ගැම්මක් ගත් දුශාන් නාන කාමරයේ දොරට සිය දකුණු පාදයෙන් ගසන්නට විය.

ඔහු ඉන් පිටතට පැමිණියේ ය. දුශාන් හට හැකි ඉක්මනින් නිවසින් පිටවීමට අවශ්‍යය ය. මර බිය ඔහුට දැනුණි. එහෙත් ඔහුට එතරම් දුරක් ගමන් කිරීමට අවකාශයක් නොවීය.

කන් බිහිරිවන මට්ටමට මුළුතැන්ගෙය දිශාවෙන් හටගත්තේ කෑගැසීමකි. එය ගැහැනියකගේ අඳෝනාවකි. එය එන්න එන්න ම වැඩි විය. ඒ හා සාපේක්ෂ ව ගෙදර තුළ වූ බඩුබාහිරාදිය ඒ මේ අත විසි වී ගියේය. දැන් එය කුමක් නමුදු දුශාන්ට එය බොහෝ ආසන්න ය.

බය බිරාන්ත වූ දුශාන් සිටින්නේ සිහි විකල්ලෙනි. දිවයන ඔහුගේ පය ලිස්සා යන්නට විය. ගතවූයේ නිමේෂයකි. සිය දණහ ටයිල් පොළවේ පතිත විය.

දුශාන් අසල ම වූ බිත්තිය අල්ලා ගනිමින් නැගිටීමට උත්සාහ කලද සිය දනිහ බොහෝ සේ රිදුම් දුණි.

ඇති වූ වේදනාව සමඟ ඔහු නැවතත් ඇද වැටුණි.

බඩගාමින් හැකිතාක් වේගයෙන් නිවසින් පිටතට ඒමට දුශාන් උත්සාහ කරන්නට විය. දෙවන වර සවනට අම්හිරි ශබ්දයක් ශ්‍රවණය වූයේ ඔහු පිටුපසින් ය. ඒ ඔහුගේ සවනට ආසන්නයෙන් ම ය.

යටිබඩ සීතල වන සේ ඔහුට දැනුණි. පාපිස්නාවේ කෙළවරක් යමෙකු එසවූයේ ඔහු පිටුපස බලන අතර ය. ඔහු තවත් ගමන ඉක්මන් කලේ ය. දුශාන්ගේ සවන අසලට යමෙකුගේ හුස්ම වදිනු ඔහුට දැනුණි. රිදුම් දෙන දෙපා ඔහුට දැන් වාරු නැත. ඔහු පොළොව මත ඇද වැටුණි.

ඇසිපිය වසාගත් දුශාන් වෙව්ලන දෙඅත් එකට එකතු කළේ දෙවියන්ට ස්තෝත්‍රයක් උච්චාරණය කිරීමටය. බිත්තියේ කෙළවරට වන්නට හිඳගෙන ඔහු වකුටු වන්නට විය.

" අනේ දෙවියනේ යක්...යක්...යක්ෂයාගේ...දු.. දුෂ්ටකම්වලට අසු නොවන ලෙස අපට පිහිට වුව මැනවි. " දුශාන් බියෙන් යදින්නට විය.

වෙව්ලන ස්වරයෙන් නැවත ඔහු දෙවියන්ට කන්නලව් කරන්නට විය. ඔහු තදින් ඇස් වසා ගත්තේය. නැවත කිහිප වතාවක් ම කන්නලව් කරන්නට ඇත.

පැතිර තිබූ අන්ධකාරය ද ක්‍රමයෙන් පහ ව යන්නට විය.

තත්වය සෙමින් සන්සුන් වූයේය.

ඒ මේ අත විසිවෙමින් රැව්දුන් භාණ්ඩවල ශබ්දය ද නැවතුණි. තමන් පිටුපස පැමිණෙන්නේ අශුද්ධ ආත්මයක් බව දැන් දුශාන්ට ප්‍රත්‍යක්ෂ ය. සිය අත් ඔහුට බර වැඩි සේ දැනුණි.

ඔහුගේ දෙපා පණ නැත. එහෙත් ඔහුට හිදගැනීමට වේලාවක් ද නැත.

දේව ප්‍රතිමාව වෙත දණ ගසමින් දුශාන් ගමන් කරන්නට විය. ඒ අසල තිබූ යාච්ඤා පොතක් ඔහු සාක්කුවේ දමා ගත්තේය.

කතෝලික ජප මාලය ඔහුගේ ගෙලෙහි පැළඳ ගත්තේ එන ඕනෑ ම අවස්ථාවකට මුහුණ දීමට ය.

බියෙන් තැති ගත් දුශාන් වෙව්ලමින් සිටියේය. මුළුතැන්ගෙය දිශාව බලමින් ඔහු ඉදිරිපස දොර වෙත පැමිණෙන්නට විය. එහි හැඩලයට බර දී ඔහු සිට ගත්තේ අපහසුවෙන් ය.

තම උසට වූ අඳුරු ඡායාවක් ඔහුගේ පිටුපසට වන්නට ඒ මේ අත ගමන් කරනු යාන්තමට ඇස් කොනෙන් මෙන් දුශාන් දුටුවේය.

"දෙවියනේ මොනාද මේ වෙන්නේ" ඒ ඔහුගේ අවසාන වචන පෙළ ය.

" දුශාන් ......දුශාන් ......දුශාන්." ඔහුට යමෙකු කතා කළේය.

එකවර දොරගුළු විවෘත කළ ඔහුට ඉදිරියෙන් යමෙකු දශර්නය වූයේ ය.

කම්මුල සෙලවුණි. ජලය ද ඒ සමග මුහුණේ දැවටෙන්නට විය. දුශාන් බිම වැතිරී සිටියේය. ඔහු බොඳ වූ රූප අතරින් පියවි සිහියට ක්‍රමයෙන් ළඟා විය.

" බුදු අම්මෝ" දුශාන් බිය වී කෑමොර දුන්නේය.

ඔහු නැවතත් බෙරිහන් දෙන්නට වූයේය. ඔහු අත් දෙකෙන් සිය දෑස් වසගත්තේය.

"දූශාන් .....දූශාන් ..... මේ මම......දූශාන් ..... ඇස් අරින්නකෝ...." ආගන්තුකයාගේ කටහඬත් සමග වෙව්ලමින් සිටි දූශාන් සෙමින් ඒ දෙස බැලූවේය.

එහි සිටියේ දූශාන් හොඳින් දන්නා හඳුනන අයෙකි. ඒ අන් කිසිවෙකු නොව නපුරු අක්කා හෙවත් චතූ අක්කාය. යම් වැදගත් ගමනකට සහභාගී වන්නාක් මෙන් ඇය සිටියේ මනා ව හැඳ පැළඳගෙන ය. එය සුදු ඇඳුමකි.

" අනේ අක්කේ මාව මේ ගෙදරින් පුළුවන් තරම් ඉක්මනට එළියට ගෙනියන්න... මට ගොඩක් බයයි.... අනේ මට බෑ ඉන්න...." දූශාන් බියෙන් කීවේය.

ඔහු ඇය ව දෙඅතින් බදාගන්නට විය.

දූශාන්ගේ ගෙලෙහි පැළැ ඳ සිටි ජප මාලය දෙස බැලූ ඈ ඔහුගේ හිස අත ගෑම එකවර ම නැවැත්වීය. ඇය හිස අතගෑවේ දකුණතිනි. එහෙත් චතූ වමත් කාරිනියක බව ඔහුට හොඳින් මතක ය. ඔහුගේ ඇස් නිලංකාර වීමට ආසන්නය. හුස්ම ද වැටෙන්නේ නැති ගානය.

"පොඩ්ඩක් ඉන්නකො මල්ලි බය නැතුව........මම ආවේ ඔයා පල්ලි යනවද කියලා බලන්න.... කමක් නෑ මට මොකද වුණේ කියන්නකො." චතූ ඉතාමත් සන්සුන් ලෙස විමසීය.

" අනේ අක්කේ... අපි මෙතනින් වෙන කොහෙට හරි ගිහිල්ලා කතා කරමු. ... මට ගොඩක් බයයි." දූශාන් කීවේ මහත් තැතිගැන්මෙනි.

දුශාන්ගේ දෑසින් කඳුළු කැට කම්මුල් පුරා වැගිරෙන්නට වූයේය.

"ඔයා ඔතන ම ඉන්න... මම ඔයාට ඔය බැනියම උඩින් දාගන්න කමිසයක් ගේන්නම්."

"අනේ අක්කේ... ඔයා මාව තනිකරලා දාලා මෙතැනින් කොහෙවත් යන්න එපා. මම බයයි." පැවසූ දුශාන් බිරාන්ත ව සිටියේය.

එහෙත් ඒ වන විට ද ඉක්මන් වූ ඇය නිවස තුළට ගොස් හමාර ය.

“ අක්කා ගෙදර ඇතුළට ගියාට මගේ අල්මාරිය හොයාගන්නේ කොහොමද" සිතූ දුශාන් සිටියේ විමතියෙනි.

ඇය නිවස තුළට ගොස් කමිසයක් තෝරාගෙන එන අතරතුර දී වේදනාව අතරින් දණ ගා දුශාන් ගේට්ටුව වෙත පැමිණෙන්නට විය.

" අහ්හ්.....මල්ලි මොකද මේ උදේ පාන්දර ම බඩ ගාන්නේ....... යුද්දෙට යන්න බඩගාන්න පුරුදු වෙනවද ඔයා අහ්හ්......" එම අහඹු පැමිණීම දුශාන් කිසිසේත් ම බලාපොරොත්තු නොවීය.

සිය පියාණන්ගේ මෝටර් රථය පිටවීමත් සමග ම ගේට්ටුව විවෘත ව තිබුණි. එහි පිටත සිටගෙන සිටියේ චතු අක්කාය.

"අ....ක්කා... අක්කා..... කො....කොහොමද ගෙදර ඇතුළට ගිහිල්ලා, ආයෙත් මේ පාරේ ගේට්ටුවෙන් ඇතුළට එන්නේ." පැවසූ දුශාන් චතුගේ දෑස් දෙස බැලුවේය.

අන්දමන්ද වූ දුශාන්ගේ ඇඟ කිළිපොළා යන්නට විය. ඔහුගේ මුලු ශරීරය ම ගැහෙන්නට විය.

"මම ආවේ ඔයා පල්ලි යනවද කියල බලන්න....... කාලෙකට පස්සේ මටත් පල්ලි යන්න හිතුණා." ඇය විමසුවේ මහත් උනන්දුවෙනි.

ඇය දුශාන් හට සිට ගැනීමට අත දුනි. ඇය තුළ වූයේ සතුටකි. එය ඇයගේ මුහුණින් පෙනෙන්නට විය. වමත් කාරියක වූ ඇය පැළැඳ සිටියේ මින් පෙර දිනක දී ඔහු දුටු සකුනි ආකෂර්ාගේ ඔරලෝසුව ය.

දුශාන්ට කැගැස්සිණි. ඔහු ඇයට වාරු දී සිට ගත්තේය. දුශාන් පාරට පිවිසියේ කමිසයක් ද හරිහැටි නොමැතිවය.

ඇය පැමිණ තිබුණේ තවත් යෙහෙළියක් සමගින් ය. චතු අක්කා දකුණතින් දුශාන් බදා අනෙක් අතින් ඇයගේ යෙහෙළියට සංඥා කළාය. ඊළඟ මොහොතේ ඔවුන් අසලට පැමිණියේ වොක්ස් වැගන් වගර්යේ කහ පැහැති රථයක් ය.

චතු අක්කාගේ යෙහෙළිය ඉදිරිපස අසුන නවා දුශාන් හට පිටුපස අසුනට පිවිසීමට උදව් කළාය. ඒ අතර චතු අක්කා ද ඔහු ව ප්‍රවේශමෙන් අල්ලාගෙන සිටියාය.

" කරුණාකරලා මට කියනවද මෙතන මොකද වෙන්නේ කියලා." චතු අක්කාගේ යෙහෙළිය විමසුවාය.

" අනේ අක්කේ... අපි මෙතනින් යමු....පින් සිද්දවෙයි.." මෙවර දුශාන්ගේ ශබ්දය ඒ සියල්ලන්ට වඩා මඳක් වැඩි වූයේය.

"අපි දැන් පල්ලි යන්න නේද ආවේ. දැන් අපි මේ කොහෙද යන්නේ." සියල්ල පසෙක ලූ ඇ චතු අක්කාගෙන් විමසීය.

"ඔහොම ඉස්සරහට යමු මම කියන්නම්." අනතුරක ඉව වැටුණු චතූ පැවසීය.

රථය ක්‍රමයෙන් ඉදිරියට ඇදෙන්නට විය. දිගු සුසුමක් හෙලූ දුශාන් පිටුපස අසුනට බර දුන්නේය.

"මල්ලි සන්සුන් වෙන්න." පැවසූ චතු අක්කා වතුර බෝතලයක් දුශාන් අතට පත් කළාය.

රථයේ පිටුපස වුව ද එතරම් තැකීමක් නොකළ දුශාන් වතුර ටිකක් අතට ගත්තේය. මුහුණ පිස දා ගත් ඔහු කටෙහි වතුර දමා සෝදාගෙන එය ගිලගත්තේ රථයේ වීදුරු වසා තිබූ බැවින්ය.

"දැන් කියන්නකෝ...මල්ලි......මොකද උණේ කියලා..." චතූ ඇසුවේ සියල්ල දැන ගැනීමට ඇති වුවමනාවෙන් ය.

"අනේ මන්දා අක්කේ....." දුශාන් පැවසීය.

චතූ දුශාන් දෙස බලා සිටියාය

"මේ ළඟදි ඉඳන් මට අමුතු අමුතු දේවල් වෙනවා...අද්භූත දේවල් ගොඩක් පේනවා අක්කේ... මේ ඔක්කොම වෙන්න ගත්තේ එදා කනත්ත ගාවින් ආවට පස්සේ." දුශාන් එක හුස්මට සියල්ල පැවසුවේය.

ඔහු පිළිතුරක් ලැබෙන තෙක් බලා සිටියේ නොඉවසිල්ලෙනි.

" කනත්ත ළඟින්." ඒ චතු අක්කාගේ යෙහෙළියයි.

"ඔව් අක්කේ....එදා රෑ වුණ නිසා මම කනත්ත ළඟින් එන්න ගොඩක් බයෙන් හිටියේ..... ඒත් මම නොහිතපු වෙලාවක එතන හිටපු කෙනෙක් මට හම්බ වුණා.'' දුශාන් පැවසීය.

"කාවද හම්බුණේ." චතූ අක්කා පිළිතුරු දුන්නේ රථයෙහි මැද වූ පසු කණ්ණාඩියෙන් දුශාන්ගේ මුහුණ දෙස බලන අතරය.

"එයා අක්කා කෙනෙක්.... එයා රත්තරන් පාට ලස්සන ඔරලෝසුවක් දාගෙන හිටියා......හරියට ම ඔය චතූ අක්කා දාගෙන ඉන්නවා වගේ ම එකක්.... අනික එයා කිව්වා අපේ ගෙවල් ළඟ ම තමයි ඉන්නේ කියලත්. ....ඒත් මම මීට කලින් එයා ව දැකලා නෑ...කොහොම හරි එදා ඉඳලා තමයි මේ ඔක්කොම වෙන්න පටන් ගත්තේ...." දුශාන් ඉන් නොනැවතුණි.

චතූ සිය අත් ඔරලෝසුව පිරිමදින්නට විය.

"ඔයා ඔක්කොම අහගෙන එයාගේ නමවත් අහගත්තේ නැද්ද.." චතූ අක්කාගේ යෙහෙළිය විමසීය.

" එයා සකුනි කියලා කෙනෙක්.. " දුශාන් සිය මතකය ආවජර්නය කරන්නට විය.

"ඔව් සකුනි තමයි නම"

ඇයගේ ඇස් ලොකු වන බව දුශාන් දුටුවේ ඉදිරිපස වූ කණ්නාඩියෙනි. ඉදිරියට ඇදී යන රථය එකවර තිරිංග යෙදුනි. දුශාන්ව ඉදිරිපසට විසි වී සිය දණහිස ද එහි අසුනේ තදින් වැදුණි.

"දෙවියන්ට ඔප්පු වෙච්චාවේ...... ඔයා වැරදිලාවත් කියන්නේ සකුනි ආකෂර්ා ලියනගේ ගැන නෙමෙයි නේද?....

" රථය නැවැත්වූ චතූ අක්කාගේ යෙහෙළිය පිළිතුරක් බලාපොරොත්තුවෙන් දුශාන් දෙස හැරී බැලීය.

" ඔව් අක්කේ...... මට මතක විදිහට එයාගේ නම සකුනි ආකෂර්‍ා තමයි." දුශාන් කීවේ තරමක් සැකයකිනි.

ඇයගේ යෙහෙළිය සිය හිසෙහි අත ගසාගන්නට විය. එකවර ඉකිගසා දොර විවර කළේ ඉන්පසු ව ය. මෝටර් රථයේ ඉදිරියට ගොස් ඇ තම හිස බදා ගත්තේ විදුලි වේගයෙනි. දණහිස් වාරු නොවූ ඇ බිම ඉන්දවූ නි.

"හරි මට දැන් ඔක්කොම පැහැදිලියි...... මම දන්නවා මේකට මොකක්ද කරන්න ඕනේ කියලා."පැවසූ චතූ අක්කා ද රථයෙන් පිටතට පය තැබුවාය.

සිදුවන්නේ කුමක්ද?.සිදුවීමට යන්නේ කුමක්ද? දුශාන්ට තිබුණේ අහස පොළව ගැටලන කුතුහලයකි. ඔහුට ඇ වෙත යෑමේ අවශ්‍යතාවක් මතු වූයේය.

රථයේ ඉදිරිපස අසුන නැවූ දුශාන් එය සෙමින් අල්ලා ගත්තේය. අසුනෙන් රූටා ආ ඔහු මෝටර් රථයේ දොර හැරගත්තේය. දොරට ද බොනට් එකට ද වාරු දුන් දුශාන් ඔවුන් සිටිය ස්ථානය වෙතට පිවිසියේ ය.

චතූ අක්කාගේ යෙහෙළිය රථයට පිට දී බිම හිඳගෙන සිටියාය. දණහිස් මත අත් තබා දෑතින් මුව වසාගෙන ඇ ඉකි ගසන්නට විය. චතූ අක්කා ඇයගේ හිස අතගෑවේ සැනසීමට ය. චතූ අක්කා ද ඉදිරිපස බලා සිටියේ දඩයමට සූදානම් වී සිටින සිංහයකු පරිද්දෙනි.

අවු රශ්මිය සම පිළිස්සෙන සේ කාශ්ඨක ය. එහෙත් දුශාන්ගේ අත පය සීතලෙන් මෙන් වෙවුලන්නට විය. රිදෙන

දෙපා දැන් ඔහුට වාරු නැත. ඔහු බොනට් එකට සිය සම්පූර්ණ බර දෙන්නට විය.

"ඇයි අක්කේ අඬන්නේ... අනේ...වෙච්ච දේ කියන්නකෝ..." ඔහු පැවසූයේ තරමක් තැතිගත් ස්වරූපයෙනි.

චතූ අක්කා දූශාන් ව නැවැත්වීමට උත්සාහ දැරීය. ඊට සාපේක්ෂ ව යෙහෙළියගේ හැඩීමේ වේගය ද මඳක් වැඩි විය. දැන් දූශාන්ගේ හෘද ස්පන්දන වේගය ඊට තරමක් වැඩිය. පිළිතුරක් අපේක්ෂාවෙන් ඇය දෙස බලා සිටින ඇස් පියන් පවා එක දිගට ගැහෙන්නට විය. දූශාන් සිටියේ ගොළු වන සේ බිරාන්ත ව ය.

ඇය ඔහු දෙසට හිස හැරවීය.

"ඔය සකුනි ආකාෂර්‍ා මැරිලා දැනට අවුරුදු හතරක් වෙනවා මල්ලී........." දූශාන්ගේ අඬෝවැඩියාව ඉවසාගත නොහැකි තැන ඇ පැවසීය.

එවැනි පිළිතුරක් දූශාන් කිසිසේත් ම බලාපොරොත්තු නොවූණි. ඔහුගේ දෙසවන් තුළ අකුණු සැර වැදී හෙන පුපුරන්නාක් මෙන් දැනුණි. යළි යළිත් එය ඇසිණි.

ආකෂර්‍ා මැරිලා අවුරුදු හතරක් වෙනවා මල්ලි...... අවුරුදු හතරක්..... අවුරුදු හතරක් වෙනවා මල්ලි........ "

දෝංකාර දුණි.

මෙතෙක් හඬමින් සියල්ල සිතේ සිරකරගෙන සිටි ඇයගේ යෙහෙළිය සිය පළමු අඬහැරය ඉකි ගසමින් එසේ දියත් කළාය.

" එතකොට... එතකොට.. ... එතකොට.. මම කතා කර කර ආවේ අවුරුදු හතරකට ඉස්සෙල්ලා මැරිච්ච කෙනෙක් එක්ක."

ඔහු තමන්ට ම කියාගත්තේය. දූශාන් ද ඇය අසලින් හිඳ ගත්තේ නැත. කකුල් අඩපණ වී බිම ඇදවැටුණේය. ඔහුගේ මුහුණ මෙන්ම මුළු ගත ම දහඩියෙන් තෙත් වී තිබූ අතර දෙනෙතෙහි රැඳී තිබුණේ අතිශය භීතියට පත් වූ බැල්මකි.

"මේ... ඔක්කො ම එක සෙල්ලමක් නිසා. එකම එක වැරැද්දක් නිසා." කඳුළු අතරින් දූශාන් දෙස බැලූ ඇය නැවත කතාව ආරම්භ කළේ එවිට ය.

"අපි තුන්දෙනා පොඩි කාලේ ඉඳල ම යාළුවෝ... තේරෙන කාලේ ඉඳන් අපි තුන්දෙනා ම කැවේ බිව්වේ හැමදේම කළේ එකට." හඬමින් ඇ පැවසූ ඇතැම් වදන් පැහැදිලි නොවීය.

දූශාන් ඇයගේ මුහුණ දෙස විමතියෙන් බලා සිටින්නට විය.

"අපි තුන් දෙනාට ගොඩක් කතා හදපු අය හිටියා........ කොටින් ම කියනවා නම්... අපේ ස්කීම් එකේ ගොඩක් අය අපිත් එක්ක තරහින් හිටියේ." එක දිගට ම කතාවේ නිරත වූ ඇය හති හැරියාය.

"එක දවසක් අපි ආවා ස්කීම් එකේ නෙට්බෝල් කෝට්ර් එකට.

මුහුණට වැටී තිබූ ලොකු කෙහෙරැළි තම ඇඟිලි තුඩුවලින් කනේ දෙපසට වන සේ ඈ රඳවා ගත්තාය.

"එතකොට වෙලාව පහහාමාරට විතර ඇති. වැහිපොදත් ටිකින් ටික වැඩි වුණා. මට අද වගේ මතකයි.... හවස් වෙලා ආපු වැහි බීරම නිසා මුළු අහස වගේ ම පරිසරයත් අඳුරුයි.........එතැන හිටියා විස්සකට වඩා වැඩි කෙල්ලෝ කට්ටියක්. අපි වෙනදට එතැනට ගියේ කතා කරකර ඉන්න........ ඒත් එදා අපිට වචනයක්වත් කතා කරන්න කියන්න හම්බුනේ නැහැ." බිම හිඳගෙන තම දණහිස් මත වැළමිට තබා ගනිමින් හිස තම දෙඅත්වලින් බදාගෙන සිටි යෙහෙළිය නැවතත් හිස එසවීය.

"වැස්ස එක පාරට ම ගොඩක් තද කරා. අපි හෙවණක් තියෙන තැනකට දුවගෙන ගියා. සෙල්ලම් කර කර හිටපු ඒගොල්ලන්ගෙන් කෙනෙක් වැරදිලා ඇවිත් අපේ ඇඟේ වැදුණා. ඒත් එක්කම එයාලා සකූ එක්ක වුණ බහින්බස්වීම ටිකක් දුර දිග ගියා. අනිත් අය අපිට ගහන්න පටන් ගත්තා. ඒක බෙරන්ඩ ගිය වතූටත් අන්තිමට ගුටි කන්න වුණා. වතූ හොඳට ම ගුටි කෑවා..... " සිත තුළ සිරකරගත් ශෝකය සුසුමකින් පිට වන්නට විය.

ඇස් වසාගත් ඈ නැවත කතාව ආරම්භ කළාය.

"වතූ ව ගෙදර ගෙනියන්න සුදුසු මට්ටමක් තිබ්බේ නැහැ....... අනේ ඒක එයා කලේ නැත්නම්... අදටත් එයා ජීවතුන් අතර නෙහ්... " පවසා කඳුළු පිස දැමූ ඇය නැවත හඬන්නට විය.

දුශාන්ට කිසිවක් අවබෝධ නොවුණි. එහෙත් ඔහු කතාව දෙස සාවදාන ව ඇහුම්කන් දුණි.

" එතන හිටියා මන්ත්‍රීතුමෙක්ගේ දුවෙක්. එයා වතූ එක්ක කොහොමත් තරහින් හිටපු කෙනෙක්. එයත් වතූට ගහන්න ඒක හොඳ අවස්ථාවක් කරගත්තා. වතූට සිහිය

නැතිවෙනකල් ගහලා ඉවරවෙලා කිව්වා 'මේකට බැරිවෙලා හරි එයාගේ නම ගැව්ලා හරි තිබ්බොත් අපි ඔක්කොටම මැරෙන්න තමයි වෙන්නේ. කියලා;

මමයි සකුයි එකතු වෙලා චතූ ව මේ කාර් එකේම තමයි දාගෙන ආවේ........ෆාමසි එකට ගිහිල්ලා තුවාලවලටයි තැල්මවල්වලටයි බෙහෙත් ගත්ත අපිට චතූට බෙහෙත් කරන්න තැනක් ඕන වුණා.

කාටත් නොපෙනෙන්න....නොදැනෙන්න... එයාව ගෙනියන්න පුළුවන් තැනක්... එහෙම තැනක් හොයාගෙන යද්දි තමයි අපිට ඒ පරණ සීල් තියපු බාර් එක හම්බ උනේ. කලින් මිනිස්සු බීලා බීලා ජීවිතය නැති කරගන්න හදපු තැනක අපි මනුස්සයෙක්ට ජීවිතයක් දෙන්න උත්සහ කළා,

චතූ ජීවිතයත් මරණයත් අතර පොරබැදුවා. අපිට පුළුවන් වෙනවා පියවි සිහියට ගන්න.... ඒත් පැය හතරක වගේ මහන්සියකින් පස්සේ, චතූට කතා කරන්නවත් ඇවිද ගන්නවත් බැරිවෙනවා. මගෙන් කාර් එකේ යතුර ඉල්ලගෙන බෙහෙත් ගේන්න සකූ පිටත් වෙනවා. ෆාමසි එකට ගියපු සකූ ආපහු එන්නේ දාම් බෝඩර් එකකුයි මාකර් එකකුයි අරගෙන."

පැවසූ ඇය හුන් තැනින් නැගිටින්නට විය. කාරය ඉදිරිපස ඩිකිය හැර ඇය සෙමින් එහි හිඳ ගත්තාය.

"ඒක දාම් බෝඩර් එකක්........"

මට තේරුනේ නෑ අක්කේ " වික්ෂිප්ත ව සිටි දුශාන් පැවසීය.

"ඔව්.......දාම් බෝඩර් එකක්..... ඒක අතට ගත්ත එයා ඒකේ අනිත් පැත්ත හැරෙව්වා......එකේ වම් පැත්තට වෙන්න

උඩ ඉඳන් පල්ලෙහාට ඉංග්‍රීසි හෝඩියේ ඒ අකුරේ ඉඳන් ඉසෙඩ් අකුර වෙනකල් ලිව්වා. මම හැම වෙලාවෙ ම ඇහැව්වෙත් සකූගෙන් ඔයා මේ මොනාද කරන්නෙ කියලා. එත් එයා මට උත්තරයක් දුන්නේ නැහැ." ඇ පැවසුයේ ඉකිබිඳිමින් ය.

චතූ සිය යහළුවාගේ උරහිස මත අත තැබීය.

"මම කියන්නම් ඉතුරු ටික." චතූ පැවසීය.

ඉන්පසු චතු අක්කා සිංහ දේනුවක මෙන් ඇගේ කටහඬ අවදි කළාය.

"මට ඒ වෙලාවේ කතා කරන්න බැරි උනාට මම වෙන හැමදේම බලාගෙන හිටියේ. සකු පොඩිකාලේ ඉඳලාම ගොඩක් දඩබ්බර කෙනෙක්. එයා කිව්වොත් දෙයක් කිව්වම තමයි. දාම් බෝඩර් එකේ කොටු නැති පැත්තේ එහෙම ලිව්වා. පස්සේ බෝඩර් එකේ දකුණු පැත්තේ පල්ලෙහා ඉඳන් උඩට වෙන්න ආයෙත්

" ඒ " අකුරේ ඉඳන් " ඉසෙඩ් " අකුර වෙනකන් ලිව්වා. ඒ බෝඩර් එකේ හරි මැද්දට වෙන්න ඉංග්‍රීසියෙන් "යර්ස්, නෝ" කියලා දෙපැත්තට වෙන්න ලිව්වා. බිංදුව ඉඳන් නවයට වෙනකම් ඉලක්කම් පිළිවෙළට ලිව්වේ ඊට ටිකක් යටට වෙන්න." පැවසූ චතූ සිය බර වූ නාසය අල්ලේ පිට පැත්තෙන් පිස දැමුවාය.

"එහෙම ලියන එයාගේ මාකර් එක ඉවර උනා, අන්තිම ඉලක්කම් හතර ලියන්න ඉස්සෙල්ලා. එයා මට බෙහෙත් දාන්න ගෙනාපු කතුරෙන් එයාගෙ ම ඇඟිල්ලට ඇන්නා. ඒ එන ලේවලින් ඉතුරු ඉලක්කම් හතර සම්පූණර් කළා."

මෙතෙක් ගාම්භීර චරිතයකට පණ පෙවූ චතූ අක්කාගේ දෑස කඳුළින් පිරී ඇහිදාර මතින් කඳුළු බිඳු එකිනෙක ගලා යන්නට විය.

"මල්ෂාගෙන් එයා ව විශ්වාස ද කියලා සකු ඇහැව්වා. ඒ කාසිය උඩින් ඇඟිල්ල තියන්න කිව්වා. මල්ෂාට කිව්වා කිසීම හේතුවක් මත ඒ කාසිය අත්හරින්න එපා කියලත්...... සකූ එහෙම කියපු නිසා මල්ෂා සකූ කියන දේ ඇරෙන්න වෙන මොනවත් කලේ නෑ."

කතාවට බාධා එල්ල විය. චතූ අක්කා හට සිය වේදනාව පාලනය කරගත නොහැකිය. ඇය සිය තෙතබරිත ඇසිපිය තදින් වසාගත්තාය. කඳුළු බිඳු නොනවත්වා ඇද හැලෙන්නට විය.

"මම...මම.... කාසිය උඩට ඇඟිල්ල තියද්දි සකු එයාගේ තුවාල වුණු ඇඟිල්ල කාසිය උඩින් තිබ්බා" මල්ෂා නැවත කතාවට ප්‍රවිශ්ඨ විය.

"එතකොට වෙලාව හරියටම එකොළහමාර වුණා විතරයි. කාසියට අත තියෙන කොට ම බල්ලෝ උඩු බුරන්න පටන් ගත්තා... හැම පැත්තෙන් ම . චතූ කෙදිරි ගාන එකත් ටිකක් වැඩි උණා... ඒත් එක්කම,

ඒක එයා ගොඩක් හයියෙන් කිව්වා. 'අප අවට සැරිසරන වේදබ්භ ආත්මයක් වේ නම් මේ කාසියට පැමිණෙන්න.' තව තවත් හයියෙන් කිව්වා... අපිට සංඥාවක් දෙන්න. එයා අණ කළා, අපි හිටපු දොරවල් ජනෙල් වහලා තිබ්බ කාමරය ඇතුළෙන් ඇඟේ හිරිගඩු පිපෙන විදිහට සීතල සුළඟක් හමාගෙන ගියේ මේත් එක්කමයි... එක මහා මූසල හුලඟක්. නහයට දරාගන්න බැරි අමුතු පිළි ගඳක් ආවා. ඒ එක්ක ම

කාමරය ඇතුළේ තිබ්බ වීදුරු කණ්ණාඩි එකින් එක සුදුපාට වුණා. ඔක්කොම එකපාරට ම දෙදරන්න පටන් ගත්තා."

විස්තර කිරීමේ දී ඇ තම දෑස් ලොකු කරගත්තාය මල්ෂා එක දිගට ම කියාගෙන යන්නට දැඩි උත්සාහ දැරීය. එහෙත් වචන පැටලි නි.

"අන්න එතකොට තමයි....අන්න.... අන්න එතකොට තමයි...."

පැවසූ මල්ෂා සිය දෑස් ලොකු කරගෙන සිටියා ය. ඒ යක්ෂයෙක් දුටු අයෙකු මෙනි.

"ඔව් අක්කේ එතකොට මොකද උනේ...." ඇය දෙස ඇසිපිය නොහෙලා බලාසිටි දූශාන් ඇසුවේ කුතුහලයෙනි.

“අපි අපේ ඇඟිල්ල තියාගෙන හිටපු කාසිය බෝඩ්ඒ එකේ එහේ මෙහේ යන්න පටන් ගත්තා... සකූගේ පළවෙනි ප්‍රශ්නය වුණේ අපි අතර වේදබ්භ ආත්මයක් ඉන්නවද කියන එක" මල්ෂා පැවසීය.

"අපි මේවා පාරේ කතා කර කර ඉන්නේ නැතුව වෙන තැනකට ගිහිල්ලා කතා කරමුද...... මොකද පාරේ යන ඔක්කොම අපි දිහා බලාගෙන ඉන්නවා." චතූ කතාවට බාධා වන සේ පැවසීය.

මෙවර චතූ අක්කා දූශාන්ගේ හිඳගැනීමේ පහසුව තකා පිටුපස අසුන වෙත ගමන් කළාය. දොරට වාරු දුන් දූශාන් රියදුරු අසුනින් එහා පැත්තෙන් වූ ඉදිරිපස ආසනයේ හිඳ ගත්තේය.

කුමක් කරම්ද, කොහේ යම්ද, කිසි අවබෝධයක් නොමැති ව ගමන ආරම්භ කළහ. ඔවුහු මඳ දුරක් ඉදිරියට

ධාවනය කළහ. එහෙත් බිය වූ දුශාන්ගේ හැඟීම් අවධි වන්නට විය.

"චතූ අපි දැන් මේ යන්නේ කොහෙද" වාහනය පදවමින් සිටි මල්ෂා යාන්තමින් වචන කිහිපයක් අමුණා ගත්තාය.

"අපේ හැම දෙයක් ම පටන් ගත්ත තැනට යමු.....මොකද දැන් අපිට පල්ලි යන්න විදිහකුත් නැහැනේ." චතූ අක්කා ඊට පිළිතුරු දුනි.

යම්තාක් දුර ගමන් කරන තෙක් සියල්ල ම නිශ්ශබ්ද වී සන්සුන් වූහ.

"අනේ දෙවියනේ... එදා මාත් එක්ක හිටපු සකුණි අක්කා මීට අවුරුදු හතරකට ඉස්සෙල්ල මැරිච්ච කෙනෙක්ලු... හැමෝම කතාවෙන්නේ මැරුණ කෙනෙක් ගැන. දෙවියනේ... වෙන්න යන්නේ මොනවද... මේවා කොතනින් ඉවර වෙයිද කියලා මම දන්නෙ නැහැ.... ඒ කෙසේ වුවත් සියලු නපුරෙන් මා ආරක්ෂා කළ මැනවී........" නොසන්සුන් දුශාන් සිතින් ප්‍රාථර්නා කළේය.

ඉහළට ගත් හුස්ම පහළට හෙළන්නට වූයේය. ඔහු පැති ෂටරයේ වීදුරුවෙන් ඉදිරිපස බලා සිටියේය. හුස්ම වැදීමත් සමග ෂටරයේ වීදුරුව මීදුම මෙන් බැඳෙන අතර ඔහු එය අත්ලේ පිටපැත්තෙන් පිස දැමුවේය.

"චතු අර බලන්න." දබර ඇඟිල්ල ඉදිරියට දිගුකර මල්ෂා යමක් පෙන්වීමට තැත් කලේ ඒ සමගය.

"මේ මොනවද......මේ වෙන්න යන්නේ....." පැවසූ චතූ අක්කා ද ඒ දෙස බලන්නට වූයේ විමතියෙනි.

ඉදිරිපස වින්ඩ්ස්ක්‍රීන් වීදුරුවෙන් සියලු දෙනා ඉදිරිය බැලුහ. සියල්ලන්ට ම සිය ජීවිත පිළිබඳ වූයේ බියකි. ධාවනය වන රථය නැවැත්වීමට මල්ෂා තීරණය කළාය. ඔවුන් සම්පූර්ණ අවධානය එයට යෙදවීය.

එය තාර පාරේ හරි මැද්ද ය. සුදු පැහැයෙන් සලකුණු කරන ලද කඩ ඉරකි. එතැනින් දුමක් හටගෙන තිබුණි. එම දුම ක්‍රමයෙන් පැතිර යන්නට විය.

තද කළු දුමාරයක් දක්වා ඉක්මනින් එය වැඩි වර්ධනය විය. එය පාර වසාගන්නට විය.

" මල්ෂා ටිකක් ඉන්න." චතු කෑගැසීය.

එය කුමක්ද. මල්ෂා රථයේ දොරහැර එළියට පය තබා අවසානය. මල්ෂා හට කිසිවක් නැසුණි. සයිරන් නලා හඬක් ඔවුනට ඇසුණි. දොර ද වැසී ගියේය.

"අනේ මල්ෂා..."

කන් බිහිරිවන මට්ටමට සයිරන් නළාව නාද විය. එය ප්‍රදේශය පුරා පැතිර ගියේය. වීදුරුවෙන් පිටතට කිසිවක් ඔවුනට නොපෙනුණි. කන්බෙර පුපුරන මට්ටමට වූ සයිරන් හඬ ඇසෙන්නේ තවත් කිට්ටුවෙනි. එය නැවතත් හඬ නැඟුයේ පිටුපසින් ය.

එය එක දිගට ම නාද විය.

දුමාරය අතරින් සයිරන් හඬ නගා පැමිණි කන්ටේනර් රථයකි. එය පාලනයෙන් තොර වී පාර පුරා ඇදී යන්නට පටන්ගෙන තිබුණි. සයිරන් නළාව ද නොනවත්වා එක දිගට ම නාද වුණි.

කන්ටේනර් රථයේ මුහුණ පාරෙහි දකුණු පැත්තෙන් ධාවනය වුණි. වැටවල් කඩාගෙන එය තව තවත් ඉදිරියට ම ධාවනය විය.

එය ළඟා වන්නේ ඔවුන්ගේ රථය සිටින දිශාවට ය. රථය තුළ වූයේ මර ලතෝනියක් පමණකි. නැවත වරක් සයිරන් නලාව නාද වන්නට විය. ඒ රථය සමීපයෙන් ම ය. සිතන්නටවත් වේලාවක් නොමැත.

ලතෝනි මැද්දෙන් රියදුරු අසුනේ දොර විවර ය. ඇදී එන කන්ටේනරය දොරට වදින්නට ආසන්නය. එන්ජිම පණ ගැන් වූ මල්ෂා රථය පිටුපසට ධාවනය කරන්නට වූ යේ බෙරිහන් දෙමිනි.

නැවත ඇලවුණු ටේලරය ඔවුන්ගේ රථයේ බඳට ආසන්නය. දිගු වූ එය ඇදී එන්නට වූයේ සීඝ්‍රයෙනි.

එය බොහෝ ඝෝෂාකාරී ය. ගුරු පැහැති දූහුවිල්ලක් දැන් ඔවුන් වට කරගෙන ය. යකඩ කුට්ටි තැලෙන ඇඹරෙන ශබ්දය පැහැදිලි ය. ඔවුනට එය හොඳින් ඇසේ ය.

රථය තුළ වූ සියල්ලෝ ම මරු විකල්ලෙන් ලතෝනි නැගුවේය. කන්ටේනරයේ ටේලරය ඔවුන්ගේ කාරය ඉදිරියට ළං වන්නට විය.

දැන් එය ගැටෙන නොගැටෙන සේ ආසන්න ය. එය රථයෙහි දකුණු පස පැති කණ්ණාඩියේ ද ෂටරයේ ද වැදුණි. එහි ටේලරය ලිස්සා එන්නේ ඔවුන්ගේ දිශාවට ය. මල්ෂා රථය නැවතත් පිටුපසට ධාවනය කෙරුණි. එහි වීදුරු දෙක සම්පූර්ණයෙන් ම කුඩු වී තිබුණි.

මල්ෂා සැලකිව යුතු දුරක් ආවේ පිටුපසට ය.

"අම්මෝ… අම්මෝ… ඇති යන්තම්. අපි තවමත් ජීවතුන් අතර දෙවියනේ.... දෙවියනේ ...දෙවියනේ….. " බිරාන්ත ව සිටි මල්ෂා පැවසීය.

ඔවුන්ගේ ජීවිත ද ආරක්ෂා වූයේ පෙර පිනකට මෙන් ය.

සුක්කානම සිය දෑතින් මිරිකා අල්ලා ගත් මල්ෂා අනෙක් අතින් බොහෝ වේලා යන තුරු සිය පපුව අල්ලාගෙන සිටියාය.

"මේ මොනවද වෙන්නේ... අම්මෝ.....ඇති යාන්තම් අපි බේරුණා....." චතු පැවසුයේ සිය නළලේ දහඩිය බිඳු පිසදමන අතර ය.

"චතූ අපි දැන් මොකද කරන්නේ." මල්ෂා පිළිතුරු දුණි.

"වෙන මොනවා කරන්නද… අපි එතනට යමු.... මං හිතන්නේ කවුරුහරි අපිට මොනවා හරි පණිවිඩයක් දෙන්න හදන්නේ. මට ඒක ස්ථිරව ම කියන්න පුළුවන්.

"චතූ මම හිතන්නේ අපිට තව අලුත් ප්‍රශ්නයක් තියෙනවා.... ඉස්සරහින් පාර කැඩිලා…. අපිට මේ පාරේ යන්න වෙන්නෙ නෑ. මොකද කරන්නේ"

"අපිට යන්න වෙන පාරක් ඇත්තේම නැද්ද මල්ෂා" මිනිසුන්ගේ කෑ ගැසීම් හා සෝෂාව මැද්දෙන් චතූ අක්කා ඇයගෙන් විමසීය.

"වෙන කරන්න දෙයක් නෑ…. අපි පහුකරගෙන ආවා එක පාරක්. හැබැයි ඒක මේ පාරට වඩා කිලෝමීටර් ගානක් වැඩියි. එත් මේ තත්වෙත් එක්ක අපිට තියෙන එක ම විසඳුම තමයි ඒක." පැවසූ මල්ෂා රථය පිටුපසට පදවන්නට විය.

"අක්කේ......." දුශාන් කීවේ තරමක් බිඳුණු හඬකිනි.

පිටුපස සිටි චතූ දුශාන් දෙස බැලීය.

"මට වචනයෙන් කියන්න බැරි තරම් බයක් හිතෙනවා අක්කේ......මට ගොඩක් බයයි." දුශාන්ගේ එම වදන් පෙළ අවසාන නොවීය.

සිය දෑස්වලින් කඳුළු කැට ඇද වැටෙන්නට විය.

" ගොඩක් බයයි.... අක්කේ." දුශාන්ගේ කටහඬ කෙඳිරීමකට පමණක් සීමා විය.

"මල්ලී.... මම ඔයත් එක්ක ඉන්න කල් මොනවත් ම ඔයාට වෙන්න දෙන්නෑ... මම ඒක ස්ථිරයෙන් ම පොරොන්දු වෙනවා...." පැවසූ චතූ දුශාන් සැනසීමට උත්සාහ කළාය.

ඔවුන් ගමන් කලේ තරමක් අබලන් වූ මාගර්යක ය. එය වලවල් සෑදී ගල් උඩට මතු වූවකි. ගල් බොරළු මතින් යනවිට රථය දෙදරුම් කෑවේය.

අදාල ස්ථානය වෙත ළංවන විට හෝරාවක පමණ කාලයක් ගත වී තිබුණි.

විශාල සේ ගේට්ටුව කැඩී තිබුණ ස්ථානයකි. එතැනින් මෝටර් රථය ඇතුළු කර එහි තණකොළ බිස්ස අවසානයේ වූ ගරාජය අසලින් නතර කෙරිණි.

දුශාන් තමන් ඉදිරියේ ඇති දැවැන්ත ගොඩනැගිල්ල දෙස බැලුවේ විමතියෙනි. රථයේ දොරට වාරු දී බැසගත් ඔහුට එම ස්ථානය තවත් හොඳින් දැකගත හැකිවිය. රථ නැවැත්වීමේ පහසුකම් සහිත ව ඉදිකර තිබූ අදාල ස්ථානය බැලූ බැල්මට මිනිස් වාසයකින් තොර වූ තෙමහල් ගොඩනැගිල්ලකි. ඉදිරිපස වූ ගරා වැටුණු එහි නාම පුවරුවේ සමහරක් අකුරු ගැල වී තිබුණි.

ගොඩනැගිල්ලට ආලේප කර තිබූ දුඹුරු පැහැති තීන්ත ද ඉරි තැලී, ගැලවී තිබුණි. වහලය ද පැත්තෙන් ඉහළට යාම සඳහා සාදා තිබූ යකඩ පඩිපෙළ ද බොහෝ අබලන් තත්වයේ පැවතුණි.

පුපුරා ඉරිතැලී ඇති විශාල වීදුරු ය. ඒවා මෙය බොහෝ කාලයක් තිස්සේ අතහැර දමා තිබූ ගොඩනැගිල්ලක් බවට තවත් සාක්ෂි එකතු කලේය.

චතූගේ වාරුවෙන් ඔහු මල්ෂා ව අනුගමනය කළේය. තරප්පු පෙළ දිගේ වාරු ගනිමින් කොර ගසමින් දූශාන් ගමන් කරන්නට විය. ඊළඟ මොහොතේ දී මෙම ගරා වැටුණු තැබෑරුමේ කුමක් සිදු වේද. දෙගුණ තෙගුණ වූ භීතියක් ඔහුට දැනුණි.

"තවත් උඩට යන්න ඕනෙද" දූශාන්ට වේදනාව ඉවසාගත නොහැකිය. ඔහු සිය හඬ ඉස්සර කළේය.

ඉහළ මහල වෙත යනතෙක් මල්ෂා ද දූශාන්ට වාරු දෙන්නට වූවාය.

තුන්වන මහල වෙත ඔවුහු පැමිණියහ. දුහුවිලි නොවදින සේ රෙදිපිළිවලින් වසා තිබූ සෝෆාවන් එහි තිබුණි. ඔවුන් පුටුවල ඒ මේ අත හිඳගත්තේ මඳක් ගිමන් හැරීමට ය.

දූශාන් අසල ම වූ මල්ෂාගේ මුහුණ දෙස බලාසිටියේය. ඒ මින් පසු සිදුවන දෙය විමසීමට ය. මල්ෂා ද ඔහු දෙස බලන්නට විය.

"අපි අපේ කතාව කොතනින්ද නතර කළේ මල්ලී" නිශ්ශබ්දතාවය බිඳිමින් මල්ෂා විමසා සිටියේ සිදුවන දේ කුමක් වුව ද එය එතරම් දෙයක් නොවන බව දූශාන්ට හැඟවීමට මෙනි.

"අර සකූ අක්කා අහපු පළවෙනි ප්‍රශ්නයෙන් තමා අපි කතාව නැවැත්තුවේ"

" ආහ්හ්.... හරි මට මතකයි. සකු වේදබ්භ ආත්මයක් ඉන්නවද අහපු ගමන් කාසිය ' යර්ස් ' තැනට ගියා. ඒ කියන්නේ අශුද්ධාත්මයක් ඒ කාසිය මෙහෙයවන්න ගත්තා."

ඇය විස්තර කරන අයුරු ඔහු ඇස් ලොකුකර බලා සිටියේය. දුශාන්ගේ උගුරෙන් කෙළ බිඳක් ගිලෙන්නට විය. එය ජල පිපාසයකට වඩා ඇති වූ භීතිය නිසාවෙනි.

"අපිට පළවෙනියෙන් ම ආරක්ෂා කරගන්න ඕන වුණේ චතූ ව. ඒක නිසා අපි ඇහැව්වා චතූව බේරගන්න විදියක්. කාසිය බෝඩ් එකේ ලියලා තිබ්බ අකුරෙන් අකුරට ගියා. ඇතිල්ලිලා ගිහිල්ලා කිව්වා අපිට කරන්න ඕන දේවල්. හැමදේම හොඳින් වෙන්න පටන් ගත්තා.

අපි දෙන්නා මෙච්චර වෙලා අල්ලගෙන හිටපු කාසිය අත ඇරියා. අපි චතූට සාත්තු සප්පායම් කළා. අපිට චතූ ව නැගිට්ටවලා කතා කරවන්න පුළුවන් වුණා. ඒත් අපිට එක තැනක් වැරදුණා. අපි චතූට බෙහෙත් කරලා ආයෙත් බෝඩ් එක ළඟට අවා. එද්දි ඒ බෝඩ් එකේ ලොකු අඩුවක් අපි දැක්කා." පැවසූ මල්ෂා සිටියේද තැතිගැන්මකිනි.

"අඩුවක්... අඩුවක් කිව්වේ අක්කේ" සාවදාන ව අසා සිටි දුශාන් මල්ෂාගෙන් විමසීය.

"ඔව්... අපි ආයේ එද්දි ඒ බෝඩර් එකේ හය හත අට නමය ඉලක්කම් ටික තිබ්බෙ නෑ. සකූ ලියවෙන්නේ නැති මාකර් එකේ පිටිපස්ස ගැලෙව්වා. එයා ඒකට වතුර දාලා ආයෙත් ලිව්වා. ඊට පස්සේ අපි ඕන ම දේ ඉල්ලුවා." මල්ෂා පැවසීය.

දුශාන් ඇයගේ මුහුණ දෙස බලා සිටියේ කතාව සම්පූර්ණ කිරීමට ආයාචනා කරන්නාක් මෙනි.

"ඊට පස්සේ අපිට මෙහෙම කරපු අයගෙන් පලිය ගන්න කියලා අපි ඒ කාසිය මෙහෙයවපු ආත්මයෙන් ඉල්ලුවා."මල්ෂා පැවසීය.

" ඉතින් ඒ ආත්මය ඔය මන්ත්‍රීගේ දුවගෙන් පලිය ගත්තද" කතාවේ ඉතිරි කොටස දැන ගැනීමට ඉස්පාසුවක් නොවූ දුශාන් විමසීය.

"හ්ම්ම්ම් ..... ඔව්....පලිගත්තා.... එයාලගේ කණ්ඩායමේ අට දෙනෙක් විතර දැනට ජීවතුන් අතර නෑ. පස්දෙනෙක් විතර නිදෙර්ෂීකම ඔප්පු කරගන්න බැරි වෙන්න එක එක වැරදිවලට අහුවෙලා ජීවිතාන්තය දක්වා හිරේට නියම වුණා. තවත් සමහරක් මානසික රෝග රෝහල්වල අදටත් නොමැරී ජීවත් වෙනවා. " මල්ෂා පැවසූයේ ඉතාමත් බයාදු ලෙසින් ය.

"ඊට පස්සේ හැමදේම ඉවර වුණා ද අක්කේ.." කුතුහලයෙන් සිටි දුශාන් විමසීය.

"නෑ මල්ලි..... ඊට පස්සේ තමයි හැමදේම පටන් ගත්තේ." හදිස්සියේ කතාවට මැදිහත් වූ චතූගේ හඬ දැඩි විය.

"ඒ කිව්වේ අක්කෙක් මට තේරුනේ නැහැ. " භීතිය අතරින් යාන්තමට කටහඬ අවදි කළ දුශාන් පැවසීය.

දුශාන් මාරුවෙන් මාරුවට දෙදෙනාගේ මුහුණු බලන්නට විය.

"ඒ හැමෝට ම එයා දඬුවම් කරන්නම් කියලා කිව්වට පස්සේ අපි ගොඩක් සතුටු වුණා. සතුට වැඩිකමට අපි කාසියට අරක් ගත් ආත්මෙන් ඇහැව්වා ' ඔයාට මොනාද ඕනේ කියලා'." චතූගේ කතා කිරීමේ වේගය මඳක් බාල විය.

"හ්ම්ම්ම්.....එයා අපෙන් ඉල්ලුවේ ලේ.....පිරිසුදු ලේ...." මල්ෂා පැවසීය.

" එයා කියපු විදිහට ඇඟිල්ල ටිකක් තුවාල කරලා මෙයාලා දෙන්නා බෝඩ් එක මැද්දෙන් ලේ බිංදු හැලුවා." චතූ පැවසීය.

"ඒත් එයා ඒ කිසිම දෙයකින් සෑහීමකට පත්වුණේ නෑ." ඇය දෙස බැලූ මල්ෂා පැවසීය.

"පොඩ්ඩක් ඉන්න අක්කේ.. අක්කා ඉස්සෙල්ලා කිව්වා නේද මාකර් එක ඉවර වුණා කියලා. ඊට පස්සේ සකූ අක්කා ලේවලින් අන්තිමට ඉලක්කම් හතර ලිව්වා කියලා. එතකොට ඒ ඉලක්කම් හතර අන්තරස්දාන වෙන්න ඇත්තේ සකූ අක්කා ඒවා ලේවලින් ලිව්ව නිසාද?." දුශාන් ඇසුවේ මහත් කුතුහලයෙනි.

"සමහරක් විට ඔව්....... එහෙමත් වෙන්න පුළුවන් ....අශුද්ධ ආත්ම ලේවලට කැමති. ඒ නිසා වෙන්න පුළුවන්." චතූ පැවසූයේ ඒ පිළිබඳ එතරම් තැකීමක් නොකරන සේ ය.

“ අර ලේවලින් සෑහීමකට පත්වුණේ නැති කතාව මොකක්ද අක්කේ" පැවසූ ඔහු සිය දහඩිය පිසදැමුවේය.

"එයා තව තවත් අපේ ලේ ඉල්ලන්න පටන් ගත්තා. ලේ බිංදු බෝඩර් එක මැද්දෙන් තියෙන එක නැවැත්තුවාම අහළ පහළින් එක එක සද්ද ඇහෙන්න ගත්තා. කාමරේ එහාට මෙහාට හෙවණැලි යනවා දැක්කා. ඒ කොහොම හරි අන්තිමට වුණේ පත්තු කරගෙන හිටපු ලාම්පුවත් නිව්ච්ච එක." චතූ පැවසීය.

"පොඩ්ඩක් ඉන්න අක්කේ මේක ඇතුළට ටිකක් එළිය වැටෙන්න මම ජනේලේ ඇරලා එන්නම්." පැවසූ දූශාන් එය විවර කරන්නට විය.

හිරු එළිය ජනේලය හරහා විත් කාමරය තුළට වැටුණි. ජනේලය ළඟට පැමිණි චතු අක්කා ඉන් පිටත බලා සිටියාය.

"අපි ටෝචර් එක පත්තු කර ගත්තත් අපිට වෙන කිසි දෙයක් පාලනය කරගන්න බැරි වුණා. අපි කාසියෙන් අත එළියට අරගත්තත් වැඩක් වුණේ නෑ."

"ඇයි අක්කේ එහෙම කියන්නේ." පවසන දූශාන්ගේ කටහඬ ගොරහැඩි විය.

" කාසිය තනියම හෙලවෙන්න ගත්තා… කිසිම හේතුවක් නැති ව."

" මොකක්" කිසිවක් අවබෝධ නොවූ දූශාන් පැවසීය.

"ඔව් මල්ලි ඒක අකුරෙන් අකුරට යන්න පටන් ගත්තා" මල්ෂා පැවසීය.

" ඊළඟට එකෙන් කිව්වේ මරණය ස්ථිරයි කියලා.

"අම්මෝ ඒක කියනකොටත් මගේ ඇඟේ හිරිගඩු පිපුණා වගේ. අක්කේ....ඊ...ඊ.... ඊට පස්සේ මොකද වුණේ අක්කේ."

"අපි අන්තිමට බෝඩ් එක වැළලුවා. කාසියත් එක්කම. කුණු බෑග් හතර පහක ඔතලා… ඒකත් වුණේ හරියට ම මීට අවුරුදු හතරකට ඉස්සෙල්ලා අද වගේ දවසක." මල්ෂා පැවසීය.

බියෙන් තැතිගත් දූශාන්ට යමක් පැවසීමට අවශ්‍ය ය. එහෙත් ඉන්පසු ඔහුගේ මුවින් කිසිවක් පිට නොවූයේ ය.

නිශ්ශබ්දතාවය කාමරය පුරා පැතිර යන්නට වූයේය.

" අනේ අක්කේ පින් සිද්දවෙයි....අපි මෙතනින් යමු.....යමු......." සිහින් ස්වරයෙන් කටහඬ අවදි කළ දූශාන් ඇයට පිළිතුරු දෙන්නට වූයේය.

"හොඳට හිතන්න මල්ලි........ ඔයාටත් ප්‍රශ්න වෙන්න පටන් ගත්තා....... අනික දැනට අවුරුදු හතරකට ඉස්සෙල්ලා අද වගේ ම හතරවෙනි මාසේ දහතුන් වන සිකුරාදා දවසක තමයි අපිට මේ සෙල්ලම පටන් ගන්න වුණේ........... ඔයාට මේ සිදුවීම්වල සම්බන්ධතාවයක් පේන්නේ නැද්ද." පැවසූ චතූ දූශාන් දෙස බලා සිටියාය.

"ටිකක් හිතන්න........හරියටම අසම්පූර්ණ වෙච්ච සෙල්ලමත් සම්පූර්ණ කරන්න... අවුරුදු හතරකට පස්සේ එයා අපි ව එක ම තැනකට එකතු කළා වගේ කියලා ඔයාට හිතෙන්නේ නැද්ද" මල්ෂා චතූ අක්කගේ කතාවට යමක් එකතු කළාය.

කතාවන් ඔහුගේ දෙසවන් තුළ දෝංකාර දෙන්නට විය. ඔහු කන් දෙක ඇඟිලි තුඩු අගින් වසාගත්තේය. දැන් ඔහුට කිසිවක් නොඇසෙන ගාන ය.

"අනේ.... අනේ...අක්කේ මට තවත් මෙතන ඉන්න බෑ ..... මට ගෙදර යන්න ඕනේ." දූශාන් නොනවත්වා ඔවුන් දෙදෙනාට ම මැසිවිලි නැගුවේය.

දූශාන්ට මෙහි ඇති බැරෑරුම් සහගත බව වැටහෙන්නට විය.

"මල්ලි හදිසි වෙන්නැතුව ඉන්න." පිටුපසින් පැමිණ ඔහුගේ කරට අත දමා ගනිමින් එක් අතකින් දූශාන්ගේ උරහිස තදින් අල්ලා සෙල වූ චතූ අක්කා පැවසීය.

"ඔයාට මොනවත් වෙන්න දෙන්නෑ... අනික මේ සෙල්ලම මේ පාර කරන්නේ මායි මල්ෂයි විතරයි. ඒ නිසා මේකෙන් ඔයාට කිසි ප්‍රශ්නයක් නෑ. බය නැතුව ඉන්න....."

" අනේ අපිට ආයෙත් ඔය සෙල්ලම කරන්නැතුව ඉන්න බැරිද අක්කේ.... අනික දෙවියෝ ඉන්න මේ ලෝකේ ඇතුලේ අපි ආත්ම පස්සෙන් යන්නේ ඇයි අක්කේ....ඇයි....."

"දෙයක් කියන්නම් මල්ලි... හොඳට අහගෙන ඉන්න........... ඔයාට සකූ ව පෙණුනා නේද ඔයා කිව්ව විදිහට. මම හරිද....."

හිස ඉහළ පහළ හෙලූ දුශාන් පිළිතුරු දුනි.

" ඔයා ඔය කියපු දවසෙ ම, ඔයාට එයාව පෙනුණ ඒ වෙලාවෙම, සකුව අපිටත් පෙනුණා ...... අන්න ඒකයි අපි අද ඔයත් එක්ක උදෙන් ම පල්ලි යන්න ආවේ. ඔයාට දැන්වත් තේරෙනවද මේකේ සම්බන්ධයක්. අපි තුන්දෙනාට ම සකූ ව පෙනුණා. එයාට අපිට මොනවා හරි කියන්න දෙයක් ඇති. අපි මේ සෙල්ලම කරමු. එයාගේ ආත්මය කාසියට ගෙනල්ලා මොනාද වෙන්නේ කියලා අහගමු." ඇය මෙතෙක් සැඟ වූ සත්‍යයක් එළියට එන්නට විය. එහෙත් චතූගේ එම දැඩි වූ වචන හමුවේ දුශාන්ගේ අදහස ඉබේ නිශ්ප්‍රභා වන්නට විය.

ඔහු නැවත නැවතත් ඇයගෙන් මෙම ස්ථානයෙන් පිට වන ලෙසට ආයාචනා කළේය. විටෙක චතූ ව සහ මල්ෂා ව දුශාන්ට පෙනුණේ ඔහු ව අපායට ගෙනයාමට පැමිණි යම පල්ලන් ලෙසිනි.

" අපි මෙච්චර කෙල්ලෝ වෙලා බය නැතුව ඉන්නවා. ඔයා කොල්ලෙක් වෙලත් මෙතන කෙල්ලෙක් වගේ අඬනවා නේ" නක්කලයට දුශාන් හා සිනා සූ මල්ෂා පැවසූයේ බැරි ම තැන ය.

චතූ දූශාන්ගේ හිස අත ගෑවාය. චතූ ඔහුගේ හිස තම ළයේ හොවා ගනිමින් කතා කළාය.

"බයවෙන්න එපා මගේ රත්තරනේ..... ඔයාට කිසිම දෙයක් වෙන්නේ නෑ. .....ඔයාට කිසිම දෙයක් වෙන්න මං ඉඩ දෙන්නේත් නැහැ...ඒ නිසා බය නැතුව ඉන්න." පැවසූ චතූ දූශාන් ගේ නළලට හාදුවක් අලවන්නට විය.

දූශාන්ගේ මුහුණ අඳුරු විය. ඔහුගේ නෙතට නැගුණේ අපේක්ෂාභංගත්වයට පත් බැල්මකි.

පැත්තකට ආ චතූ ,මල්ෂා සමග යමක් මිමිණූහ.

"මල්ලි ඔයා මෙතන ම ඉන්න. අපි පල්ලෙහාට ගිහිල්ලා බෝඩ් එක අරගෙන එන්නම්." පැවසූ මල්ෂා දූශාන්ගේ හිස අත ගාන්නට විය.

ඔවුන් දෙදෙනා ම තරප්පු පෙළ දිගේ පහළට යන ආකාරය ඒ අසලට පැමිණි දූශාන් බලා සිටියේය.

" කොහොමද එහෙම වෙන්නේ."

කකුල් දෙක දෙස බැලූ ඔහු තමාට ම කියා ගත්තේය.

" අනේ දෙවියනේ මගේ කකුල වැදිලා මට ඇවිදගන්න බැරුවනේ හිටියේ... දැන් මේ මම හොඳට නැගිටලා ඉන්නේ..වේදනාවක් කියලා දෙයක් දැනෙන්නෙවත් නැනේ.." දූශාන් තමන්ගෙන් ම ප්‍රශ්න කර ගත්තේය.

ඔහු සිය පාදය දණහිසෙන් දිග හැර නැවත හකුලා බලන්නට වූයේ ඇති වූ අවිශ්වාසය නිසා ම ය.

යම් ශබ්දයක් සමග ඔහුගේ නෙත් යොමු වූයේ පහළ තට්ටුව වෙතට ය.

සශ්‍රීක ව හොඳින් වැඩී අතු විහිදුණු ලෙමන් ගසක් එහි වූයේය. එහි ආසන්නයේ ම චතූ අක්කා සහ මල්ෂා සිටියහ. ඔවුන් වලක් හාරමින් සිටියේ තුඩ උල් වූ සවලකින් ය.

චතූ අක්කා එම සවලේ තුඩ පොළොවේ තබා සිය කකුලෙන් පාගා පස් තුළට යැව්වාය. බුරුල් වූ පස් සවල උඩට ගත් පසු ව එය මල්ෂා විසින් ඉවත් කරන ලදී.

මඳ වේලාවකට පසු ව ඔවුන් බිම දණ ඔබාගත්හ. ඔවුන් දෙදෙනා පොළොවෙන් යමක් එළියට ගන්නට වූහ. එය පාසර්ලයකි. පැතැලි වූ එය තරමක් විශාල ය.

එම පාසර්ලය මල්ෂා විවෘත කළාය. එහි තිබුණේ ඔවුන් මෙතෙක් බලාපොරොත්තුවෙන් සිටි බෝඩර් එක ය. බොහෝ කලක් වැදුණු දූවිල්ල හේතුවෙන් එය දිරා පත් ව තිබුණි.

තරප්පු පෙළ ඔස්සේ දූශාන් සිටින තැනට එය ගෙන ආවේ ඉන්පසු ව ය. පිටුපසට වූ දූශාන් ඔවුන් දෙස බැලුවේ වත් නොමැති තරම් ය.

"මල්ලි ඔයා බලාගෙන ඉන්නේවත් නැද්ද." චතූ අක්කා අවසානයට ඇසුවාය.

මල්ෂා එය අසල වූ කිළිටි රෙදි කඩකින් එය පිස දැමීය.

"අනේ අක්කේ... මට ඕවා බලනවා තියා ළඟටවත් එන්න ඕනේ නෑ...මම මෙතනට ම වෙලා ඉන්නම්" පැවසූ ඔහු බිත්තියට සිය පිට තැබීය.

ඉන් පසු රුටා පහළට විත් දණහිස් දෙක අස්සේ ඔළුව ගසා ගත්තේය. ශබ්දයක්වත් නැසෙන සේ දබර ඇඟිලි දෙක කනේ ගසාගත් ඔහු වකුටු වී සිටින්නට විය.

ක්‍රමයෙන් පුළුටු ගඳ කාමරය පුරා හමන්නට වූයේය. අසලින් ම ඇසුණේ අඩි ශබ්දයකි. එය බර අඩි තැබීමකි.

කාමරය අවට ඇති ආලෝකයේ අඩු වැඩි වීමක් දැනෙන්නට විය. ඔවුන් පවසන වදන්වලට දූශාන්ට ක්ලාන්ත වීමට ආසන්න ය.

ඔහු සෙමෙන් හිස එසවීවේය. ඔහුට මඳ සීතලක් දැනුණි. චතූ අක්කා සිටින කාමර කෙළවරේ කළු දුමාරයක් රැස්වනු ඔහුට දැකගත හැකි විය. ක්‍රමයෙන් එය ඇඩි වන්නට විය. දැන් දැන් ඔහු වටා ද දුමාරය රැස්වන්නට විය. ඔහු නොසෙල්වී සිටියේය. ඔහු වටා තිබෙන පුටු මේස නොපෙනී යන තරමට ම දුමාරය වැඩි විය.

එක් වර ම දුමාරය තුළින් ඔහුට කුමක්දෝ දිස්වන්නට විය. ඔහු හිස හරවා ඒ දෙස බලන්නට විය. එකෙනෙහි ම ඡායාවක් බඳු වූ එය ඔහු වෙත එන්නට විය. එන්න එන්න ම එය තද කළු පැහැ විය.

ඔහු හොඳින් එය දෙස බැලුවේය. එය ගැහැනු ළමයෙකුගේ ඡායාවක් මෙන් ඔහු දිටීය. ගත වූ නිමේෂයේ රන් පැහැති ඔරලෝසුවක් පැළැඳ ගත් ඇය ඔහු ඉදිරිපිටට පෙනී සිටියාය. දූශාන් මීන් පෙර සුසාන භූමිය ආසන්නයේ දුටු ඇ දැන් ඔහුගේ ඉදිරිපිට ය. ඔහුට එය අදහා ගැනීමට අපහසු ය.

" මල්ලි මම යනවා..." එම අද්භූත හඬ දූශාන්ට පැවසුවසීය. ඇයගේ රුව ක්‍රමයෙන් දුමාරය වසාගන්නට

විය. මේකත් හීනයක්ද? දූශාන්ට සිතුණි. සිනාසුණු ඇ ඔහු දෙස බලා සිටියාය. දූශාන් ගල් වී සිටියේය. කළු දුමාරය ඇ වෙලාගන්නට විය. ගත හිරිගඬු නැඟුණ ද දූශාන් ඉන් සලිත නොවූයේය.

03. නොසිතූ වියෝව

සිටි ඉරියව්ව වෙනස් කිරීමට දුශාන් උත්සාහ නොකළේය. ඔහු සිටියේ ඇසිපිය නොගසාය.

"මල්ලි.... මල්ලි.....නැගිටින්න."

දුශාන්ගේ හිසකෙස් අතරින් සිය අතැඟිලි යවා පිරික්සුවාය. ඔහු තිගැස්සුණි. ඔහුගේ මුළු ඇඟ ම කිළිපොලා යන්නට විය. ඒ චතු අක්කා ය.

"ඔක්කොම ඉවරයි මල්ලි.."

"ඉවරයි කිව්වේ අක්කේ" දෙලෝ රත් වූ දුශාන් චතූගෙන් විමසීය.

" නෑ....... නෑ......බය වෙන්න දෙයක් නෑ. හැමදේම හොඳින් වුණා. දැන් කිසි ප්‍රශ්නයක් නෑ. අනික අපට සංඥාවක් දීලා තියෙන්නේ සකූ තමයි." චතූ සිනා සී පැවසීය.

"අපි ගෙදර යමු." එවිට ම චතූගේ මුහුණ බැලූ මල්ෂා පැවසීය.

මෝටර් රථයට ඇතුල්වීමට සියල්ලෝම බලා සිටියහ. නමුත් චතූ තමන් පැවසූ දෙයින් යම්තාක් දුරට තැති ගැන්මකට ලක් ව සිටියාය.

"අක්කේ.....අක්කට හොඳට ම විශ්වාසයි නේද... මේක අවසානයක් මිසක්.... ආරම්භයක් නෙවෙයි කියලා..."

විමතියෙන් සිටි ඔවුන්ගේ නෙත් දුශාන් කෙරෙහි යොමුවිය.

" අනේ මල්ලි......... බය වෙනවා කියන එකෙත් සීමාවක් තියෙන්න ඕනේ.... මං ඔයාට කිව්වනේ බයවෙන්න එපා කියලා ... බය නැතුව ඉන්න අපිට අදින් පස්සේ මොනවත් වෙන්නේ නැහැ." සිය නළල මැද පිරිමදින අතර ම චතූ පැවසීය. චතූ සිටියේ තරමක් නොසන්සුන් ව ය.

ඔවුන් සියල්ල නිවස අසලට පැමිණෙන තෙක් එකිනෙකා අතර කතාබහක් නොවූ තරම් ය.

දූශාන් සැමට සමු දෙන්නට වූයේය. ඉන් පසු රථයෙන් බැසගත්තේය. ගේට්ටුවෙන් ඇතුළට ඔහු පියවර මැන්නේ පිටුපස නොබලාය.

"මල්ලී....... කිසිම දෙයක් ගැන හිතන්න එපා... අදින් පස්සේ අපිට කිසි දෙයක් වෙන්නෑ." මල්ෂා පැවසීය.

රථයෙන් එළියට ආ චතූ අත් දෙක බැඳගෙන කාරයට හේත්තු ව සිනාසෙමින් සිටියාය. අත් දෙක දෙපසට දිගු කරමින් දිව ආ මල්ෂා තදින් ඔහුව වැළඳගත්තාය

ප්‍රීතිමත් මොහොතක් ගතවිය. ඔහු සිය නිවස තුළට පැමිණියේ සියල්ලන් පිට වූ පසු ව ය.

නිවස උඩු යටිකුරු වී තිබිණි. ඔහු වැඩ පටන්ගන්නට විය. මුලු නිවස ම අතුගා මොප් කළේය. භාණ්ඩ සියල්ල ම නිසි පරිදි ස්ථාන ගත කළේ සියල්ල අවසානයටය.

එයට ම විනාඩි හතලිස්පහක කාලයක් ගතවී තිබුණි.

එහෙත් තවමත් වැසිකිළිය පමණක් ඉතිරිය.

ගැසූ පා පහර හේතුවෙන් එහි අගුල පිටතට පැන තිබුණි. ඉස්කුරුප්පුනියනකින් එය තිබූ ලෙස ම සවි කළේය. ඒ ඔහුට හැකි ඉක්මනින් ය.

ඇතුළත බිත්ති කහ ගැසී තිබුණි. දුශාන් එයට වැසිකිළි පිරිසිදු කාරකයක් යෙදුවේය. ටයිල්වල සිට පිරිසිදු කිරීම ඇරඹුණි. බිත්තිය ද වැසිකිළි පෝච්චිය ද දැන් පිරිසිදු කර අවසාන ය. ඔහු මඳක් පිට කොන්ද කෙලින් කරන්නට විය. ඒ සින්ක් එක පිරිසිදු කිරීමට ය.

" දෙවියනේ... චතූ අක්කා කිව්වනේ මේක ඉවරයි කියලා. කොහොමද මෙහෙම වෙන්නේ" එය දැකීමෙන් දුශාන්ට කෑගැස්සිණි.

පිටුපස වූ බිත්තියේ ඔහු හේත්තු වූයේ ඉබේට ම ය.

මුහුණ බලන කණ්ණාඩිය රක්ත වර්ණයෙන් යුත් සඳහනකි.

එහි තිබුණේ " හෙලෝ "යනුවෙනි.

" නෑ මේක වෙන්න බෑ... හැමදේම ඉවරයි." සිහිපත් කළ දුශාන් මඳ හුස්මක් ඉහළ පහළ හෙලීය.

දුශාන් එය මැකීමට උත්සාහ කළේය. ඇඟිලි තුඩු එය මත එහා මෙහා යැවීය. එය තොල් ආලේපණයකින් ඇඳි අකුරු කිහිපයක් යැයි ඔහුට සිතිණි. එය හොඳින් වියළී තිබුණි. එය උදෑසන සිදු වූ සිදුවීමක් බැව් ඔහුට දැන් ප්‍රත්‍යක්ෂ ය.

සියල්ල අවසානය. දුශාන් සෝෆාවේ ඇද වැටුණි.

දුශාන් රිසි සේ ගිමන් හැරියේය. ඉදිරිපස ගේට්ටුව විවර වන ශබ්දයක් අහම්බෙන් දුශාන්ගේ කන වැකුණි.

" අයියේ........." හඬ නගා දිව ආ දුශාන්ගේ කුඩා සහෝදරයා ඔහුගේ ඇඟට පැන්නේ ඒ සමග ය.

"හැලෝ...හැලෝ... කොහොමද.... ඔයා නැතුව මම ගොඩක් පාලුවෙන් හිටියේ." පැවසූ ඔහු සිය කුඩා සහෝදරයාගේ කම්මුල් සිප ගත්තේය.

වඩා ගනිමින් හුරතල් කළේය.

හෙම්බත් ව සිටි දුශාන්ට තම සහෝදරයා දැකීම සිතට යම් සහනයක් විය.

" අනේ මේ බලන්න මුළු ගෙදර ම අස් කරලා..... හැමදේම පිළිවෙළට තියලා." පැවසූ දුශාන්ගේ මව නිකටෙන් අල්ලා ගත්තේය.

ඔහුගේ කම්මුල් සිප ගත්තේ සිය දෑස් දෙස බලන අතරය. ඇයට දුශාන් කෙරෙහි වූයේ සතුටකි.

" මල්ලිත් එන අවුරුද්දේ ඉඳන් ඔයාගේ ඉස්කෝලේ පුතා.......... මට නම් මාර සතුටුයි." පැවසූ මව නැවතත් ඔහු ව සිප ගත්තාය.

දුශාන් පාසලට යාමට ඇඳුම් පැළඳුම් කල්වේලා ඇතු ව ලැහැස්ති කළේය. රාත්‍රී ආහාරය ද ඔහු ඉක්මනින් ලබාගත්තේය. ඔහු ඇඳට වැටුණේ හොඳින් නිදා ගැනීමට ය.

දුශාන් උදේයේ අවදි වූයේය. ඒ උද්යෝගයකිනි. විටෙක වෙනදා නොවූ සතුටකිනි. ලකලෑස්ති වූ ඔහු පාසල් බස් රථයට ගොඩවූයේය. ඔහු බලාපොරොත්තුවෙන් සිටියේ චතූ අක්කාය. එහෙත් ඇය අද පැමිණ සිටියේ නැත. දුශාන් පාසල අසලට එන තෙක් දිගු නින්දක පසුවූයේය. ඔහු ගේට්ටුව ඉදිරිපිට දී ඉන් බැස ගත්තේය.

"පොඩි එකා... ඔහොම හිටපන්."

පාසල තුළට පියමනිනට හැදුවා පමණය. ළඟ සිටිමින් යමෙකු කෑ ගැසීය. වෙනත් කල්පනාවක සිටි දුශාන් එකවර තිගැස්සිණි.

ඒ දුශාන්ට පෙර දවසක දී අවවා ද කල ලක්ෂාන්ය. එනම් උසස් පෙළ සිසුවාය. කිසිවක් පැවසීමට ප්‍රථමයෙන් ලක්ෂාන් ඉස්සර විය. ඔහු දුශාන්ගේ අත තදින් අල්ලා ගත්තේය.

"අනේ අයියේ...මේ කොහෙද මාව ගෙනියන්නේ" දුශාන් අසන්නට විය.

" වරෙන්.... මම උඹව රියන් හතරක් යටට ගෙනියන්න." තවත් හස්තය වැරෙන් ග්‍රහණය කරගත් ලක්ෂාන් පැවසීය.

ඉදිරියට විසි වෙන සේ ලක්ෂාන් වරෙක තල්ලු කළේය.

දුශාන්ට පන්තියට යාමට ඉඩ නොලැබුණි.

දුශාන් ව ක්‍රීඩාපිටියේ කෙළවරට රැගෙන ගියේය. ඔහු වැර යොදා දිව යාමට සැරසුණි. ඒ සමග ම දුශාන්ගේ කන හරහා යන සේ පහරක් වැදුණේය. එය විදුලියක් කෙටූ ලෙස ඔහුට දැනුණි.

දුශාන්ගේ කන් අගුලු වැටුණි. ඒ සමග ඔහු බිම පතිත වූයේය. ඔහුගේ කනෙහි වම් පැත්ත සම්පූර්ණයෙන් ම නැසුණේය. එය බොහෝ සේ රිදුම් දුණි. දුශාන් සිය කන අල්ලාගත්තේය.

" උඹට මම එකපාරක්.......එක පාරක් කිව්වා....මගේ ම සහෝදරයෙක්ට වගේ... උඹ ඇහැව්වාද..." ලක්ෂාන් පැවසීය.

ඔහු තුළ වූයේ දැඩි කෝපයකි.

"අනේ අයියේ.... එදා ඔයා කිව්වයින් පස්සේ මම චතු අක්කට කතා කළේ නැහැ...... එයා තමයි මාත් එක්ක කතා කළේ." දූශාන් පැවසීය.

වේදනාව සමගින් ඔහු වම් කන තද කරගත්තේය.

"මම චතූ ගැන නෙමෙයි යකෝ කියන්නේ."

ලක්ෂාන් දූශාන්ගේ ගෙල සිර වන පරිදි දෙඅතින් අල්ලා ගත්තේය. දූශාන් බිත්තියේ හේත්තු කරගත් ඔහු කෑමොර දුන්නේය.

දැඩි වූ හස්තයෙන් දූශාන්ගේ ගෙල සිර විය. දූශාන්ට කැස්සක් හට ගැනුණි.

"ඕකව මැරෙයි බං" ලක්ෂාන් හා සිටි අයෙක් ඔහුගේ අතින් අල්ලා දූශාන් එයින් නිදහස් කළේය.

ලක්ෂාන්ගේ හොඳ ම යහළුවා වූ ඔහු ඉසුරු නම් විය. ක්‍රිකට් පුහුණුව සඳහා පාසලට පැමිණෙන ඔහු ව දූශාන් කලින් හැඳින සිටියේය.

"නෑ බං......පොඩි කමට නෙමෙයි මුගෙ වැඩ" ලක්ෂාන් ඉසුරුට පැවසීය.

"ඇයි මූ මොනවද කරලා තියෙන්නේ." ඉසුරු ප්‍රශ්න කළේ දූශාන්ගේ මුහුණ දෙස බලා රවමින්ය.

" නෑ බං චතූ එච්චර හොඳ කෙනෙක් නෙවෙයි. ඒ නිසා මම මූට ආශ්‍රය කරන්න එපා කිව්වා....... මූ ඒකෙ තරහට මගේ කෙල්ලත් එක්ක යාළුවෙලා....... මම දැක්කා මූ එයාව බදාගෙන ඉන්නවා. චතු තමයි මූට හැමදේටම උල්පන්දන් දෙන්නේ. මම දැක්කා චතූත් අත්දෙක බැඳගෙන

ඒ දිහා බලාගෙන හිටියා...ගොඩක් සතුටින්." ලක්ෂාන් පැවසූයේ ආවේගයකිනි.

"උඹ කියන්නේ මල්ෂා එක්ක මූ යාළු වුණා කියලද" ඉසුරු ලක්ෂාන්ගෙන් විමසීය.

ඉසුරු දුශාන් වෙත ඉතා අප්‍රසන්න බැල්මක් හෙළුවේය.

"ඔව් බං...ඔව්...ඒකනේ මම මෙච්චර කියන්නේ " දත්මිටි කෑ ලක්ෂාන් පැවසීය.

"හොල්මනක් පස්සෙන් එනවා අයියේ..මං කියන දේ "

දුශාන් හට පැවසීමට හැකි වූයේ එපමණකි.

වම් කන හරහා යන සේ නැවත පහරක් වැදුණි. කැගැසමින් දුශාන් ඇස් විවර කළේය. ඔහුට මෙවර කනේ පහර ගසා තිබුණේ ඉසුරු ය. ඉසුරු දුශාන් කී කිසිවක් තඹයකටවත් මායිම් නොකළේය.

දැනෙනා වේදනාව වැඩි ය. දුශාන් කන අල්ලෙන් තදකර සිටියේය. පිරිමදිමින් වේදනාවෙන් මිරිකෙන්නට විය. දුශාන් කෑ ගසන්නට වූයේය.

" කට වහපන්............. වහපන් කට..... උඹ කෑ ගහලා හරි කාට හරි මේ උන දේවල් ගැන කියලා තිබ්බොත්.... උඹට කරන දේ මම දන්නවා" දබර ඇඟිල්ල දුශාන් දෙස දිගු කළ ඉසුරු පැවසීය.

" බලපන්කෝ මූ නිකම් ඉන්නේ පූසෙක් වගේ... ඒත් මූ කරන වැඩ" ඉසුරු සිය යහළුවා දෙස බලමින් පවසත් ම ලද අවස්ථාවෙන් දුශාන් ඔවුන්ගේ ග්‍රහණයෙන් මිදුණි. එක එල්ලේ ඔහු දිව ආවේ පන්තියට ය.

පන්තියේ වැඩවලට දුශාන් සහභාගි වූව ද ඔහුගේ සවන දරාගත නොහැකි ලෙස ඇදුම් කන්නට විය. එය පිළිබඳ ව කිසිවක් කිසිවෙකු හට නොකියා සිටීමට ඔහු වගබලා ගත්තේය.

විද්‍යාව විෂය කාලපරිච්ඡේදයේ දී සටහන් සම්පූර්ණ කරන අතර ම දුශාන් ඔලුව මදක් වම් පැත්තට බර කරනු ලැබුවේ ඇදුම් කෑම ඉවසාගත නොහැකි නිසාවෙනි.

විෂය කාල පරිච්ඡේදය අවසාන වන්නට විය. ඔහු එය දරාගෙන සිටියේ අපහසුවෙනි. ඔහු හිස එසවූ පසු එය තවත් ඇදුම් කන්නට විය.

දුශාන් කන හරවා තිබූ පැත්තෙහි ලේ බිංදු කිහිපයකි. කන තුළට ඔහුගේ වමතේ සුළැඟිල්ල ඇතුළු කලේ පිරික්සීමට ය. එය කන් බෙරය පිපිරීම හේතුවෙන් සිදු වූ රුධිර වහනයක් යැයි ඔහුට සිතුණි.

පාසල අවසානයේ බියත් වේදනාවත් අසරණකමත් අතර කිසිවක් කර කියා ගත නොහැකි ව සිර ව සිටින දුශාන් සෙමින් පියවර මනින්නට වූයේය.

දුශාන් බස් රථයට ඇතුල් වෙන විට ද කනේපාර ගැසූ ලක්ෂාන් සිටිය ද මෙවර කිසිවක් නොකී ඔහු සිටියේ කිසිවක් නොවූ අයුරින් ය.

නිවසට ළං වන තෙක් හිඳගත් දුශාන්ට සිය දෑස් පියා ගැනීමට අවශ්‍ය විය. එහෙත් ලක්ෂාන් පිටුපස සිට යළි පහර දේ යැයි බියෙන් සිටි ඔහුට බසයෙන් බසින තෙක් ඉස්පාසුවක් නොවීය.

නිවස අසලට පැමිණි පසු බසයෙන් බැසගත් දූශාන් හට වතු අක්කා හමුවීමට දැඩි අවශ්‍යතාවයක් වූයේය. අසරණ වූ ඔහු හට තනිකමක් දැනෙන්නට විය.

දහවල් ආහාරය ඔහුගේ මව හට කිසිදු සැකයක් නො වන පරිදි ලබාගැනීමට ඔහු සමත් විය. දූශාන් ගෙදරින් එළියට පැමිණීමට තීරණය කෙරුවේය. ඒ අමතර පන්තියක් සඳහා සහභාගී වන බව දන්වමින් ය.

"පුතා පොඩ්ඩක් ඉන්න...... ජෙනිෆා නැන්දාගේ දුව නැති වෙලාලු. තාත්තාත් දැන් එනවා ගෙදර... එයා බලන්න යන්න. ඔයත් ලෑස්ති වෙන්න" අම්මා පැවසීය.

"කවුද අම්මේ ජෙනිෆා නැන්දා කියන්නේ. මම දන්නෙ නැහැනේ..... අනික මට අද පන්තිත් එක්ක." දූශාන් පැවසීය.

"නෑ පුතා අපි නොගිහින් ඉන්න එක හොඳ නැහැ......අනික ජෙනිෆා මගේ ඉස්කෝලේ කාලේ ඉඳලා යාළුවෙක්..... හොඳ ළමයා වගේ ගිහිල්ලා ලෑස්ති වෙන්න."

අම්මාගේ අඬෝවැඩියාවෙන් බේරීමට නොහැකි වූ හේ සුදු පැහැති ඇඳුමින් සැරසුණි. ඔහුගේ කන ද වරින්වර ඇදුම් කන්නට විය.

පියාණන් පැමිණි කළ මෝටර් රථයේ නැඟී සියලු දෙනා අවමංගල උත්සවය වෙත ගමන් කරන්නට විය.

ඉදිරිපස අසුනේ හිඳ ගත් අම්මා කුඩා සහෝදරයා දූශාන් අතට පත් කළේය.

කඳුළු අතරින් අවමංගල්‍ය උත්සවයට ඇතුල්වන සියල්ලන් අතරේ දූශාන් කුඩා සහෝදරයාගේ සුළැඟිල්ලෙන් අල්ලා ගත්තේය. එළියෙහි තිබූ පුටුවක ඔහු හින්දවා දූශාන් ද ඒ අසලින්ම හිඳගත්තේ ය.

දුශාන්ට ඔහු අසලින් සුපුරුදු මුහුණක් නෙත ගැටුණි. එහෙත් ඒ කිමෙක් ද. ඔහුට සම්පූර්ණයෙන් ම හඳුනා ගැනීමට යම් වේලාවක් ගත වූයේය.

"අනේ ඔයා කොහෙද මෙහේ" දුශාන් විමසුයේ හිස ඔසවා හොඳින් බලන අතර ය.

ඇස් යට කළු පැහැ ගැන්වී මුළු මුහුණ ම සුදුමැලි වී හඬා හෙම්බත් ව සිටියාය. හිස කෙස් බොහෝ සේ අවුල් වී තිබුණි. යාබද අසුනේ සිටියේ චතූ අක්කා ය.

" මල්ලි.....මල්ලි.... " ඉකිබිඳිමින් ඇය පැවසූයේ උගුර බැරෙණ්ඩි වූ අයුරින් ය.

"එයත් අපි ව දාලා ගියා මල්ලී..... " ඇය පැවසූයේ දුශාන්ගේ උරහිසින් අල්ලා ගන්නා අතර ය.

" කවුද අක්කේ මේ මැරිලා ඉන්නේ.... අක්කා දන්න කෙනෙක්ද?...."

" ඔව් මල්ලී ......මල්ෂා අපි ව දාලා ගියා මල්ලී......" චතූ කෑ ගැසුවාය.

සිය පපුවට තමන්ගේම අතින් ගසා හුල්ලමින් ඇ පැවසීය.

ඇයගේ ක්‍රියාකලාපය ද දුශාන්ට පාලනය කරගත නොහැකි ආකාරයට ම වැඩි විය.

දුශාන්ගේ කම්මුලෙහි සිය කුඩා සහෝදරයා අත තැබීය.

" ඇයි අයියා.........මොකද වෙලා තීන්නේ අයියේ....." බිය වූ ඔහු තම සියුමැලි, සිහිති කටහඬින් දුශාන්ට ආමන්ත්‍රණය කළේය.

චතු ආසනයේ පිටුපසට කර හිඳ වූ දුශාන්, කුඩා සහෝදරයා වඩා ගත්තේය.

" අක්කේ පොඩ්ඩක් ඉන්න මං මල්ලිව දීලා එන්නම්" පැවසූ දුශාන් සිය සහෝදරයා අම්මා වෙත බාර කර නැවත පැමිණියේය.

" මාල්ෂා අක්කට මොකද වුණේ අක්කේ" දුශාන් විමසන අතර ම හඬා වැලපුණු චතු අක්කා සෙමින් කතා කළාය.

"අනේ කාපු කෑමක් විස වෙලාලු මල්ලි...එයාවත් දෙවියෝ අරගෙන ගියා. මම ආදරය කරන ඔක්කොම මට නැතිවෙනවා මල්ලි. "ඈ පැවසූයේ නැවත නැවතත් සිය දෑතෙන් වැරෙන් තම පපුවට ගසා ගන්නා අතර ය.

"එයත් එක්ක ඒ කෑම එක මටත් කන්න තිබ්බනම්" චතූ පැවසීය.

ඇය නොනවත්වා ඇයගේ වේදනාව කඳුළු ලෙස පිට කරන්නට වූවාය.

මල්ෂාගේ හදිසි වියෝව පිළිබඳ ව දුශාන් ගේ සිතෙහි වාචාගත නොහැකි දුකක් ඇති කළේය.

එහෙත් ඔහු එය යටපත් කිරීමට වෙර දැරුවේ, යම් හෙයිකින් හෝ තමා එය පිට කොලොත් චතූ අක්කා මෙන් ම තමා ව ද කිසිවෙකුටත් පාලනය කරගත නොහැකි හෙයින් ය.

මල්ෂාගේ මෘත ශරීරය දැකීමට පවා දුශාන් නිවස තුළට ඇතුළු නොවූයේය. දුශාන් මුළු වෙලාවෙ ම චතු අක්කා සමග රැඳී සිටියේ හඬන ඇය සැනසීමට ය.

සැලකිව යුතු වේලාවක් ගතවිය. ඔහුගේ පවුලේ සියල්ලන් දුශාන් අසලට එන්නට වූයේ තමන්ට මෙහි රැඳී සිටිය හැකි උපරිම කාල පරිච්ඡේදය අවසාන බව හැඟවීමට මෙන් ය.

දෙමාපියන්ගේ පෙරැත්ත කිරීම හමුවේ චතු අක්කට සමුදුන් දුශාන් ඇයගෙන් නික්ම යන්නට වූයේ අදිමදි කරමින් ය.

මෝටර් රථයට ගොඩ වූ හෙතෙම නැවත ඔහුගේ කුඩා සහෝදරයා ඔඩොක්කුවේ හොවාගෙන පපුවට තුරුළු කර ගත්තේය. ඒ ඇති වූ දුකකට වඩා මින් පෙරාතුව චතු අක්කා හට පැවසූ ලෙස මෙය යක්ෂයාගේ ක්‍රීඩාවේ හුදෙක් ම ආරම්භයක් මිස, අවසානයක් නොවන බව ඔහුට හොඳින් ම දැනුණ නිසා ය.

දෑස කඳුළින් පිරී යන ඔහු පිටුපස අසුනට බර දුනි.

" ඔයා කොහොමද ජෙනිෆා නැන්දාගේ දුව දන්නේ පුතා....." අම්මා දුශාන්ගෙන් විමසුවේ ඒ සමග ය.

"එයාව මට පල්ලියේ දී හම්බවෙලා තියෙනවා අම්මේ" දුශාන් එයට ඉක්මන් ප්‍රති පිළිතුරු දුනි.

" ඒත් මම ඔය කියන ළමය ව මීට කලින් දැකල නෑනේ පුතා. බලන්නකෝ.... තරුණ ජීවිතනේ මේ නිකරුණේ නැතිවෙන්නේ... අද යක්ෂයා මේ ලෝකෙ ගිලගෙන ඉන්නේ". අම්මාගේ සුපුරුදු අඬෝවැඩියාව පටන්ගත්තාය.

දින පොතේ සටහන් පිටු අතර ඔහු තනිවිය. චතූ සමග ගෙවුණු මතකයට ඔහු බොහෝ සේ ප්‍රිය කළේය.

දවසින් දවස ගෙවී යන්නට විය. එහෙත් වෙනදා මෙන් ඔහුගේ සැපදුක විමසීමට වතු අක්කා බස් රථයේ නොපැමිණියාය.

මේ ගැන කිසිඳු තොරතුරක් ද තමාට දැන ගැනීමට කිසිඳු ඉඩක් නොලැබුණි.

දවස් තුනක් ගතවූයේ කිසිවෙකුටත් නොදැනී ම ය. මෘත ශරීරය භූමිදානය කරන දවස පැමිණි කල දුශාන් ඔහුගේ මව දැනුවත් කලේ සුසාන භූමිය වෙත යෑමට ය.

සුදු කොඩි වැල් යටින් මල්ෂා හට අවසාන් ගෞරව දැක්වීම සඳහා දුශාන් පැමිණියේය.

ඔහු එම ස්ථානයට පැමිණෙන විට ද මෘත ශරීරය සුසාන භූමිය වෙත ගෙන යාම සඳහා සියලු කටයුතු සූදානම් කරමින් තිබුණි.

ඔහු වතූ අක්කා සොයන්නට විය. එහෙත් ඔහුට වතූ අක්කා සොයා ගැනීමට නොහැකි වූයේ ඇතැම් විට ඇය නොපැමිණි නිසා විය යුතු යැයි ඔහු නිගමනය කළේය.

ඔහු සොහොන් පිටිය වෙත ගෙනයන ඇයගේ නිසල වූ සිරුර තැන්පත් කර ඇති මිනී පෙට්ටියට කර දෙන්නට වූයේය.

සසල වූ දුක්බර සිතුවිලි ඔහු තව තවත් සිත තුළ තද කර ගත්තේ ය.

වචනයෙන් විග්‍රහ කළ නොහැකි නොසන්සුන් සිතුවිලි දහසක් කඳුළින් පරිවතර්නය වන විට ගීතිකා ශබ්දය සිය අවටින් ම ආරම්භ වූයේ දුශාන් ද කෑගසා හැඬීමට පොළඹවමින් ය.

"හමුවේ දිනක ඒ ලස්සන ලොවෙහි අප,

හමුවේ දිනෙක ඔබ හා මා එතැන,

මනරම් ලොවෙහි එතැන දුක එහි කිසිදාක නැත,

හමු වී එහි දී එකට ගයමු ව දෙවිඳුන් මහිම"

එය ඔහු ප්‍රිය කෙරූ ගීතිකාවකි. ඔහුගේ හැඟුම් අවදි වූයේ උණුසුම් සුසුම් මතින් ගැලූ කඳුළුවලින් ය.

"අපි කවද හරි හම්බවෙයි අක්කේ....මට අන්තිම වෙලාවේ ඔයාගේ මුහුණවත් බලන්න හම්බුනේ නෑ" මෙතෙක් සිරකරගත් සිතුවිලි වචනයෙන් මොර ගසමින් පිට වූයේ එවිට ය.

ඇගේ සිරුර සහිත මිනීපෙට්ටිය මල් වඩම් අතරින් පොළොව යටට නොපෙනී යන්නට විය.

පස් පිඩක් වලට දැමූ ඔහු බොහෝ වේලා බලා සිටියේය. දෙනෙතට විඩාව දැනෙන තෙක් පැය ගණන් එදෙස බලා සිටින්නට ඇත.

එකිනෙකා දැල් වූ ඉටිපන්දම් එකිනෙක දැල් වී දැවී නිවෙන අතර දූශාන් ඇයගේ ජීවිතය දෙවියන්ට බාර කලේය.

හඬා වැලපුණු සියල්ලෝ එකිනෙකා සුසාන භූමියෙන් පිටතට නික්ම යත්ම දූශාන් ඇයගේ සොහොන ළඟ තනි විය.

දැන් සුසාන භූමිය පාලුවට ගොසිනි. එහි කළුවරත් ඔහුත් පමණකි.

දූශාන් දෙවියන්ට යාතිකා කලේය. කෙතරම් දෙවියන්ට යාතිකා කළ ද ඇ යළි කිසි දිනෙක තමා හමුවට නොඑන බව හොඳින් දන්නා දූශාන් හට ඇය නිදන සොහොන බදා හැඬීමට වඩා, කළහැකි අන් කිසිවක් නොවීය.

ඔහුට තවත් ඉවසාගත නොහැකිය. ඊයේ වැළැඳගත් ඇ අද මළවුන් අතර ය.

ඉවසාගත නොහැකි තැන කඳුළු දෙනෙතින් ඇද හැලෙන්නාක් මෙන් හිරි පොද වර්ෂාවක් බිමට ඇද හැලෙන්නට වූයේය.

හුන් තැන ම දණ ගැස්වුණු ඔහු මල්ෂාගේ මිනීවල වෙත හිස හොවා කතා කලේය. නැවත නැවතත් කතා කලේය.

ඔහු සනසා ඔහු වෙනුවෙන් සිටි ඇය අද නිශ්ශබ්ද ය.

වර්ෂාවක් ක්‍රමයෙන් වැඩි වන්නට විය. දූශාන් ඇයගේ මිනීවල බදා සිටියේය. ඇය හැරදා ගෙදර යාමට ඔහුට අවශ්‍යතාවක් නොවීය.

කඳුළු සමග මිශ්‍ර වූ වැසි ශරීරය පුරා වැගිරී යන්නට විය. ඔහු තෙත බරිත විය. කළුවර අහසේ රිදී ඉරක් යන්නට විය. එක් විදුලි සැර පහරෙන් මුළු සොහොන් බිම ම ආලෝකවත් වූයේය.

හෙන හඬ නැඟුණි. නැවත විදුලි සැරයක් පතිත විය. ආලෝකය දසත විහිදී යන්නට විය. කනත්තේ දොරටුව අසල යමෙක් සිටගෙන සිටියේය. ආලෝකය අඩු විය. නැවත අන්ධකාරය සොහොන් පිටිය පුරා පැතිර ගියේය. ඡායාව ක්‍රමයෙන් දූශාන් දෙසට එන්නට විය.

නැවතත් විදුලියක් කොටන්නට විය. දොරටුව අසල සිටි ඡායාව දැන් සුසාන භූමිය හරි මැද්දේ ය.

ආලෝකය දසත විහිදී යන්නට විය. එහෙත් මෙවර ගිගුම් හඬක් පිට නොවීය. එම ඡායාව දූශාන්ගේ දකුණු පැත්තේ සිටගෙන සිටින්නට විය. නැවතත් සුසාන භූමිය පෙර සේ ම අන්ධකාරය.

"ඔයා ආවාද..... අන්තිම වෙලාවේ හරි ඔයා එයි කියලා මට හිතුණා .... මම බලාගෙන හිටියා..... ඔයා

එනකම්...." සිටි ඉරියව්ව වෙනස් නොකළ දූශාන් පැවසීය.

ඔහුගේ හොඳින් ඇසෙන දකුණු කනෙහි කන්පෙති මත දෙතොල තැබූ ඇ ආමන්ත්‍රණය කරන අතර සිය ගත සිත සලිත වී ගියේය.

" මම ආවේ ඔයාව බලන්න....... මම දන්නවා ඔයාගේ වම් පැත්තේ කන තුවාල වෙලා කියලා. මම හරිද............. වුණේ හැම දෙයක්ම මම දන්නවා" මීළඟට දූශාන්ගේ සවන් පත් වෙත ගලා ආවේය.

ඇය එසේ ඔහුගේ කන් පෙති මත සිය දෙතොල් තබා මන්තරයක් මතුරන ආකාරයට ආමන්ත්‍රණය කළාය. ඒ සෑම වාරයක් පාසා ජනිත වූ හැඟීමට ඔහුගේ දෑස් පියවෙන්නට විය. විටෙක ඔහුගේ මයිල් කෙලින් විය.

දූශාන් පිටුපසට හැරීමට තැත් කළේය. එහෙත් ඔහුට කිසිඳු සෙලවීමක්වත් කිරීමට නොහැකි වූයේය. දූශාන්ට ඔහු ව කණුවක බැඳ තබා තිබෙනවාක් මෙන් දැනෙන්නට විය.

"දැන් යන්න හෙටත් මාව මේ වෙලාවට ම මෙතනදි ම හම්බෙන්න....." ඇ නැවතත් පැවසූයේ ඇයගේ හුස්ම තමාගේ කන්පෙති මත දවටන අතර ය.

ආපසු යාමට සැරසී මඳක් දුර ගමනේ නිරත වූ දූශාන් ට සන කළුවර අතරින් නැවතත් එම කටහඬ ශ්‍රවණය වූයේය.

" හෙට එනකල් ඔයාගේ අක්කා බලාගෙන ඉන්නවා..... ඒක නිසා අමතක කරන්න එපා" ඇ පැවසීමත් සමග සුසාන භූමියෙන් පාරට පැමිණි දූශාන් නිවස බලා ගමන් කළේය. එහෙත් ඔහුට ඉන්පසු කිසිවක් නොපෙනුණි.

දුශාන් හට අක්කා ආමන්ත්‍රණය කෙරූ ආකාරය රැය පුරා සිහිවෙන්නට විය. ඇස් පියෙනා මොහොතක් පාසා ඇය තමන් අසල යැයි මෝහනයෙන් මෙන් සිටි ඔහුට හැඟෙන්නට විය.

04. රතු දිනපොත

පසු දා උදයේ දූශාන්ට ඇස් විවර කර ගැනීමට පවා අපහසු විය.

ඔහුගේ ශරීරය ගිනි උඳුනක් මෙන් උණුසුම් විය. පියා මෙන්ම සිය මව ද ඔහු අසල ම වූහ.

එය දහවල් එක දෙක පමණ වනවිට මඳක් අඩු වන්නට විය. ඒ ඔහුගේ මව විසින් ලබාදුන් ප්‍රතිකාරවලින් පසු ව ය.

දූශාන් සිය දහවල් ආහාරය ලබා ගත්තේය. පසු ව පොත් පත් රැගෙන පාඩම් කිරීමට මේසයට ගොස් හිඳගත්තේය. සිදු වූ සියල්ල අමතක කර ඔහු මනස අපහසුවෙන් එක්තැන් කර ගන්නට විය.

පාසලට යාමට නොහැකි වූ හෙයින් අද දවසට නියමිත එක් එක් විෂයන්ගේ පාඩම් බලාගත්තේය.

දූශාන් අසලට උණුසුම් කෝපි කෝප්පයක් සමග කොෆි කේක් කැබලි කිහිපයක් ද රැගෙන සිය මව පැමිණියේ මේ අතර ය.

"පුතා අද හවස අපි ආච්චි ව බලන්න යනවා. ගොඩක් කාලෙකින් ගියේ නැති නිසා. හරියට ම හවස හය වෙද්දී ලෑස්ති වෙන්න." සිය මව පැවසීය.

" මම අද ඉස්කෝලේ ගියේ නැති නිසා මට තව විෂයයන්වල වැඩත් තියෙනවා. අනික වාර විභාගයටත්

තියෙනනේත් තව මාසයයි නෙහ් ...මම ඉන්නම්.. අම්මලා ගිහිල්ලා එන්න." ඔහු නිර්භය ව පිළිතුරු දුණි.

"පුදුමයි... ඒත් ඇත්තයි... ඇත්තටම පුතා.... මට ආඩම්බරයි ඔයා ගැන. පැහැදිලි වෙනසක්...." පැවසූ ඈ දුශාන්ගේ හිසෙහි අත තබන්නට විය.

" ඔයා එහෙනම් වැඩ ටික කරගෙන පරිස්සමට ගෙදරට වෙලා ම ඉන්න" පැවසූ ඇය දුශාන්ගේ හිස කෙස් අතරින් ඇඟිලි තුඩු යවා හිස පිරිමැද්දේය.

"පුතා ගෙවල් ඇරලා දාලා කොහෙවත් යනවා එහෙම නෙමෙයි." මුළුතැන්ගේ වෙත නික්ම යන අතර ම සිය මව පැවසීය.

වේලාව හවස හය පසු වී විනාඩි විස්සක් පමණ ගතවන්නට ඇත. ඔහුගේ මව කුඩා සහෝදරයා සමග කාරයට නැගුණි. යාමට සැරසී සිටි ඔවුන් ද රථයේ ෂටරය පහත් කළේය. දුශාන් ඒ වෙත ගමන් කළේය.

" පුතා පාරේ ලයිට් එක දාන්න අමතක කරන්න එපා. රෑට එතන ගොඩක් කළුවරයි. ළඟදි හොරෙක් ඇවිල්ලා මේ පැත්තේ මාලයකුත් කඩාගෙන ගිහිල්ලා තියෙනවා. දොරවල් ලොක් කරගෙන ඇතුළට ම වෙලා ඉන්න පුතා.... ආදරෙයි පරිස්සමෙන්." සිය මව නැවතත් පැවසීය.

බොහෝ වේලා ගත විය. පාඩම් වැඩ කටයුතුවල නියැලී සිටින නිසාවෙන් දුශාන්ට මනසට යම් නිදහසක් අවශ්‍ය වූයේය. දුශාන් ඇඳ වෙත පැමිණ මඳක් වැතිරුණි.

දෑස මඳක් පියවුණු දුශාන් පැයක පමණ කාලයක් නින්දට යන්නට ඇත.

යමෙකු විසින් ඔහු ව අවදි කළේය. එසේ දැනුණු දුශාන් වට පිට බැලුවේය. එකවර සුසාන භූමියේ දී චතු පැවසූ දෑ දුශාන්ට සිහිවුණි.

"චතු අක්කා එන්න කිව්වා නේද" ඉබේ ම කියවුණු දුශාන් වෙලාව බලන කළ යාමට නියමිත වේලාවෙන් පැයක පමණ කාලයක් ඉක්මවා ගොස් තිබුණි.

ඇඳිරි වැටී තිබුණි. නිවෙස තුළ වූ විදුලි පහන් ඔහු දැල්වීය. ඔහු නිවසින් එළියට බැස්සේ නිවසේ දොරගුළු ලෑමෙන් අනතුරු ව ය.

අවට අධික කළුවරක් විය. පාරට පිවිසි දුශාන් හට ඉදිරිය නොපෙනුණි. එහි ස්විචය තිබුණේ මඳක් උඩට වන්නට ය. විදුලි අත දිගේ ඒ යැයි ඔහුට සිතුණි. ඔහු ඒ සඳහා යොදා ගත්තේ කෝටු කැබැල්ලකි. ඔහු අසල තිබූ ලයිට් කණුවේ බල්බය දැල්වුයේය.

" බුදු අම්මෝ........අනේ අම්මෝ...." දුශාන් කෑගැසුවේ උඩ පනින අතර ය.

සිය හෘද ස්පන්දනය වාදනය වන බෙරයක ස්වභාවයක් ඉසුළුවේය. එවිට ඔහුගේ හුස්ම ඉහළ පහළ

යන වේගය ද ඉක්මන් වූයේ ඉබේට ම ය. නැංවුණු හිරිගඬු අතරින් සම දහඩියෙන් තෙත් වන්නට විය.

" ඇයි බය වුණාද?..... "

විදුලි බුබුළ දල්වන අතර ඉදිරියෙන් ඔහුගේ හුස්ම දැවටෙන නොදැවටෙන මානයේ සිටි ඇ කොඳුළාය.

හරිහැටි නින්දක් නොමැති කමින් හා හඬා වැලපී හෙම්බත් ව සිටි ඇයගේ ඇස් යට කළු වී මඳක් ඇතුළට ගොස්

තිබුණි. එය ඇය දෙස බලන ඕනෑ ම කෙනෙකු හට බිය උපදවන සුළු අයුරින් විය.

" ඔයා පරක්කු නිසා මම ආවා ඔයාව බලන්න..... මා.....මල්ලි" ඇය පැවසුයේ මඳක් ගොරහැඬි වූ හඬකින් ය.

"අක්කාගේ කටහඬත් වෙනස්වෙලා. අක්කා ටිකක් විවේක ගත්තොත් නරක ද." පැවසූ දුශාන් ඇයට ළං විය.

ඇය තදින් කහින්නට පටන් ගත්තේ තම උගුර පාදන අතර ය. එහෙත් ඇයගේ මුවින් පිටවන සුපුරුදු සුවඳේ අඩුවක් නොවීය.

"අක්කේ.....යමු අපේ ගෙදර. උණුවතුර ටිකක් බොමු... එතකොට ඕක හරියයි." දුශාන් පැවසූයේ ඇගේ මුහුණට තවත් ළං වන අතර ය.

"නෑ...නෑ...මල්ලි. මට ප්‍රශ්නයක් නෑ.... මෙතන ප්‍රශ්නය තියෙන්නේ ඔයාට... " ඔහු ව නොවැළැක් වූ චතුර පිළිතුරු දුණි.

"මොකක්..... ප්‍රශ්නයක්....."දුශාන් විමසීය.

"ඔව් මල්ලි.... ඔයාගේ වම් කන සම්පූර්ණයෙන් ම ඇහෙන් නෑ නේද දැන්..." ඇය දකුණු කනට කොඳුළා ය.

" අක්කා කොහොමද ඒක දන්නේ" දුශාන් විමසීය.

ඇස් ලොකු කර ගත් ඔහු ඇයගෙන් පිළිතුරක් අපේක්ෂාවෙන් බලා සිටියේය.

" මම ඒ කාලේ ඉඳල ම ඔයාට වෙන දේවල් දන්නවනේ මල්ලි" ඇය ඊට පිළිතුරු ලබාදීම වෙනදා මෙන් ම ඉතාමත් දක්ෂ අයුරින් මග හැරියාය.

"මල්ලි ඔයාට පුළුවන්ද මට එක පොරොන්දුවක් වෙන්න."

"කියන්න අක්කේ.... ඒක මොනවගේ පොරොන්දුවක්ද?" දුශාන් පැවසුයේ මෙතෙක් කල් තමාට සිදු වූ අමුතු සහ අද්භූත සිදුවීම් එකිනෙක සිහියට නඟා ගන්නා අතර ය.

" ඔයාට බැරිද මට පොරොන්දුවක් වෙන්න.... ඇයි ඔයාට..මාව විශ්වාස නැද්ද ....." චතූ පැවසුයේ දුශාන්ගේ දෑස් දෙස සෘජු ව නෙත් යොමන අතර ය.

මුහුණට මුහුණ ආසන්නය.

"අනේ විශ්වාස නැති කමකට කිව්වා නෙමෙයි අක්කේ. හරි මං පොරොන්දු වෙන්නම්..... මම මොනවා කියලාද අක්කාට පොරොන්දු වෙන්න ඕනේ." දුශාන්

එසේ පැවසුයේ ශෝකයෙන් සිටින ඇයගේ සිත තවත් රිදවීමට කිසිසේත් ම ඔහුට අවශ්‍යා නොවූ බැවින් ය.

එහෙත් කිසිවෙකු මුහුණ ඉවතට ගැනීමට රිසි නොවීය.

" ඔයා මට පොරොන්දු වෙන්න. ඔයාට ප්‍රශ්නයක් ඇති වෙන හැම වෙලාවක ම ඔයා මාව සිහි කරනවා කියලා" ඇය පැවසීය.

ඇය ඔහුගේ තොල් පෙතිවලට ආසන්නය.

" අනිවායෙර්න් ම අක්කේ. කොහොමත් දැන් මට මගේ ප්‍රශ්නයකදී පළමුවැනියට ම මතක් වෙන්නේ ඔයාව අක්කේ. ඔයා මගේ." දුශාන්ට කියවුණේ ඉබේට ම ය.

"ඒත් ඔයා මට අවශ්‍ය ම වෙලාවෙදි මගේ ළඟින් හිටියේ නෑ අක්කේ. ලක්ෂාන් අයියා මට ගහපු වෙලාවේ මම ගොඩක් වේදනාවෙන් හිටියේ. ඊට පස්සේ දවසෙත් මං හිතුව ඔයා ඉස්කෝලේ බස් එකේ එයි කියලා... ඔයාට වුණ හැම දෙයක්ම කියන්න......ඒත් ඔයා ආවේ නෑ... අක්කේ... ඔයා ආවේ නෑ........"

උරහිසට පහළින් දූශාන්ගේ ග්‍රහණයට නතු විය. විය යුතු දේ වීමට ඉඩ හැරි ආඩම්බරකාරියක වූ චතූ ඔහුගේ අණසකට නතු විය.

" අදින් පස්සේ එහෙම වෙන්නේ නෑ. ඔයා මාව මතක් කරන හැම වෙලාවක ම මං ඔයා ළඟින් ම ඉන්නවා.........ඔයා ළඟින් ම ඉන්නවා රත්තරනේ....."

ඉහළට ගත් හුස්ම පහළ හෙළීමට කල්පනාවක් නොවූ ඇය පැවසීය.

ඉහළින් වූ දැල්වූ විදුලි බුබුළ නිවි නිවී දැල් වෙන්නට වූයේය. එය එකවර ම නිවී ගියේ සියුම් හඬක් නගමින්ය.

මඳ වේලාවකින් නැවත එය දැල්වූ නමුදු මෙතෙක් දූශාන් හා කතා කළ චතූ අක්කා ඔහු අසල සිටියේ නැත.

"අනේ මන්දා මේවා කොහෙන් කොතනින් ඉවර වෙයිද කියලා" හති හැරි දූශාන් තමන්ට ම කියාගන්නට විය.

සැනසුම් සුසුමක් හෙලූ ඔහු නිවස වෙත පියවර මනින්නට වූයේය.

සිදුවන අමුතු සිදුවීම් සියල්ලෙන් මනස විකාර ව සිටීයේය. ඔහු හට රාත්‍රී ආහාරය ද ගැනීමටවත් එතරම් ප්‍රියතාවයක් නොවීය.

දුශාන් නිදා ගැනීමට උත්සහ දැරුවේය. එහෙත් උදෑසන වන තෙක් නින්දක් ඔහු අහලකවත් නොවීය. ඔහු සිය දින පොතෙහි සටහනක් තැබුවේය.

සිදුවන සියල්ල පිළිබඳ ව පූර්ණ මතක ආවර්ජනය කරමින් සිටි දුශාන් පියවි සිහියට එන්නට වූයේ අම්මාගේ කෑ ගැසීමත් සමග ය.

" පුතා...පුතා.......වේලාව හොඳට ම පරක්කු වෙලා. ඔයා ඉස්කෝලේ යන්නැද්ද" දුශාන්ගේ මුහුණට එක දිගට ම තට්ටු කළ සිය මව පැවසීය.

නාන කාමරයට ගොස් දුශාන් ශුද්ධ පවිත්‍ර වූයේය. ඔහු ඇඳුම් හැඳ පැළඳ ගන්නට වූයේ බස් රථයේ පැරණි හෝන් එක නාද වන අතර ය.

"අන්න පුතා අද බස් එකත් වේලාසනින් ඇවිල්ලා... ඉක්මනින් ඇඳගන්න මං කෑම එක ඔතලා දෙන්නම්."පැවසූ මව ඉක්මන් විය.

හැඳ පැළඳගත් දුශාන් ඉක්මනින් සාලය වෙතට ආවේය. අම්මා කෑම පෙට්ටිය දුශාන්ගේ බෑගයට දමා ඔහුගේ දෙස බැලුවේය.

"පුතා කෝ ඔයාගේ උඩ බොත්තම.....ඉන්න මං කටුවක් අරගෙන ඇවිල්ලා ගහන්නම්." පැවසූ ඈ දිවගියේ කාමරයට ය.

ක්ෂණික ව ක්‍රියාත්මක වූ ඈ දුශාන්ගේ කැඩුණු බොත්තම වෙනුවට පිටතට නොපෙනෙන අයුරින් හැට්ට කටුවක් එහි ගැසුවාය.

බසයෙහි අසුන්ගත් දුශාන්ට එම හැට්ට කටුව කමිසය ඇතුල් පැත්තෙන් පපුවේ දැවටුණි. එය ලක්ෂාන්ගෙන් පහර

කැමට ලක් වූ දවසේ තමා පැළඳගෙන සිටි ඇඳුම යැයි ඔහුට මතක් වූයේ එවිට ය.

ලක්ෂාන් කෙරෙහි පැහැදිලි කෝපයක් ජනිත වූයේය. එහෙත් කළ හැකි කිසිවක් නොවූ හෙයින් දුශාන් නිශ්ශබ්ද ව සිටියේය.

බසෙන් බැස පාසල තුළට පිය මනින, කෝපයෙන් දැවෙන ගිනි සිළුවක් මෙන් වූ ඔහුගේ දෑස්වලට ලක්ෂාන් නැවත වතාවක් දර්ශනය වූයේය. ඒ ජීවිතයේ ප්‍රථම වතාවට දුශාන් හට පළිගැනීමේ චේතනාවක් මුදුන්පත් වන අතර ය.

පාසලේ වැඩ කටයුතුවලට ද අද දින එතරම් උනන්දුවක් නොවූයේය. ඔහු තමාට කනේ පහර ගැසූ ලක්ෂාන් කෙරෙහි කෝපාවිෂ්ඨ වී සිටියේය.

පාසලේ අවසාන සීනුව නාද වූ හෙතෙම බස් රථය වෙතට සෙමින් ගමනෙන් පැමිණ ලක්ෂාන් එන තෙක් බලා සිටියේය.

බස් රථය නවත්වන ස්ථානයට ඔහු පැමිණි කළ දුශාන් කෙමෙන් ලක්ෂාන් අසලට ම ගමන් කළේය.

චතූ අක්කා පෙර රාත්‍රියේදී කී ලෙස ම දුශාන් ඇයගෙන් උදව්වක් බලාපොරොත්තුවෙන් ඇය ව සිහි කළේය.

ඇස් දෙක තදින් වසා ගත් දුශාන් තව තවත් ඇය සිහි කළේය. එහෙත් ඇයගෙන් කිසි පිළිතුරක් නොලැබුණි. දුශාන්ට චතූ කෙරෙහි වූයේ කෝපයකි.

බස්රථය නියමිත වේලාවට නොපැමිණීම හේතුවෙන් සියලු සිසුන් යම්තාක් දුරකට නොසන්සුන් අයුරින් හැසිරුණේය.

" වෙනදාට අපි එද්දි මෙතන නවත්තලා නේ තියෙන්නේ. අදත් බස් එක කැඩිලා දන්නෑ." ඇතමෙක් පැවසුහ.

දූශාන් ලක්ෂාන් දෙස ඇසිපිය නොහෙළා බලා සිටින අතර එකිනෙකා පවසන වදන් දූශාන්ට සෙමෙන් ඇසෙන්නට විය.

විනාඩි හතලිස් පහක් පමණ ගත විය. ඔවුන් වෙත පැමිණියේ බස් රථය නොව එහි රියදුරු මහතාය.

රියදුරු පැවසූ අන්දමට මොවුන්ට තම තමන්ගේ නිවෙස් කරා යාමට ක්‍රමයක් ද නොතිබිණි. සුපුරුදු සේ අබලන් බස් රථයේ කාර්මික දෝෂයක් හටගෙන තිබුණි.

අතිරේක පන්ති සඳහා සහභාගි වීමට සිසුන් හට ඉක්මනින් යාමට අවශ්‍ය බව එකිනෙකා පවසමින් ශබ්ද නැගීය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේ දි රියදුරු සිසුන් කැටුව නගරය ආසන්නය වන තෙක් දුම්රියෙහි ගමන් කිරීමට තීරණය කරන ලදී.

සිසුන් සංඛ්‍යාව ගණනය කළ ඔහු වයසින් බාල සිසුන්, කණ්ඩායමේ ඉදිරිපසටත්, වයසින් වැඩි සිසුන් කණ්ඩායමේ පිටුපසටත් වන සේ පෝලිම් කර ළඟ ම තිබූ දුම්රිය ස්ථානය වෙතට ගමන් කළේය.

"ඒයි පොඩි එකා. මෙහෙට වරෙන්." දූශාන් කෝපාවිෂ්ට ව සිටි එම අවස්ථාවේ ලක්ෂාන් ඔහු ආමන්ත්‍රණය කළේය.

දූශාන්ගේ කෝපය දෙගුණ තෙගුණ වන්නට විය.

" අපි ඇවිදගෙන යන ගමන් සින්දුවක් කියනවා බලන්න." ලක්ෂාන් පැවසුයේ අනෙක් මිතුරන් අතරේ දුශාන් ව හාස්‍යයට ලක් කිරීමේ අරමුණෙනි.

" මම සින්දු දන්නේ නෑනේ අයියේ." උරණ ව සිටි දුශාන් ගත් කටට ම කියන්නට විය.

" එහෙම නම් මොනාද දන්නේ..... අක්කලා එක්ක හුරතල් වෙන්නද." ඔහු අමුතු කටහඬකින් කෑගැසීය.

සියල්ලන්ගේ සමච්චලයට දුශාන් බඳුන්වන අතර, කිසිවක් කිසිවෙක් හට නොකී දුශාන් ඔවුන් සමග ම රැඳී සිටියේය.

සියල්ල මෙසේ සිදු වෙත් ම දුම්රිය ස්ථානයට පැමිණි සියල්ලෝ හතරවන වේදිකාව දක්වා ගමනේ යෙදුණි.

දුම්රිය වේදිකාව මත යම් තදබදයක් වීම හේතුවෙන් සියල්ලෝ කණ්ඩායමක් වශයෙන් එකට සිටියහ.

මඳ වේලාවකට පසු ඔවුන් සිටින දුම්රිය වේදිකාවට හඬ නගමින් දුම්රියක් පැමිණියේය.

"හතරවන වේදිකාවට දැන් පැමිණි දුම්රිය." ශබ්ද විකාශන යන්ත්‍රවලින් විකාශනය වූයේය.

කණ්ඩායමේ සියල්ල අත් අල්ලාගෙන සිටියහ. තදබදය තව තවත් වැඩිවිය. වේදිකාවේ සිටින සියල්ලන් තෙරපෙන්නට වූයේ දුම්රියට නඟින අතර ය.

දුශාන් තදින් අත් අල්ලා සිටිය ද පිටුපසින් වන තෙරපීම දරාගැනීමට ඔහුට අපහසු ය. තමන් වටේට සිටින මගීන් අතරේ දුශාන්ගේ දෑස් පියවෙන්නට වූයේය.

ඔහුගේ මුළු ගත ම සීතල වුණි. ඇඟ හැමතැන ම ක්‍රමයෙන් හිරිගඩු නැගෙන්නට විය. යමෙකු ඔහුට ඇමතීය. ඒ කටහඬ ඔහුට හුරුපුරුදු ය. ඊළඟ මොහොතේ චතූ සිටියේ ඔහුගේ කන් අග සිය තොල් පෙති තබාගෙන ය.

"ලෑ........හැස්ති... ලෑස්ති වෙන්න......" ඇය කොඳුලාය.

දකුණු කන අගුළු වැටීමත් සමඟ ම චතූ අක්කාගේ කටහඬ ඔහුගේ සවනෙහි දෝංකාර දුනි.

එය කන වැකුණ දුශාන් අහළ පහළ බැලූව ද ඔහුට චතු අක්කා සොයාගන්නට නොහැකි විය. ඇ දැකුමට පවා ප්‍රිය කළ දුශාන් ඇයට ම තදින් ඇබ්බැහි වී සිටියේය.

තිරිංග යෙදීමත් සමග හඬ නගමින් දුම්රිය පිරිස ඉදිරියේ නැවතුණු වහාම, සියල්ල ඒ වෙත ඇතුළු වූහ.

බාල සිසුන් සියල්ල දුම්රියෙහි මැද්දට වන්නට සිටියත් වැඩිමහල් සිසුහු සියල්ල දුම්රිය පා පුවරුවේ ගමන් කළහ. දුශාන් ඇතුළු පිරිස රැගෙන ආ රියදුරු ඔවුන්ට පාපුවරුවෙන් නැග ඇතුළට යාමට පැවසූවේය.

එහෙත් එතරම් තැකීමක් නො කළ ඔවුන් එහි ගීත ගායනා කිරීමට පටන් ගත්තේ ඒ සමග ය.

දුම්රිය ඉදිරියට ධාවනය වෙත් ම ලක්ෂාන් නැවත දුශාන් හට කතා කළේය.

" අද නම් තමුසෙට බේරෙන්න වෙන්නෙ නෑ...අහ්හ්..... පටන් ගන්නවා බලන්න සිංදුවක්. සින්දුවක් දන්නෙ නැත්තං 'රෝස මලේ නටුවේ කටු' ඒකවත් දන්නවා ඇතිනේ. පොඩි කාලේ අම්මා උගන්නලා ඇතිනේ. ඒක හරි කියනවා" දුශාන් දෙස රවා බලමින් සිටි ලක්ෂාන් පැවසීය.

තද බදයේ ද කිසිඳු අඩුවක් නොවීය. පෙර සීතල දුශාන්ට එලෙස ම දැනෙන්නට විය. ඇය සිටියේ ඔහුගේ පිටුපසින් ය. කන්පෙති මත ඇයගේ උණුසුම් හුස්ම දැවටෙන අතර නැවත ඔහුගේ ඇස් දෙක පියවුණේ ඉබේම ය.

"ඔයා මං කියන එක ඒ විදිහට ම හයියෙන් ඒගොල්ලන්ට ඇහෙන්න කියන්න." ඇය කීවාය.

අඩවන් දෙනෙතින් සිට දිගු හුස්මක් ඉහළට ගත් දුශාන්ගේ සවනට යළි චතු අක්කා ආමන්ත්‍රණය කළාය

සිය දෙසවන් තුළ වචනයෙන් වචනය දෝංකාර දෙන්නට විය. සියල්ල දුශාන් වචනයෙන් වචනය හැකිතාක් ඇයගේ තාලයට ම පැවසීය. වැඩි වේලා නොගොස් ඔහු අසල සිටින්නන්ගේ අත්පොලසන් නාදය එයට එකතු විය.

"ඔය සිංදු බෑ කියලා බොරුනේ කියලා තියෙන්නේ." අහළ පහළ සිටි අය දුශාන්ට පවසත්ම ඔහු නොනවත්වා ගායනා කළේය.

ගායනය අවසානයේ පහර දුන් ලක්ෂාන් හැර අන් සියල්ල ම දුශාන් හට ප්‍රශංසා කළහ. ඉන්පසු වැඩිමහල් සිසුන් ද ගීත ගායනය කළේය.

එහෙත් දුශාන්ට ඇසෙන්නේ සුලගේ ශබ්ද පමණකි. නැවතත් ඔහුගේ ඇස් පිය වෙත් ම චතු අක්කාගේ හඬ ඔහුගේ කන් තුළ රැව් පිළිරැව් දුනි.

"ඇස් ඇරලා ඔයාට ගහපු ලක්ෂාන්ගේ අත් දෙක කොහේද තියෙන්නේ කියලා බලන්න. ෆුට් බෝඩ් එකේ ඉද්දි එයා වම් අතින් හැඬල් එක අල්ලගෙන දකුණු අත අත අරී. එයාගේ පිටිපස්සෙන් ඇවිත් වම් අත ළඟින් ඔයත්

අල්ලගෙන ම ඉන්න.... වෙලාව ආපුවහම මම කරන්න ඕන දේ කියන්නම්."

ඇස් විවර කල දූශාන් ලක්ෂාන් දෙස බලා සිටියේය.

දුම්රිය ස්ථාන දෙකක් හෝ තුනක් පසු වන්නට ඇත.

ඔහුගේ මුළු ගත ම සීතල වුණි. ඇඟ හැමතැන ම ක්‍රමයෙන් හිරිගඬු පිපෙන්නට විය . දැන් අවටින් කිසිදු ශබ්දයක් ඔහුට නෑසේ. දූශාන්ගේ ඇස් දෙක යළිත් පියවුණි.

" ඔයාගේ උඩ බොත්තම වෙනුවට ගහල තියෙන කට්ට ගලවන්න." ඇය කොඳුලාය.

පවසන වේගයෙන් ම සියල්ල ඉටු කිරීමට දූශාන් ඉක්මන් විය.

" දැන් ඔය කට්ට හෙම්හිට දිගහරින්න කෝච්චිය එක දිගට තුන්පාරක් හෙලවෙයි. එතකොට ම ඔයාගේ වම් අතට උඩින් හැඬල් එකට ඔය කට්ටේ තුඩෙන් හයියෙන් අනින්න." ඇයගේ විදානය ඔහුට පැහැදිලි ය.

ඒ සමග ම ඇයගේ හඬ නෑසී ගිය අතර පවසන වේගයෙන් ම දූශාන් සියල්ල ඉටු කර අවසාන ය.

ගතට වූ සීතල ද කෙමෙන් නැති වන්නට විය. අවට ශබ්දය ද දැන් ඔහුට හොඳින් ඇසුණි.

දූශාන් සෙමෙන් ඇස් විවර කළේය. එවිට ලක්ෂාන් ද පෙනෙන්නට නොසිටියේය.

මද වේලාවක් යනතෙක් සිදුවූයේ කුමක්දැයි අවබෝධ කරගැනීමට දුශාන්ට නොහැකි ය. එහෙත් දුශාන්ට සියල්ල අවබෝධ වූයේ එම හැට්ට කට්ට දෙස බැලූ විටය.

"දෙවියනේ මේකේ ලේ" ඒ දෙස බැලූ දුශාන්ට ඉබේට ම කියවුණි.

හෘද ස්පන්දනය ද ක්‍රමයෙන් වැඩි වන්නට විය. ඔහුගේ අත ද වෙව්ලන්නට වූයේය.

"ඒ කියන්නේ මම ඇනපු නිසාද එයාව කෝච්චියෙන් වැටිලා තියෙන්නේ. එයා කෝච්චියෙන් වැටුණා ද දෙවියනේ. මට එහෙම දෙයක් කරන්න ඕන වුණේ නෑ." දුශාන් සිය සිතට මැසිවිලි නගන්නට විය.

"මල්ලි .....ලක්ශාන්ව දැක්කද...." පිටුපසින් පැමිණි අයෙක් දුශාන්ගේ පිටට තට්ටු කලේ එවිට ය.

" අනේ මම දැක්කෙ නෑ අයියේ.... ඔයාලා එහා පැත්තේ කෝච්චි පෙට්ටියට ගිය වෙලාවේ ඔයාලගේ පස්සෙන් එයත් ආවාද කොහෙද අයියේ. ඊට පස්සේ නම් මම දැක්කේ නෑ " දුශාන් පැවසීය.

තමා වරදකරුවෙකු යැයි දුශාන්ගේ හෘද සාක්ෂිය අඳෝනා නැගුවේය. වේදනාවෙන් සිටි දුශාන් නිවසට පැමිණි පසු බලා සිටියේ එතූ අක්කා හමුවීමට ය.

දෙමව්පියන් දැනුවත් නොකල දුශාන් ගෙදරින් පිටවන්නට විය.

සිය මව ඔහුගේ කාමරයට පැමිණිය ද එහි කිසිවෙකු නොවූයේය. එහි මේසය මත වූ පොතක් අහම්බෙන් මෙන් ඇගේ නෙත ගැටුණේ ඒ අතරතුර ය.

එය දින පොතකි. එය මේසය මැද විවර කර තිබුණි. එය අතට ගත් ඇය හනිකට එය කියවන්නට වූයේ කුරුටුබලි රූප අතරින් එහි රතු පැනෙන් වූ සඳහනක් නිසාය. එහෙත් නාන කාමරයේ විදුලි බල්බය දැල්වෙනු දුටු ඇය එය පසු ව කියවීමට සිතුවාය. දුශාන් එහි ඇතැයි නිගමනය කළ ඇ කිසිවක් නොවූ අයුරින් කාමරයෙන් පිටතට පැමිණියාය.

එහෙත් එම දිනපොත දුශාන්ගේ බැව් ඇය කිසි විටෙකත් නොදැන සිටින්නට ඇත.

එය කැලි කැපිය හැකි අඳුරකි. එහෙත් එය මැදින් පියමන් කිරීමට තරම් ඔහු තුළ වූයේ කෝපයකි.

චතු අක්කා පෙර පැවසූ වේලාවට ම සුසාන භූමිය වෙත පියවර මනින්නට විය. තණ අග පිනිබිඳු ඔහුගේ පයට පෑගුණි.

කළුවර අතරින් එයට ඇතුළු වූ දුශාන් මල්ෂාගේ මිනිය වැළලූ සොහොන ළඟට පැමිණියේ ය.

" මම දන්නවා ඔයා මේ කොහේ හරි ඉන්නවා කියලා. එළියට එන්න චතු අක්කේ.... එළියට එන්න............ මට මිනිස්සු තුවාල කරන්න ඕන වුණේ නෑ අක්කේ.... ඕන වුණේ නෑ ." දුශාන් මොර දෙන්නට විය.

" වුණ දේ..... වුණා" ඔහුගේ කන්පෙති මත දැවටුණු සුපුරුදු හුස්ම සමග තිගැස්සුණු දුශාන් හට කෑගැස්සිණි. ඔහුට හිරිගඩු නැගෙන්නට විය. එහෙත් ඔහු එය බලාපොරොත්තුවෙන් සිටියේය.

" ලක්ෂාන් නිසා තමයි මල්ෂාට ඔහොම වුණේ . එයාට කැමක් විස වුණේ නෑ. එයා වස බිව්වා ඒක තමයි ඇත්ත කතාව"ඇ නොනවත්වා කතා කළේය.

"ඉතින් එහෙම කියලා මනුස්සයෙකුට එහෙම කරනවාද අක්කේ........ එහෙම කරනවාද......" කෑගසමින් හැඬූ දුශාන් ඇයට නැවත නැවතත් චෝදනා කරමින් විමසීය.

එහෙත් සුසාන භූමිය පුරාවට වූ රැහැයියන්ගේ ශබ්දය හැරෙන්නට ඇයගෙන් ඊට පිළිතුරක් නොවීය.

" ලක්ෂාන් මැරුණනම් එහෙම"

දුශාන්ට ශබ්දයක් ඇසුණි. එය තදින් හුස්ම හෙළනා ශබ්දයකි.

"මට ඔයාගෙන් උදව්වක් ඕනේ මල්ලි ...... සමහරවිට මම ඔයාගෙන් ඉල්ලන අන්තිම උදව්ව මේක වෙන්න පුළුවන්." ඈ එසේ පවසන විට තම හදවත මොහොතකට නතර වනවා වැනි හැඟීමක් දුශාන් හට ඈ කෙරෙහි පහළ විය.

"අනේ ඇයි අක්කේ එහෙම කියන්නේ....... මල්ෂා අක්කාත් අපිව දාලා යන්න ම ගියා දැන් ඔයත් ඔහොම කියනවද මට...."

" මම එහෙම දෙයක් හිතලා කිව්වා නෙමෙයි......යමු......මම යන ගමන් විස්තරය කියන්නම්."

"මම දැන් ගෙදර නෙමේ ඉන්නේ. මට දැන් ගෙදර ඉන්න හිත දෙන්නෑ මල්ලි..." රහසින් මෙන් ඔහුගේ දකුණු කනට කොඳුරා වතූ පැවසීය.

කනට ළං කරමින් ඇයගේ දෙතොල් දුශාන්ගේ කනෙහි ස්පශර් වන වාරයක් වාරයක් පාසා සිය ශරීරය පුරාම හිරිගඬු පිපී ඇස් දෙක ද සම්පූණර්යෙන් ම පියවෙන්නට වූයේය. දැන් දැන් ඇයගේ දිව ඔහුගේ කන් පෙති අග ස්පශර් වීමට ආසන්නය.

"මොකක්ද අක්කේ උදව්ව... කියන්න... මම.....ඕන දෙයක් කරන්නම්." දූශාන් එයට වේගවත් පිළිතුරක් ලබා දුණි.

"මම දැන් ගෙදර යන්නේ නැති නිසා අපේ මල්ලිට පණිවිඩයක් දෙන්න විදිහක් නෑ......මම පොතක් දෙන්නම් ඒක ගිහිල්ලා අපේ මල්ලිට දෙන්න..හරිද........." නැවත දූශාන්ගේ කණට කෙඳිරූ ඇය පැවසීය.

"ඕක මොකක්ද අක්කේ... කෝ පොත දෙන්න. මං ගිහිල්ලා දෙන්නම්."

" ඒක මගේ යාළුවෙක් ළඟ තියෙන්නේ.... යමු මං එයාගෙන් ඉල්ලලා දෙන්නම්" ඇය සන්සුන් ලෙස පැවසීය.

ඇය සැම විට ම ඔහුගේ කනට කොඳුලාය. ඔවුහු අදාළ නිවස වෙත පැමිණෙන්නට වූහ.

නිවස ඉදිරිපිටට පැමිණි චතූ නැවතුණේ ය.

"මේක ද ගෙදර" දූශාන් ඇසීය.

"ගෙදර නම් මේක තමයි." පැවසූ චතූ අදිමදි කළාය.

"ඇයි අක්කේ....මොනවා හරි ප්‍රශ්නයක් ද "

" ඔවු මල්ලි.....එයාලගේ ගෙදර අයට මාව ජේන්න බෑ... ඔයාට පුලුවන්නම් ගිහිල්ලා එයාගෙන් පොත ඉල්ලගෙන එනවද. මම මෙතනට වෙලා ඉන්නම්."

"මම මොනවා කියලද ඉල්ලන්නේ අක්කේ... අනික මම මේ ගෙදර අයව දන්නෙත් නැහැ."

දූශාන් එලෙස පැවසූයේ නිවැසියන්ට නොඇසෙන සේ චතූගේ කනට කරමින්ය.

" ඔයා මෙහෙම කියන්න. මගේ යාළුවගේ නම රෂ්මි. එයාට මම දීපු බෑග් එකේ මගේ පොතක් ඇති. ඒක ඉල්ල ගන්න... මම කිව්වා කියලා"

"හදිස්සියේ ම එයාගේ අම්මා හරි තාත්තා හරි ආවොත් මං මොකද කියන්නේ" දුශාන් ඇසීය.

"ඔයා රශ්මි අක්කේ කියලා කතා කරන්න." පැවසූ ඇය නැවත කඟින්නට විය.

දුශාන් නිවසේ දොරකඩට පියමං කළේ ඒ සමගය.

"රශ්මි අක්කේ..... රශ්මි අක්කේ......." දුශාන් පැවසූයේ සියල්ලන්ට ම ඇසෙන පරිදිය.

නිවසින් පිටතට පැමිණියේ ඇගේ මව යැයි නිගමනය කළ හැකි කාන්තාවකි.

"ඔව්... කවුද මේ...."ඇය ඇසුවාය.

"ඇන්ටි මම දුශාන්.....රශ්මි අක්කා ඉන්නවද?"

" ඉන්න පුතා... මම කියන්නම්.... දුව.....දුව.........අන්න දුශාන් කියලා මල්ලි කෙනෙක් ඇවිල්ලා ඔයාව හම්බෙන්න." නිවස තුළට යන ඈ පැවසීය.

"ඔව් මල්ලි.....ඔයා කවුද.." ඇය දුශාන්ගෙන් විමසුවාය.

ඇයට අතින් සංඥා කර පැත්තකට කැඳවාගත් දුශාන් කතාව ආරම්භ කළේ ඉන් පසුව ය.

" අක්කේ චතූ අක්කා කිව්වා එයා ඔයාට දුන්න බෑග් එක ඇතුලේ පොතක් ඇති කියලා, ඒක ඉල්ලගෙන එන්න කියලා"

"කෝ චතු ආවද" ඇය අවට විපරම් කළාය.

"ඔව් අක්කේ....එළියේ ඉන්නවා." දුශාන් පැවසීය.

" ටිකක් ඉන්නකෝ මං ගෙනල්ලා දෙන්නම්" පවසා නිවස තුළට ගිය ඇය නැවත පැමිණියේ යම් පොතක් ද තම අතැතිව ය.

" ආ.....මෙන්න මල්ලි" පැවසූ ඇය පොත දුශාන්ගේ අතට පත් කළාය. ස්තුති කළ දුශාන් පසුව පාරට පැමිණියේය.

"චාතුර්‍යා මානවඩු"

එය ප්‍රමාණයෙන් විශාල දින පොතකි. රක්ත වර්‍ණයෙන් යුත් එම දිනපොත ඉදිරිපස චතූ අක්කාගේ සම්පූර්‍ණ නාමය සඳහන් වී තිබුණි.

නැවත චතු අක්කාගේ නිවෙසට යන තෙක් ම ඔවුන් හමුවීමේ පටන් අද දවස දක්වා සියලු සිදුවීම් එකිනෙක මතක් කරන්නට වූයේ සතුට සහ කඳුල සමගින්ය.

චතූ අක්කගේ නිවස ඉදිරිපිට නිවසට සැලකිය යුතු දුරකින් නැවතුණු ඈ නැවත ආමන්ත්‍රණය කළාය.

"ඔයා ඕක අපේ මල්ලිට දීලා එන්න. අපි තව ටිකකින් හම්බවෙමු. මට ඔයත් එක්ක යන්න දුර ගමනක් තියෙනවා." පැවසූ ඇයගේ දෙතොල් තද රතු පැහැ විය.

ඔහුගේ සවනට සිය තොල්පෙති හුස්ම වදින සැටියට කෙඳිරූ ඈ තම දිවෙන් කනෙහි මැද්දට වන සේ කෙළ ගල්වා දුශාන් ව මදක් ඉදිරියට යන සේ තල්ලු කලේය.

"අක්කේ..... ඔය මොනාද කරන්නේ" දුශාන් පැවසුවද දැනෙනා හැඟීමට ඔහු ආශා කළේය.

පිටිපස හැරී බැලුවත් කිසිවෙකුත් එහි දක්නට නොවී ය.

චතුගේ නිවස තිබුණේ නිවාස සංකීර්ණයේ උඩට වන්නට ය. ඇයගේ නිවස යාබද ව එවැනි ම නිවාස කිහිපයක් ම පිහිටා තිබුණි.

එහෙත් අවසානයේදි ඔහු එය සොයාගන්නට විය.

ඇයගේ නිවස අසලට යන විට ඇයගේ සහෝදරයා යැයි නිගමනය කළ හැකි අයක් ඒ අසලම සිටියේය.

"ඔයා චතු අක්කාගේ මල්ලිද?"

"ඔව්....... තමුසේ කව්ද?" ඔහු දුශාන්ගෙන් විමසුයේ හතුරෙකු විලසිනි.

" මම චතු අක්කාගේ යාළුවෙක්........ එයාට එන්න බැරි නිසා එයා කිව්වා මේ පොත ඔයාට දෙන්න කියලා." මෙතෙක් වේලා දොරකඩ සිටගෙන සිටි දුශාන් පැවසීය.

“පුතා කවුද ආවේ" පවසා නිවසින් එළියට ආ කාන්තාවක් දුශාන්ගේ හිසෙහි සිට දෙපතුළ දක්වා නිරීක්ෂණය කළාය.

“ මගේ යාළුවෙක්...... අම්මේ" ඔහු පිළිතුරු දෙන අතර පැමිණි කාන්තාව ද නිවස තුළට ගමන් කළාය

ඔහුට අමුත්තක් දැනුණි. චතු අක්කාගේ යහළුවෙකු වූ දුශාන්ට චතුගේ සහෝදරයා තමන්ගේ යහළුවෙක් ලෙස හඳුන්වාදීමට ඇති හේතුව කුමක්ද? දුශාන්ට වූයේ ගැටලුවකි.

“අපි පොඩ්ඩක් එළියට ගිහිල්ලා කතා කරමු ද?."

“ඇයි මල්ලි මොකක් හරි ප්‍රශ්ණයක්ද?"

“ඔව් අයියේ .. අම්මා එදා ඉදලා තාම අක්කාව දැකලා නෑ. එයා ගොඩක් දුකින් ඉන්නේ.. ඒ නිසා." පැවසූ ඔහු හා දුශාන් තරප්පු පෙළ දිගේ බසින්නට විය.

“අහ්හ් මට අමතක වුණා. ඔයාට චතූ අක්කා මේක දෙන්න කිව්වා"

දුශාන් තම අතෙහි වූ දිනපොත චතූගේ මල්ලී අතට පත් කළේ ය. වචනයෙන් නොකී භීතියක් දුශාන්ට වූයේය.

ඔහු ද එය බලා හැඬීමට පටන්ගත්තේය. දුශාන් ඔහු සනසන අතර මෙසේ හැඬීමට හේතු කාරණා විමසා සිටියේය.

“මටවත් අක්කා මේ දේවල් කිව්වේ නෑ..." පැවසූ ඔහු හඬන්නට වූයේ කුඩා දරුවෙකු ලෙසිනි.

දුශාන් ඔහු ව සැනසීමට උත්සාහ කල ද එයද ව්‍යාර්ත විය. දුශාන්ගේ පූර්ණ අවධානය දැන් ඔහු කෙරෙහි ය.

"ඉතින් ඔය තරහ මරහා අමතක කරලා දාලා එයාත් එක්ක සතුටින් ඉන්න බලන්න..." දුශාන් පිළිතුරු දුණි.

" එහෙම කරන්නේ කොහොමද අයියා ... කොහොමද... එයත් මල්ෂා අක්කාත් එකක් ම මේ ලෝකෙන් ගියා...... ආයේ නොඑන්න ම යන්න ගියා අයියා.... ආයේ නොඑන්න ම." තම හිසෙහි අත් ගසා ඔහු යටි ගිරියෙන් කෑගැසී ය.

සියලු මතකයන් එකිනෙක දුශාන්ට මැවී පෙනෙන්නට විය.

“එතකොට....... ඒ....ඒ..එතකොට....... මම මෙච්චර වෙලා කතා කරලා තියෙන්නේ මැරිච්ච චතූ අක්කා එක්ක...". මිමිණූ දූශාන්ගේ උගුර කට වියළිණි.

අවට සෝෂාව ඔහුගේ කන් බිහිරි වන මට්ටමට වන්නට විය. දණහිස් පණ නැති වූ දූශාන් පොළව මත දැණගැස්වුණි. ඔහුගේ ඇස් නිලංකාර වන්නට විය. ඔහුගේ හිස පිටුපස කොන්ක්‍රීට් පඩියේ ගැටිත්තක් සිප ගන්නට විය. බොඳ වූ රූප අතරින් ඔහුගේ දෙනෙත් අඩවන් වුණි.

" අකාලයේ අප අතරින් වෙන් ව ගිය දූශාන් වෙත්තසිංහ තරුණ මහතාට මොක්සුව. "

එය පසුදිනෙක ඒ අසල ලයිට් කණුවක ගසා තිබූ මරණ දැන්වීමකි. එහි අලවා තිබුණු පාප්පවත් තව ම වියළී තිබුනේ නැත. යමෙකු එය කියවමින් සිටියේය.

"එහෙනම් දූශාන් මල්ලී මට කිව්ව ඔක්කොම දේවල් ඇත්ත." ඔහුට තිබුණේ දූශාන්ට කම්මුල් පාරක් ගැසීම පිළිබඳ දුකකි.

ඉසුරුට ඔවුන් දූශාන්ට කල දෙයට ප්‍රති විපාක ලැබී තිබුණි. ඔහු දැන් පියවර මනිණුයේ ද මල ගෙදරක ය. ඒ අන් කවරකුගේවත් නොව දුම්රියෙන් වැටී මියගිය ලක්ෂාන්ගේය.

-නිමි-